අරුණ නගින්නේ කීයටද?

# අරුණ
# හා
# අරුණෝද්ගමන විනිශ්චය



ත්‍රිපිටක පෙළ අටුවා ටීකා සහ විද්‍යාත්මක පර්යේෂණ මත පදනම් වී ඇත

අරුණ නගින්නේ කීයටද?

# අරුණ
# හා
# අරුණෝද්ගමන විනිශ්චය

පෙර වදන
අතිපූජනීය නාඋයනේ අරියධම්ම ස්වාමීන්ද්‍රයන් වහන්සේ

සංස්කාරක
ග්‍රීසියේ ඤාණදස්සන හිමි

ධර්මදාන වශයෙන් නොමිලයේ බෙදා හැරීම පිණිසයි

© 2002, ග්‍රීසියේ ඤාණදස්සන හිමි

ප්‍රකාශක

තිස්ස ප්‍රනාන්දු
519/2 B, ඇල්විටිගල මාවත,
කොළඹ 05

මුද්‍රණය

ෆිලික්ස් ප්‍රින්ටර්ස්
692, මරදාන පාර,
කොළඹ 10

# අරුණ

| පාළි | සිංහලානුවාදය |
| --- | --- |
| "කිං, පච්චක්ඛසිද්ධො අරුණො, උදාහු අනුමානතො'ති? | "කිමෙක්ද? අරුණ වනාහි ප්‍රත්‍යක්‍ෂයෙන් දතයුතු සිද්ධියක්ද? නොහොත් අනුමානයෙන් දත යුත්තක්ද? |
| එත්ථ, අයං අරුණො නාම පච්චක්ඛසිද්ධො එව, න අනුමානසිද්ධො, අරුණවණ්ණො චක්ඛුනා දිස්වා ජානිතබ්බතො. | මෙහි මේ අරුණ නම් ප්‍රත්‍යක්‍ෂයෙන්ම දතයුතු සිද්ධියකි. අනුමානයෙන් දතයුතු සිද්ධියක් නොවේ. අරුණේ පාට ඇසින් දැක දැනගත යුතු බැවිනි. |
| [පච්ඡා පන :] 'න එවං සති එවං භවෙය්‍යා'ති අනුමානෙන, පුනප්පුනං චින්තනෙන සිද්ධො'ති." | [පසුව වනාහි :] "මෙසේ නැති කල්හි එසේ නොවන්නේ යැ'යි අනුමානයෙන්, නැවත නැවත සිතීමෙන් දතයුතු සිද්ධියකි." |

(විනයාලංකාරටීකා 1.0023: අභිධානප්පදීපිකා-සූචි 27)

| පාළි | සිංහලානුවාදය |
| --- | --- |
| **"විනයවිනිච්ඡයෙ...අත්තනො මති නාම සබ්බදුබ්බලා."** | **"විනියවිනිශ්චයෙහි... සිය මතය (අත්තනො මති) නම් ඉතා දුර්වල මිනුම් දණ්ඩයකි."** |

(සමන්තපාසාදිකා 161-2)

# ප්‍රකාශක නිවේදනය

අරුණ හා අරුණෝද්ගමන විනිශ්චය නැමති මෙම ග්‍රන්ථය පූජ්‍ය ගරු ඥාණදස්සන ස්වාමීන් වහන්සේගේ පර්යේෂණවල ප්‍රතිඵලයකි. මෙය සෑම ස්වාමීන් වහන්සේ නමකටම අත්‍යාවශ්‍ය ග්‍රන්ථයකි. මෙම ග්‍රන්ථය කියවීමෙන් අරුණ යනු කුමක්ද?, අරුණ උදාවූ බව දැනගන්නේ කෙසේද? යන්න ඉතා පැහැදිලි වේ. එහෙයින් මෙය ස්වාමීන් වහන්සේලාගේ විනය රැකීමෙහිලා ඉතා වැදගත්ය.

මෙම පොත කියවීමෙන් සහ එය ප්‍රායෝගිකව අත්හදා බැලීමෙන් ලබන කුසල් මා මෙලොවට බිහි කළ හා හදා වඩාගත් තල්අරඹගේ මැගිලින් ප්‍රනාන්දු වන මාගේ මවටද, මා කෙරෙහි අසීමිත විශ්වාසයකින් හා පැහැදීමකින් සැමවිටම ක්‍රියා කළ මගගේ ඒඩ්වින් ප්‍රනාන්දු වන මාගේ පියාණන්ටද, තරුණ කලම පැව්දි ජීවිතයට එළඹ අකාලයේ අපවත් වූ මා සොයුරු මගගේ පූජිත ප්‍රනාන්දුට ද, (පූජ්‍ය ගල්කිස්සේ සුමනරතන හිමි), මා කුඩා කල සිටම දහමට යොමුකල මවගේ මෑණියන්ට ද, මා හට ධර්මය කියා දුන් අපවත් වී වදාල ගරු ගල්කිස්සේ සුමංගල හිමි සහ ගරු ගැටමාන්නේ ඥානවිමල හිමියන්ද, මීතිරිගල නිස්සරණ වාසී ගරු පාතදූවේ ඛේමානන්ද ස්වාමීන් වහන්සේ, ගරු ධම්මජීව ස්වාමීන් වහන්සේ, ගරු ඥාණදස්සන ස්වාමීන් වහන්සේ සහ අපවත් වී වදාල ගරු ධම්මනිසන්ති හිමි ඇතුලු අනිකුත් ස්වාමීන් වහන්සේලා සහ අනිකුත් ඥාතීන්ද, අනුමෝදන් වෙත්වායි පතමි.

මෙම පොත කියවන ඔබ වහන්සේ එය භාවිතා කළ පසු, තව හඳුනන ස්වාමීන් වහන්සේලා අතටද පත් කළහොත් මැනවැයි යෝජනා කරමි. එයින් ධර්ම දානයට ඔබ වහන්සේද හවුල්කරුවෙකු වන්නේහිය.

මෙම ධර්ම දානයේ පිනින් සසර වසනාතුරු නිදුක් නිරෝගිව වාසය කිරීමටත්, නිවන් අවබෝධය පිණිසත් වේවායි පතමි.

28.06.2001

තිස්ස ප්‍රනාන්දු
519/2B,
ඇල්විටිගල මාවත,
කොළඹ 05.

# පටුන


පිට

ග්‍රන්ථ සඞ්කේත නිරූපනය vi

**පෙර වදන** අතිපූජනීය නාඋයනේ අරියධම්ම ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි viii

**ප්‍රස්තාවනා** සංස්කාරක විසිනි ix

**අරුණ හා අරුණෝද්ගමන විනිශ්චය**

I. **අරුණ විනිශ්චය**

**පරිච්ඡේදය** -

පළමුවැනි : **අරුණ යනු කුමක්ද?** 3-17

1. අරුණේ ස්වාභාව
2. අරුණේ පදවර්ණනාව
3. අරුණේ පාට
4. අරුණේ සටහන
5. අරුණේ කාලය හා දිසාව
6. අරුණ ප්‍රත්‍යක්ෂයෙන් දත යුතු බව
7. ප්‍රත්‍යක්ෂ කළ අරුණ

II. **අරුණෝද්ගමන විනිශ්චය**

දෙවැනි : **අරුණෝද්ගමනය යනු කුමක් ද?** 18-22

1. අරුණ හා අරුණෝද්ගමනය අතර වෙනස
2. අරුණෝද්ගමන විනිශ්චය
3. අරුණෝද්ගමනයට සමානාර්ථ වාචන

තෙවැනි : **අරුණෝද්ගමනයෙහිදී සිදු වන දේ** 23-44

1. අරුණෝද්ගමනය සිදු වූ කල්හි සිවු දිසා සුදුපාට වන බව හා රාත්‍රිය සතුවුදයක පෙනුමක් ඇති බව 23
2. අරුණෝද්ගමනය සිදු වූ කල්හි රාත්‍රිය එළි වන බව 25
3. රාත්‍රිය එළි වූ කල්හි අරුණෝද්ගමනය සිදු වන බව 27
4. 'විභාතමානා රත්ති' හා 'අරුණුග්ගමන' යන පදයන්ගේ සමාන අදහස් ඇති බව 29
5. අරුණෝද්ගමනය සිදු වූ කල්හි රූප පෙනෙන බව 30
6. රාත්‍රිය එළි වූ කල්හිත් රූප පෙනෙන බව 31
7. මුළු රාත්‍රිය ඇවෑමෙන් අරුණෝද්ගමනය, රාත්‍රිය එළි වීම හා ආලෝකය පහළ වීම සිදු වන බව 33
8. ප්‍රත්‍යක්ෂකළ අරුණෝද්ගමනය 36

සිවුවැනි : **අරුණෝද්ගමනය සිදුවීම හා නොසිදුවීම අතර වෙනස** 45-59

I. **අරුණෝද්ගමනය නොසිදුවීම** 45

අරුණෝද්ගමනය නොසිදු වූ කල්හි අඳුරු බව, රූප නොපෙනෙන බව, ගිණි හුළු ආදි කෘතිම එළිය දැරීමක් අවශ්‍ය වන බව හා වැඩ කටයුතුවල නොයෙදෙන බව

II. අරුණෝද්ගමනය සිදුවීම
1. අරුණෝද්ගමනය සිදු වූ කල්හි ගිනි හුළු, පහන් ආදී කෘතිම එළිය දැල්වීමක් හා දැරීමක් අවශ්‍ය නැති බව 46
2. 'අරුණෝද්ගමනය' යනු දවාල සංඛ්‍යාවට යන බව 48
3. අරුණෝද්ගමනය සිදු වූ කල්හි ආලෝකය පහළ වූ බැවින් වැඩ කටයුතුවල යෙදෙන බව 50

I. අරුණෝද්ගමනය නොසිදුවීම
1. අරුණෝද්ගමනය නොසිදු වූ කල්හි ගමන් යාම වැළැක්විය යුතු බව 51

II. අරුණෝද්ගමනය සිදුවීම
1. අරුණෝද්ගමනය සිදු වූ කල්හි ගමන් යාම ස්වාභාවික ලෙස කළ හැකි බව 51
2. රාත්‍රිය එළි වූ කල්හිත් ගමන් යාම ස්වාභාවික ලෙස කළ හැකි බව 56
3. ඊළඟ දවසේ අරුණෝද්ගමනය සිදු වූ කල්හිත් රාත්‍රිය එළි වූ කල්හිත් සිරුරු පිළිදැගුම් ආදී ස්වාභාවික ලෙස කළ හැකි බව. 58

පස්වැනි : අරුණෝද්ගමනය හා කාල-විකාල භෝජන භේදය 60-69
I. කාල භෝජනය 60
II. විකාල භෝජනය
I. කාල භෝජනය : අරුණෝද්ගමනය සිදු වූ කල්හි භෝජනය අනුභව කරන්ට හැකි බව 61
II. විකාල භෝජනය : අරුණෝද්ගමනය නොසිදු වූ බැවින් රාත්‍රියේ අඳුරෙහි භෝජනය අනුභව කිරීම නොකළ හැකි බව 62
I. කාල භෝජනය :
1. රාත්‍රිය එළි වූ කල්හි භෝජන අනුභව කරන්ට හැකි බව 63
2. 'කාලස්සෙව' (ඉර උදවට කලින්ම) යන මේ කාලපරිච්ඡේදයේදී කැඳ ආදී භෝජන අනුභව කරන්ට හැකි බව 64
3. 'කාලස්සෙව' යන මේ කාලපරිච්ඡේදයේදීත් රූප පෙනෙන බව 67
4. 'කාලස්සෙව' යන මේ කාලපරිච්ඡේදයේදී ගමන් යාමත්, පිඩු පිණිස සූදනම් වීමත් හා පිටත් වීමත් ස්වාභාවික ලෙස කළ හැකි බව 67

පිට

5. 'පාතො' (උදෑසන) යන මේ කාලපරිච්ඡේදයේදී සාමාන්‍ය සිරිත් ලෙස ගමට පිඬු පිණිස පිවිස හැසිරෙන බව හා උදේ දනය ගන්නා බව 68

6. 'පුබ්බණ්හසමයං' (පෙරවරු කාලය) යන මේ කාලපරිච්ඡේදයේදීත් සාමාන්‍ය සිරිත් ලෙස ගමට පිඬු පිණිස පිවිස හැසිරෙන බව හා භෝජනය අනුභව කරන බව 68

සවැනි : **අරුණෝද්ගමනය හා රෑදවල් භේදය** 70

සත්වැනි : **විද්‍යාත්මක විස්තරය** 74

අටවැනි : **නිගමනය** 84


## උපග්‍රන්ථය


I. විනයාලංකාර ටීකාවෙහි අරුණෝ පාට පිළිබඳ සාකච්ඡාවකි 87

II. මහාචාර්ය රේරුකානේ චන්දවිමල මහානායක ස්ථවිර පාදයන් වහන්සේ විසින් අරුණෝදය පිළිබඳ විස්තරය 89

III. පබ්බජ්ජා විනිශ්චය 90

IV. **විශේෂ ශබ්ද සූචි** 99

# ග්‍රන්ථ සඞ්කේත නිරූපණය

## විනය පිටකය

| | | | |
|---|---|---|---|
| පාරා. | = | පාරාජික පාළි | (බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා) |
| පාචි. | = | පාචිත්තිය පාළි | " |
| ම.ව. | = | මහාවග්ග පාළි | " |
| චූ.ව. | = | චුල්ලවග්ග පාළි | " |

## සුත්‍ර පිටකය

| | | | |
|---|---|---|---|
| දී.නි. | = | දීඝ නිකාය | " |
| ම.නි. | = | මජ්ඣිම නිකාය | " |
| සං.නි. | = | සංයුත්ත නිකාය | " |
| අං.නි. | = | අංගුත්තර නිකාය | " |
| උදා. | = | උදාන පාළි (ඛුද්දක නිකාය) | " |
| සු.නි. | = | සුත්තනිපාත | " |
| මිලි.ප. | = | මිලින්ද පඤ්හ | (අනුල මුද්‍රණාලය, 1962) |

## අටුවා

| | | | |
|---|---|---|---|
| වින.අ. | = | විනය අටුවා (සමන්තපාසාදිකා) | (සයිමන් හේවාවිතාරණ මුද්‍රණ) |
| දී.නි.අ. | = | දී.නි.අටුවා | " |
| ම.නි.අ. | = | ම.නි.අටුවා | " |
| සං.නි.අ. | = | සං.නි.අටුවා | " |
| අං.නි.අ. | = | අං.නි.අටුවා | " |
| ධ.අ. | = | ධම්මපද අටුවා | " |
| උද.අ. | = | උදන අටුවා | " |
| සු.නි.අ. | = | සුත්තනිපාත අටුවා | " |
| වි.ව.අ. | = | විමාන වත්ථු අටුවා | " |
| පෙ.ව.අ. | = | පෙත වත්ථු අටුවා | " |
| ථෙර.අ. | = | ථෙරගාථා අටුවා | " |
| ථෙරි.අ. | = | ථෙරිගාථා අටුවා | " |
| ජා.අ. | = | ජාතක අටුවා | " |
| අප.අ. | = | අපදන අටුවා | " |
| බු.ව.අ. | = | බුද්ධවංස අටුවා | " |
| ච.පි.අ. | = | චරිය පිටක අටුවා | " |

## ටීකා

### විනය

| | | | | |
|---|---|---|---|---|
| සා.දි.ටී. | = | සාරත්ථදීපනී | ටීකාව | (මරම්ම ඡට්ඨ සඞ්ගීති මුද්‍රණ) |
| වින.අ.ටී. | = | විනයාලංකාර | ටීකාව | " |
| වින.වි.ටී. | = | විනයවිනිච්ඡය | ටීකාව | " |
| විම.වි.ටී. | = | විමතිවිනොදනී | ටීකාව | (ලක්ෂ්මන් යන්ත්‍රාලය) |
| බු.මූ.ටී. | = | බුද්දසික්ඛ-මූලසික්ඛ-අභිනව | ටීකාව | (මරම්ම ඡට්ඨ සඞ්ගීති මුද්‍රණ) |
| සුබො.අ.ටී. | = | සුබොධාලංකාර | ටීකාව | " |
| පා.යො.පා. | = | පාචිත්තියාදියොජනා | ටීකාව | " |

### සුත්ත

| | | | | |
|---|---|---|---|---|
| දී.නි.ටී. | = | දී.නිකාය | ටීකාව | (සෝමාවතී හේවාවිතාරණ මුද්‍රණ) |
| ම.නි.ටී. | = | ම.නිකාය | ටීකාව | (මරම්ම ඡට්ඨ සඞ්ගීති මුද්‍රණ) |
| සං.නි.ටී. | = | සං.නිකාය | ටීකාව | " |
| අං.නි.ටී. | = | අං.නිකාය | ටීකාව | " |
| අභි.ප.ටී. | = | අභිධානප්පදීපිකා | ටීකාව | " |
| නම.ටී. | = | නමක්කාර | ටීකාව | " |

## වෙනත් ග්‍රන්ථ

| | | |
|---|---|---|
| මහා.වං. | = | මහාවංසො (බුද්ධදත්ත මහාථෙර, ඇම්.ඩී. ගුණසේන මුද්‍රණය, 1959) |
| වින.කම්.පො. | = | විනය කම් පොත (රේ.චන්ද්‍රවිමල නාහිමි, තිලක් ප්‍රින්ටර්ස්, 1992) |
| අභි.ප. | = | අභිධානප්පදීපිකා (මහාබෝධි ප්‍රින්ටිං) |
| අභි.ප.සූ. | = | අභිධානප්පදීපිකා-සූචි (කොළඹ, 1893) |
| කච්.ධා.ම. | = | කච්චායනධාතුමඤ්ජූසා |
| නිරු.දී. | = | නිරුත්තිදීපනී (මරම්ම ඡට්ඨ සඞ්ගීති මුද්‍රණ) |
| පා.සිං.ශ. | = | පාලි-සිංහල ශබ්දකෝෂය (සිරි සුමඞ්ගල හිමි, ඇම්.ඩී. ගුණසේන, 1965) |
| ප්‍රා.සිං.ශ. | = | ප්‍රායෝගික සිංහල ශබ්දකෝෂය (අධිනීතිඥ හරිශ්චන්ද්‍ර විජයතුංග සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, 1982) |
| ශ්‍රී.සු.ශ. | = | ශ්‍රී සුමඞ්ගල ශබ්දකෝෂය (වැ.සොරත නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ, අනුල මුද්‍රණාලය, 1963, 1970) |
| සිං.වි.කෝ. | = | සිංහල විශ්වකෝෂය, (මහාචාර්ය ඩී.ඊ. හෙට්ටිආරච්චි, සංස්කෘතික දෙපාර්තමේන්තුව, 1965, 1974) |

## සඞ්කේත රූප

| | | |
|---|---|---|
| ගා. | = | ගාථාව |
| පි. | = | පිට |
| [....] | = | සංස්කාරක විසින් අන්තර්ගත කරන ලද කොටස |

# පෙර වදන

ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවෙහි ප්‍රව්‍රජ්‍යොපසම්පදාව ලබා මීතිරිගල නිස්සරණ වන සෙනසුන සහ මීතිරිගල ශ්‍රී ඥානාරාම ධර්මායතන වාසී පූජ්‍ය ග්‍රීසියේ ඤාණදස්සන ස්වාමීන් වහන්සේ ස්ථිර සාර ශාසනික ප්‍රතිපත්තියෙහි පිහිටා සිටිමින් ධර්ම විනය ඥානයේ ගැඹුරට බැසගත් බුද්ධ පුත්‍රයන් වහන්සේ නමක් බව ප්‍රතිපත්ති ගරුක සියලු දෙනා අවිවාදයෙන් පිළිගෙන ඇත. පූජ්‍ය ග්‍රීසියේ ඤාණදස්සන ස්වාමීන් වහන්සේ විසින් සියලු ත්‍රිපිටක පෙළ අටුවා ටීකා ග්‍රන්ථ කියවීමෙන් ද නිරීක්ෂණයෙන් ද කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් ද ලබාගත් සාධක කරුණු අනුව සම්පාදනය කළ **අරුණ හා අරුණෝද්ගමන විනිශ්චය** සම්බන්ධ පොතක් ගැන 2000-06-18 වෙනි දින ගල්දූව ගුණවර්ධන යෝගාශ්‍රම මධ්‍යස්ථානයේදී පැවති වාර්ෂික සංඝ සම්මේලනයේදී ඉදිරිපත් වූ අදහස යෝගාශ්‍රමීය අධිකරණ මණ්ඩලයේ සාකච්ඡාවට භාජනය කරනු පිණිස තීරණය විය.

2000-08-19 වෙනි දින කොළඹ, බෞද්ධාලෝක මාවතේ ශ්‍රී කල්‍යාණ ධර්ම ආශ්‍රමයේදී රැස්වූ අධිකරණ මණ්ඩලය විසින් **අරුණ හා අරුණෝද්ගමන විනිශ්චය** ගැන දීර්ඝ සාකච්ඡාවක් පවත්වන ලදුව අතිරේක විංශත් වර්ගික කාරක සභාවට යොමු කෙරිණි. 2000-08-20 වෙනි දින යථෝක්ත ආශ්‍රමයේදීම රැස්වූ කාරක සභාව මගින් තීරණය වූයේ ඉහත නම් සඳහන් **අරුණ හා අරුණෝද්ගමන විනිශ්චය** පර්යේෂණ ග්‍රන්ථය ගැන විනය ධාරී යෝගාවචර භික්ෂූන් වහන්සේලාගේ අදහස් විමසීම පිණිස යෝගාශ්‍රම සංස්ථානුබන්ධ සියලුම සේනාසන වෙත එම පොත යොමුකරන ලෙසය.

එසේ හෙයින් මෙම **අරුණ හා අරුණෝද්ගමන විනිශ්චය** පොත සාවධානව කියවා විනයානුකූලව බුද්ධිමන්ත අදහස් ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙනුයේ ශ්‍රී:ක:යෝ:විං:කාරක සභාවේ අණ පරිදි ශාසනික ගෞරවයෙනි.

මෙයට මෙතැනි,
***නාඋයනේ අරියධම්ම***
ප්‍රධාන ලේඛකාධිකාරී ස්ථවිර,
නාථගණ අරණ්‍ය සේනාසනය,
මහකෙළිය,
මාස්පොත 60344 (KG) (S).

(සියලුම ලියුම්
"**අරුණ හා අරුණෝද්ගමන විනිශ්චය**"
මාතෘකාව සහිතව නාථගණ අරණ්‍යයේ
ලිපිනයට යොමුකළ මැනවි.)

# ප්‍රස්ථාවනා

**අරුණ** හා **අරුණෝද්ගමනය** පිළිබඳ මේ ග්‍රන්ථයේ අඩංගු වන තොරතුරු රැස් කරන ලද්දේ පෞද්ගලික භාවිතයට මිස ප්‍රසිද්ධ කිරීමට නොවේ. එහෙත් වෙනත් ස්වාමීන් වහන්සේලා මේ තොරතුරු ගැන ලොකු සැලකිල්ලක් දැක්වූ බැවින් ද 2000-8-20 දිනයේදී ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රමීය සංඝ කාරක සභාව ඒවා පොතක් වශයෙන් ප්‍රසිද්ධ කිරීමට තීරණය කළ බැවින් ද මේ තොරතුරු සියල්ල ප්‍රසිද්ධ කිරීම මාගේ යුතුකමක් විය.

මෙම පොත සඳහා පදනම් පර්යේෂණය සම්පූර්ණ කරගැනීමට අවුරුදු 5 කට වැඩි කාලයක් ගත විය. මේ පර්යේෂණයට පහත සඳහන් කරුණු අඩංගු විය:

- අදාළ වූ ත්‍රිපිටක පෙළ අටුවා ටීකා පොත්පත් අධ්‍යයනය.
- අදාළ වූ වෙනත් සංග්‍රහ පොත්පත්. එනම් : මහාවංශ, ථූපවංශ ආදි පැරණි ග්‍රන්ථ ද, සාධිකාර වූ නියමිත විද්‍යාත්මික විශ්වකෝෂ හා මාලිමා ශාස්ත්‍ර අත්පොත් ආදි නවීන ග්‍රන්ථ ද අධ්‍යයනය කිරීම.
- ලංකාවේ ස්ථාන දෙකකදී අලුයම පටන් හිරු උදවන තුරු අහස නිරීක්ෂණය කිරීම තුළින් ප්‍රත්‍යක්ෂමූලක වූ දත්තයන් එකතු කිරීම. ඒ ස්ථාන දෙක නම්: ලංකාවේ ගිනිකොන සමුද්‍ර තීරයෙහි පිහිටි නිමලව අරණ්‍ය සේනාසනය සහ ලංකාවේ ඉතා උස් තැනක පිහිටි ශ්‍රී පාද කඳු මුදුනය.
- කොළඹ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධිකාරී මණ්ඩලයෙහි කාරුණික උපකාරයෙන් ඒ ප්‍රත්‍යක්ෂමූලක දත්තයන් පරීක්ෂා කිරීම.
- වෙනත් ස්වාමීන්වහන්සේලා විසින් අහස නිරීක්ෂණය කිරීම තුළින් ප්‍රත්‍යක්ෂමූලක වූ දත්තයන් එකතු කිරීම.

අරුණ හා අරුණෝද්ගමනය පිළිබඳ මේ පර්යේෂණය කුමක් නිසා කරන ලද්දේද? විනයාලංකාර ටීකාව දුන් පිළිතුර මෙහි ලා සටහන් කරනු වටී. ඒ මෙසේය :

| පාළි | සිංහලානුවාදය |
|---|---|
| "ඉමිස්සා අරුණකථාය මහාවිසයභාවතො. කථං ? | "අරුණ පිළිබඳ මේ කථාව මහත් විසය බැවිනුයි. කෙසේද ? |
| උපොසථිකා උපාසකා ච උපාසිකායො ච අරුණුග්ගමනං තථතො අජානන්තා අනුග්ගතෙයෙව අරුණෙ උග්ගතසඤ්ඤාය ඛාදනීයං වා ඛාදන්ති, භොජනීයං වා භුඤ්ජන්ති, මාලාගන්ධාදීනි වා ධාරෙන්ති. තතො තෙසං සීලං භිජ්ජති. | පෝය දිනයේ සිල් සමාදන් වූ උපාසක-උපාසිකාවෝ **අරුණෝද්ගමනය** *(අරුණු-ග්ගමනං)* ඇති සැටියෙන් නො දන්නාහු අරුණ නොනැගි කල්හිම අරුණ නැගුනේ යැයි සංඥාවෙන් කෑ යුතු දේ හෝ කති, බුදිය යුතු දේ හෝ බුදිති, මල් දම් සුවඳ ආදිය හෝ දරති. එයින් ඔවුන්ගේ ශීලය බිඳෙයි. |
| සාමණෙරා තථෙව විකාලභොජනං භුඤ්ජිත්වා සීලවිනාසං පාපුණන්ති. | එසේම සාමණේරවරු විකාල භෝජනය වළඳා ශීල විනාශයට පැමිණෙති. |

නිස්සයපටිපන්නකා භික්ඛූ ආචරියුපජ්ඣායෙහි විනා බහිසීමෙ වරන්තා නිස්සයප්පස්සම්භනං පාපුණන්ති. අන්තොවස්සෙ භික්ඛූ උපචාරසීමතො බහි ගච්ඡන්තා වස්සච්ඡෙදං. තෙචීවරිකා භික්ඛූ අබද්ධසීමායං චීවරෙන විප්පවසන්තා නිස්සග්ගියපාචිත්තියං. තථා සත්තබ්භන්තරසීමායං. සහසෙය්‍යප්පහොනකට්ඨානෙ අනුපසම්පන්නමාතුගාමෙහි සහ සයන්තා පාචිත්තියං. තථා යාවකාලිකං භුඤ්ජන්තා භික්ඛූ. පාරිවාසිකාදයො වත්තං නික්ඛිපන්තා රත්තිච්ඡෙදං.

නිස්සය පිළිපන් භික්ෂූහු ආචාර්ය උපාධ්‍යාය වහන්සේලාගෙන් වෙන්ව සීමාවෙන් පිටත හැසිරෙන්නාහු නිස්සය කැඩීමට පැමිණෙති. වස් කාලය තුළ උපචාර සීමාවෙන් පිටත වඩින්නාවූ භික්ෂූහු වස් කැඩීමට පැමිණෙති. තෙචීවරික භික්ෂූහු අබද්ධ සීමාවේ සිවුරෙන් වෙන්ව වාසය කරමින් නිස්සග්ගිය පාචිත්තිය ඇවැතට පැමිණෙති. සත්තබ්භන්තර සීමාවේ ද එසේම ය. සහසෙය්‍යාට පොහෝනා ස්ථානයේ අනුපසම්පනයන් සමග හෝ ස්ත්‍රීන් සමග හෝ සයනය කරමින් පාචිත්තිය ඇවැතට පැමිණෙති. යාවකාලික දේ වළඳන්නාවූ භික්ෂූහු ද එසේම යි. පිරිවෙස් ආදිය සමාදන් වූ භික්ෂූහු වත නික්ෂෙප කරමින් රාත්‍රිච්ඡේදයට පැමිණෙති.

එවමාදි-අනෙකාදීනවසම්භවතො ලජ්ජිපෙසලානං භික්ඛූනං තථතො අරුණුග්ගමනස්ස ජානනත්ථං වුත්තා'ති දට්ඨබ්බං".

මේ ආදි වූ නොයෙක් ආදීනව හේතුවෙන් ලජ්ජි පේසල භික්ෂූන්ට **අරුණෝද්ගමනය** ඇති සැටියෙන් දැනගැනීම සඳහා අරුණ පිළිබඳ මේ කථාව කියන ලදි යැයි දත යුතුයි." (වින.අ.ටී. 1.0023)

ඇත්ත වශයෙන් කියතොත් විනය පිටකයෙහි 'අරුණ' නොව, 'අරුණෝද්ගමනය' යනු ඇවැත් විනිශ්චය සඳහා ප්‍රධානතම මිම්මය. උදහරණ වශයෙන් මෙහි ලා නිදර්ශන දෙකක් දැක්විය හැක. එනම්:

| පාළි | සිංහලානුවාදය |
|---|---|
| 1. "සහ අරුණුග්ගමනා [චීවරං] නිස්සග්ගියං හොති." | 1. "අරුණෝද්ගමනය සමග [සිවුර] නිසැහි වෙයි." (පාරා.506) |
| 2. "විකාලො නාම: මජ්ඣන්තිකෙ වීතිවත්තෙ යාව අරුණුග්ගමනා." | 2. "විකාලය නම්: මධ්‍යහ්නය ඉක්ම ගිය කල්හි සිට අරුණෝද්ගමනය වන තුරු." (පාචි.i.240) |

තව උදහරණ හා '**අරුණ හා අරුණෝද්ගමනය අතර වෙනස**' පිළිබඳ විස්තර මේ පොතේ මතු **පරිච්ඡේදයන්හි** දක්වනු ලැබේ.

එහෙයින් පණ්ඩිතයන් විසින් නැවත නැවත පෙර පසු කී දේ අවුල් නොකොට මෙනෙහි කළයුතු. මෙසේ මෙනෙහි කොට අරුණෝද්ගමනය සම්බන්ධ වූ ශික්ෂාපදයන්හි වැරදි සංඥාව හා සැකය සිඳ විසාරද විය යුතුය. කුමක් නිසාද යත්? විනයෙහි අරුණෝද්ගමනය සම්බන්ධ වූ සෑම ඇවැතක්ම 'අචිත්තකයක්' ද 'නොසඤ්ඤාවිමෝක්ඛයක්' ද වන බැවිනි. '**අචිත්තකයක්**' යනු චේතනාවක් හෝ දැනීමක් නැතුව ඒ ඒ ශික්ෂාපදය කැඩුවොත් ඇවැතක් සිදුවීමය. '**නොසඤ්ඤාවිමෝක්ඛයක්** යනු වැරදි සංඥාවක් හෝ සැකයක් ඇතුව ඒ ඒ ශික්ෂාපදය

කැඩුවොත් ඇවැතෙන් නොමිදීමය. උදාහරණ වශයෙන් මෙහි විකාල භෝජන ශික්ෂාපදය දැක්විය හැක:

| පාළි | සිංහලානුවාදය |
| --- | --- |
| "**විකාලො නාම**: මජ්ඣන්තිකෙ වීතිවත්තෙ යාව අරුණුග්ගමනා. | "**විකාලය නම්** : මධ්‍යාහ්නය ඉක්ම ගිය කල්හි සිට අරුණෝද්ගමනය (අරුණුග්ග-මනා) වන තුරු. |
| **විකාලෙ** වෙමතිකො ... භුඤ්ජති ආපත්ති පාචිත්තියස්ස. | **විකාලයෙහි** සැක ඇතියේ ... බුදී නම් පචිති ඇවැත් වේ. |
| **කාලෙ** වෙමතිකො ආපත්ති දුක්කටස්ස. | **කාලයෙහි** සැක ඇතියේ නම් දුකුළා ඇවැත් වේ. |
| **විකාලෙ** කාලසඤ්ඤී ... භුඤ්ජති ආපත්ති පාචිත්තියස්ස. | **විකාලයෙහි** කාල සංඥා ඇතියේ ... බුදී නම් පචිති ඇවැත් වේ. |
| | **කාලයෙහි** විකාල සංඥා ඇතියේ නම් දුකුළා ඇවැත් වේ." (පා.වි.i.240) |

මෙලෙස, අරුණෝද්ගමනය වරදවා ගෙන අරුණෝද්ගමනයට කලින් බුදී නම් ඇවැතක් සිදු වේ මයි. එබැවින් විනය ශික්ෂාපද රකින්නවුන් විසින් 'අරුණ ' යනු කුමක්ද, 'අරුණෝද්ගමනය' යනු කුමක්ද, 'කාලය' යනු කුමක්ද 'විකාලය' යනු කුමක්ද යන නිවැරදි ලෙස ද නිසැක ලෙස ද දැන සිටිය යුතුය.

එසේම මේ කාලයෙහි ඇතැම් සඞ්ඝයා වහන්සේලා අතර අරුණ, පැවිද්ද හා උපසම්පද සම්බන්ධව විවිධ මත පවතින හෙයින් මෙම පොතේ උපග්‍රන්ථයෙහි ඇතළු කළ 'පබ්බජ්ජා විනිශ්චය' යන විනිශ්චයත් නිවැරදි හා නිසැක ලෙස ද දැන ගැනීම සුදුසු ය.

*"විසුද්ධත්ථාය සීලස්ස - භික්ඛූනං පියසීලිනං*
*කතාරුණකථා එසා - න සාරම්භාදිකාරණා.*

*තස්මා සුට්ඨුපධාරෙත්වා - යුත්තං ගණ්හන්තු සාධවො.*
*අයුත්තඤ්ච ජඩ්ඩයන්තු - මා හොන්තු දුම්මනාදයො'ති".*

"දබර වීම ආදී හේතු නිසා නොව - ප්‍රියශීලි භික්ෂූන්ගේ
ශීලය පිරිසුදු කිරීම සඳහා - අරුණ පිළිබඳ මේ කථා කියන ලදි.
එහෙයින්, සත්පුරුෂයෝ - මනාසේ විමසා බලා
යුතු දේ ගනිත්වා - අයුතු දේ ඉවත දමත්වා.
නොසතුටු සිතැත්තෝ - ආදීහු නො වෙත්වා."

(වින.අ.ටී 1.0031)

**චක්ඛුමන්තො දක්ඛන්තු!**
මීට ශාසනස්ථිතිකාමී,
ශ්‍රීසියේ ඤාණදස්සන හිමි.

2544-2001
මීතිරිගල
නිස්සරණ වනයේදී ය.

# I. අරුණ විනිශ්චය

# පළමුවැනි පරිච්ඡේදය

# අරුණ යනු කුමක්ද?

පාළි

"අරුණුග්ගමනෙ සංසයවිනොදනත්ථං අරුණකථා වත්තබ්බා. තත්‍රිදං වුච්චති :-

කො එස අරුණො නාම?
කෙන සො අරුණො භවෙ?
කීදිසො තස්ස වණ්ණො තු?
සණ්ඨානං කීදිසං භවෙ?
කිස්මිං කාලෙ ච දෙසෙ ච
අරුණො සමුගච්ඡති?
කිං පච්චක්ඛසිද්ධො එසො,
උදාහු අනුමානතො'ති?"

සිංහලානුවාදය

"**අරුණෝද්ගමනය** ගැන සැක දුරු කරගැනීම සඳහා අරුණ පිළිබඳ මේ කථාව කිය යුතුයි. එහෙයින් මෙය කියනු ලැබේ :-

අරුණ යනු කුමක්ද?
කුමක් නිසා එය අරුණ නම් වෙයිද?
ඒ අරුණේ පාට කෙබඳුද?
සටහන කෙබඳුද?
කුමන කාලයේ, කුමන දිසාවේ
අරුණ නගීද?
කිමෙක්ද? අරුණ ප්‍රත්‍යක්ෂයෙන් දතයුතු
සිද්ධියක්ද? නොහොත් අනුමානයෙන්
දත යුත්තක්ද?"

(විනා.අ.ටී.1.0021;අභි.ප.සූ.26)

## 1. අරුණස්ස සභාවො

"තත්ථ 'කො එස අරුණො නාමා'ති?, එත්ථ එස අරුණො නාම සූරියස්ස පභාවිසෙසො. වුත්තඤ්හෙතං අභිධානප්පදීපිකායං:- "සූරස්සොදයතො පුබ්බුට්ඨිතරංසි සියාරුණො"ති. විමතිවිනොදනීනාමිකායං විනයටීකායඤ්ච:- "අරුණො'ති චෙත්ථ සූරියුග්ගමනස්ස පුරෙචරො වඩ්ඪන-ඝන-රත්තො පභාවිසෙසො'ති දට්ඨබ්බො'ති", වුත්තං."

## 1. අරුණේ ස්වභාය

"එහි '**අරුණ**' යනු **කුමක්ද?** 'යන, මෙහි අරුණ නම් සූර්‍ය්‍යයාගේ ප්‍රභා විශේෂයකි. අභිධානප්පදීපිකාවෙහි [65 ගා.] එය මෙසේ කියන ලදි:- "සූර්‍ය්‍යයාගේ උදවට පෙර නැගීසිටි රැස් අරුණ නම් වන්නේය". විමතිවිනොදනී නමැති විනයටීකාවෙහි ද [258 පි.]:- "මෙහි 'අරුණ' යනු සූර්‍ය්‍ය උදාවට පෙර වැඩීගෙන එන තද රතුපාට ප්‍රභා විශේෂයෙකැයි දතයුතු" යනුවෙන් සඳහන් වේ."

(විනා.අ.ටී.1.0021;අභි.ප.සූ.26)

සුබොධාලංකාරනාමිකායං විනයටීකායඤ්ච :- "අරුණවණ්ණ-සඞ්ඛාත-අභිනවසූරියකිරණො'ති" වුත්තං.

සුබෝධාලංකාර නමැති විනය ටීකාවෙහි ද :- "අරුණුපාට කියන ලද අලුත් සූර්‍ය්‍ය කිරණය යැ"යි සඳහන් වේ. (සුබො.අ.ටී.250)

ඛුද්දසික්ඛ-මූලසික්ඛනාමිකායං විනයඅභිනවටීකායඤ්ච :-"අරුණුග්ගම්හි අරුණසඞ්ඛාතස්ස පඨම-බාල-සූරිය-රාසිනො උග්ගමනන්'ති", වුත්තං.

ඛුද්දසික්ඛ-මූලසික්ඛ නමැති විනය අභිනවටීකාවෙහි ද :-"අරුණෝද්ගමනයෙහි 'අරුණ' කියන ලද බාල සූර්‍ය්‍යයාගේ (වඩා ඉහළට නොනැගි සූර්‍ය්‍යයාගේ)[1] පළමුවෙනි රශ්මීන්ගේ නැගීම යැ"යි සඳහන් වේ. (ඛු.මූ.ටී.269)

---

1. පාලි-සිංහල අකාරාදිය, පො. බුද්ධදත්ත නාහිමි.

"තස්මා 'සූරියපභා එව අරුණො නාම, න අඤ්ඤො'ති දට්ඨබ්බං"

"එබැවින් 'සූර්‍ය්‍ය ප්‍රභාව ම අරුණ නම්. අනිකක් නොවේ යැ'යි දත යුතුය."

(වින.අ.ටී.1.0021;අභි.ප.සූ. 27)

2. අරුණස්ස පදවණ්ණනා

"'**කෙන සො අරුණො භවෙ'ති?**,එත්ථ 'අරුණො වණ්ණො අස්සා'ති = අරුණො. කිඤ්චි රත්තවණ්ණසමන්නාගතො'ති අත්ථො. අථ වා 'අරති, ගච්ඡති, රත්තවණ්ණභාවෙන පවත්තතී'ති = අරුණො. වුත්තඤ්හෙතං අභිධානප්පදීපිකාටීකායං :- "අරුණවණ්ණතාය අරති, ගච්ඡතී'ති = අරුණො."

2. අරුණේ පදවණ්නාව

" '**කුමක් නිසා එය අරුණ නම් වෙයිද?**' යන, මෙහි 'අරුණුපාට මොහුට ඇත්තේ තුයි = අරුණ නම් වේ. මඳක් රතුපාටින් යුක්තය යන අර්ථයයි. නොහොත් 'යයි, ගමන් කරයි, රතුපාට බවින් පවතිනුයි = අරුණ නම් වේ. අභිධානප්පදීපිකාටීකාවෙහි එය මෙසේ කියන ලදි:- "අරුණුපාට බවින් යයි, ගමන් කරයි = අරුණ නම් වේ."

(වින.අ.ටී.1.0021;අභි.ප.සූ. 27)

[තත්ථ] "අර ගමනෙ + උණෙ = අරුණො"

[එහි] "අර යාමෙහි + උණෙ ප්‍රත්‍යය ද = අරුණ." (අභි.ප.සූ.26)

3. අරුණස්ස වණ්ණො

" '**කීදිසො තස්ස වණ්ණො'ති?** එත්ථ අබ්‍යත්ත-රත්ත-වණ්ණො තස්ස වණ්ණො භවෙ. වුත්තඤ්හි අභිධානප්පදීපිකායං :- "අරුණො කිඤ්චි රත්තොථා'ති." තට්ටීකායඤ්ච :- "කිඤ්චි රත්තො අබ්‍යත්ත-රත්ත-වණ්ණො අරුණො නාම, යථා මච්ඡස්ස අක්ඛී'ති." විමතිවිනොදනියඤ්ච :- "වඩ්ඪන-ඝන-රත්තො පභාවිසෙසො'ති."

3. අරුණේ පාට

" '**ඒ අරුණේ පාට කෙබඳු ද?**' යන, මෙහි මඳ රතුපාට ඒ අරුණේ පාට වේ. අභිධානප්පදීපිකාවෙහි [97 ගා.] එය මෙසේ කියන ලදි :- "අරුණ නම් කිසියම් රතුපාටයි." එම ටීකාවෙහි ද :- "අරුණ නම් කිසියම් රතුපාටයි, මඳ රතුපාටයි, මාලුවාගේ ඇස්වල පාට මෙනි." විමතිවිනොදනියෙහි ද [258 පි.] :- "වැඩීගෙන එන තද රතුපාට ප්‍රභා විශේෂයෙකැ"යි කියන ලදි."

(වින.අ.ටී.1.0021; අභි.ප.සූ.26)

පුන ච පරං අභිධානප්පදීපිකායං :- "අරුණො රංසිභෙදෙ චාව්‍යත්තරාගෙ ච ලොහිතෙ."

නැවත ද අභිධානප්පදීපිකාවෙහි :- "අරුණ නම් රැස් භේදයන් අතර මඳ රතුපාට ද ලේ පාට ද වේ" යැයි කියන ලදි. (අභි.ප.980 ගා.)

ජාතකට්ඨකථායඤ්ච :- "රත්තිපරියොසානෙ අරුණෙ උග්ගතෙ පුරත්ථිමා දිසා රත්තසුවණ්ණතාය උත්තමරූපධරා හුත්වා දිස්සතී'ති."

ජාතක අටුවාවෙහි ද :- "රාත්‍රියෙහි අවසානයේ අරුණ නැගි කල්හි නැගෙනහිර දිසාව ලස්සන රතුපාට ඇති බැවින් උතුම් රූපයෙන් යුතුව පෙනේ යැයි" කියන ලදි. (ජා.අ.vi.241)

"තස්මා සූරියස්ස **රත්තප්පභායෙව** අරුණො නාම, න සෙතප්පභාදයො'ති දට්ඨබ්බං." [1]

"එබැවින් සූය්‍ර්‍යයාගේ **රතු ප්‍රභාව ම** අරුණ නම්. **සුදු ප්‍රභා** ආදිය යැයි නොදත යුතුය." [1]

(වින.අ.ටී.1.0022-3; අභි.ප.සූ.26)

4. අරුණස්ස සණ්ඨානං

" '**සණ්ඨානං කීදිසං භවෙ' ති?** , එත්ථ අරුණස්ස පාටෙක්කං සණ්ඨානං නාම නත්ථි, රස්මිමත්තත්තා. යත්තකං පදෙසං ඵරති, තත්තකං තස්ස සණ්ඨානන්ති දට්ඨබ්බං. අථවා පුරත්ථිමදිසාසණ්ඨානං. වුත්තඤ්හි ජාතකට්ඨකථායං :- "අරුණෙ උග්ගතෙ පුරත්ථිමා දිසා රත්තසුවණ්ණතාය උත්තමරූපධරා හුත්වා දිස්සතී' ති."

4. අරුණේ සටහන

" '**අරුණේ සටහන කෙබඳද?** යන, මෙහි අරුණට වෙන්වූ සටහනක් නම් නැත, රශ්මි මාත්‍රයක් බැවිනි. යම් පමණ පෙදෙසක පැතිරේ ද, එපමණක්ම ඒ අරුණේ සටහන යැයි දත යුතුයි. නොහොත් නැගෙනහිර දිසාව අරුණේ සටහනයි. මෙය ජාතක අටුවාවෙහි [vi 241 පි.] මෙසේ කියන ලදි :- "අරුණ නැගි කල්හි නැගෙනහිර දිසාව ලස්සන රතුපාට ඇති බැවින් උතුම් රූපයෙන් යුතුව පෙනේ" යනුවෙනි. (වින.අ.ටී.1.0023; අභි.ප.සූ.26)

5. අරුණස්ස කාලො ච දිසාභාගො ච

" '**කිස්මිං කාලෙ ච දෙසෙ ච අරුණො සමුගච්ඡතී' ති?**, එත්ථ එස අරුණො සූරියුග්ගමනස්ස පුරෙ කාලෙ පුරත්ථිමදිසායං උග්ගච්ඡති. වුත්තඤ්හෙතං උදානට්ඨකථායං :- "අරුණො නාම පුරත්ථිමදිසාය සූරියොදයතො පුරෙතරමෙව වුට්ඨිතොභාසො"ති.

5. අරුණේ කාලය හා දිසාව

" '**කුමන කාලයේ කුමන දිසාවේ අරුණ නගී ද?**' යන, මෙහි අරුණ නම් සූය්‍ර්‍ය උදාවීමට පෙර කාලයෙහි නැගෙනහිර දිසාවේ නගියි. මෙය උදාන අටුවාවෙහි [124 පි.] මෙසේ කියන ලදි :- "අරුණ නම් නැගෙනහිර දිසාවේ සූය්‍ර්‍ය උදාවට කලින් නැගීසිටි ආලෝකය".

---

1. අරුණේ රතුපාට බව සිංහල ග්‍රන්ථ කීපයකත් මෙසේ සඳහන් වේ:-
   (i) "**අරුණ** යනු මඳ රත් පැහැයට නමකි. ඒ නම පළමුවෙන් උදවන හිරු රැසට තබා ඇත්තේ, ඒ හිරු රැසත් මඳ රත් පැහැය ඇති බැවිනි." (වින.කම්.පො. 'වත්මානත් පිරිම ගැන දතයුතු කරුණු)
   (ii) "**අරුණ** යනු සූය්‍ර්‍යයා උදාවීමට පෙර නැගෙනහිර අහසෙහි ඇති වන රක්තවර්ණ ආලෝකය." (ශ්‍රී.සු.ශ.)
   (iii) "**අරුණ** යනු මඳ රත් පැහැති. හිරු උදාවට පෙර අහසේ ඇති වන මඳ රත් පැහැය. **අරුණ ප්‍රභා** යනු හිරු උදාවන්නට පළමු පෙරදිග අහසේ දක්නට ලැබෙන මඳ රතු එළිය. **අරුණ වර්ණය** යනු රත් පැහැය. නැගෙනහිර අහසෙහි අලුයම පෙනෙන රක්ත වර්ණය." (ප්‍රා.සිං.ශ.)
   (iv) "**අරුණුවන්, අරුණුවර්ණ** යනු රතු, දුඹුරු " (Sinhalese-English Dictionary, C. Carter, M.D. Gunasena & Co. Ltd., Colombo 1965)
   (v) "ඍග්වේදයෙහි දක්නා ලැබෙන **අරුණ** යන පදයෙන් හුදෙක් අරුණුවන් [රතු] පැහැය හෝ අරුණාලෝකය හෝ අදහස් කරයි." (සිං.වි.කෝ.)
   - සංස්කෘත් ආදී විදේශික ග්‍රන්ථවලත් "**අරුණ** යනු රත් පැහැයට නමකි" යැයි සඳහන් වේ. කරුණාකර P.T.S., Pali English Dictionary යන පොත බලන්න.

**සංලක්‍ෂ්‍යය** : ඉර බහින වේලාවේදීත් මෙවැනි රත් පැහැයකුදු බටහිර අහසේ දක්නට ලැබේනුයි මෙහි සටහන් කළ යුතුය. මෙය පාළියේ '**අරුණොග්ගමනං**' (අරුණ + ඔග්ගමනං=අරුණ බැස්ම) කියනු ලැබේ. එනම් රතුපාට බැස්ම යැයි.

අභිධානප්පදීපිකායඤ්ච :- "සූරස්සොදයතො පුබ්බුට්ඨිතරංසි සියාරුණො"ති.

අභිධානප්පදීපිකාවෙහි ද [65 ගා.] :-"සූර්‍ය්‍යයාගේ උදවට පෙර නැගීසිටි රැස් අරුණ නම් වන්නෙය." (වින.අ.ටී.1.0023; අභි.ප.සූ.26)

භගවතා ච :- "සූරියස්ස, භික්ඛවෙ, උදයතො එතං පුබ්බඞ්ගමං, එතං පුබ්බනිමිත්තං, යදිදං අරුණුග්ගං."

භාග්‍යවතුන් වහන්සේ විසින් ද මෙය මෙසේ කියන ලදි :- "මහණෙනි ! සූර්‍ය්‍යයාගේ උදවීමට මෙය පූර්වංගමය, මෙය පෙරනිමිත්තය, එනම් අරුණ නැගීමය (අරුණුග්ගං)." (සං.නි.v.50)

දීඝනිකායටීකායඤ්ච :-"අරුණො"ති සූරියස්ස උදයතො පුබ්බභාගෙ උට්ඨිතරංසි."

දීඝනිකාය ටීකාවෙහි ද:- "අරුණ යන සූර්‍ය්‍යයාගේ උදවට පූර්වභාගයෙහි නැගීසිටි රැස්ය යැ"යි කියන ලදි.

## 6. අරුණස්ස පච්චක්ඛසිද්ධභාවො

## 6. අරුණේ ප්‍රත්‍යක්ෂයෙන් දතයුතු බව

"**'කිං පච්චක්ඛසිද්ධො එසො, උදාහු අනුමානතො'ති?**, එත්ථ අයං අරුණො නාම පච්චක්ඛසිද්ධො එව, න අනුමානසිද්ධො. කස්මා විඤ්ඤායතී'ති චෙ? චක්ඛුවිඤ්ඤාණගොචරවණ්ණායතනභාවතො. 'අක්ඛස්ස පතී'ති=පච්චක්ඛං. චක්ඛුරූපානං අභිමුඛභාවෙන ආපාථගතත්තා චක්ඛුවිඤ්ඤාණං හොති. වුත්තඤ්හෙතං භගවතා :- "චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං." තස්මා අයං අරුණවණ්ණො චක්ඛුනා දිස්වා ජානිබ්බතො පච්චක්ඛසිද්ධොයෙව හොති. [පච්ඡා පන :] 'න එවං සති, එවං භවෙය්‍යා'ති, අනුමානෙන, පුනප්පුනං චින්තනෙන සිද්ධො'ති.

" **'කිමෙක්ද? අරුණ ප්‍රත්‍යක්ෂයෙන් දතයුතු සිද්ධියක් ද? නොහොත් අනුමානයෙන් දත යුත්තක් ද?**" යන, මෙහි මේ අරුණ නම් ප්‍රත්‍යක්ෂයෙන්ම දතයුතු සිද්ධියකි. අනුමානයෙන් දතයුතු සිද්ධියක් නොවේ. මෙසේ නම්, කුමක් හෙයින් දක්නා ලැබේද? චක්ෂුවිඥානයට ගොදුරු වන්නාවූ වර්ණ ආයතනය බැවිනි. 'අක්ෂයට (ඇසට) ප්‍රති (ඉදිරිපිට)' = ප්‍රත්‍යක්ෂය. ඇස හා රූපයන් අභිමුඛව ඉදිරියට පැමිණි බැවින් චක්ෂුවිඥානය පහළ වේ. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය මෙසේ කියන ලදි :-"ඇස හා රූපයන් නිසා චක්ෂුවිඥානය උපදී." (ම.නි.i.608) එහෙයින් අරුණේ පාට ඇසින් දැක දැනගත යුතු බැවින් අරුණ ප්‍රත්‍යක්ෂයෙන්ම දතයුතු සිද්ධියකි. [පසුව වනාහි :] 'මෙසේ නැති කල්හි, එසේ නොවන්නේ යැ'යි, අනුමානයෙන්, නැවත නැවත සිතීමෙන් දතයුතු සිද්ධියකි.

ඉමං පඤ්හ-විස්සජ්ජනං සාධුකං මනසිකරිත්වා පණ්ඩිතෙහි '**රත්තොභාසොයෙව අරුණො**'ති පච්චෙතබ්බො, සල්ලක්ඛෙතබ්බො'ති."

මේ ප්‍රශ්න හා පිළිතුරු මනාසේ මෙනෙහි කොට පණ්ඩිතයන් විසින් '**රතු එළියම අරුණ** යැ'යි අවබෝධ කළ යුතුයි, සැළකිය යුතුයි." (වින.අ.ටී.1.0023; අභි.ප.සූ.26)

**1994 දෙසැම්බර් 28 - 31 දිනවල**

**නිමලව අරණ්‍යයේ සමුද්‍රකුටියේදී**

**ප්‍රත්‍යක්ෂ කළ**

# අරුණ

**සංලක්ෂ්‍යය:** මෙම ග්‍රන්ථයෙහි සඳහන් වන සියලු වෙලාවන් පරණ වේලාව අනුවයි.

# නැගෙනහිර දිසාවේ රාත්‍රියේ ආකාශය




පරණ වේලාව
පෙ.ව. 3:00

සිකුරු තරුව →

තව → නොපෙනෙන ක්ෂිතිජය



1

පෙ.ව. 4:00

සිකුරු තරුව →

බුද →

තව → නොපෙනෙන ක්ෂිතිජය



2

පෙ.ව. 4:30

සිකුරු තරුව →

බුද →

තව → නොපෙනෙන ක්ෂිතිජය



3

පෙ.ව. 4:30- 5:05

සිකුරු තරුව →

බුද →

තව → නොපෙනෙන ක්ෂිතිජය



4

පෙ.ව. 5:05

සිකුරු තරුව →

බුද →

උදේ හිමිදිරි සුදු එළිය පටන්ගන්නා වේලාව

ක්ෂිතිජය → අප්‍රකටයි



5

පෙ.ව. 5:10

සි. →

බු. →

උදේ හිමිදිරි
සුදු එළිය.

ක්ෂිතිජය →
අප්‍රකටයි



6

පෙ.ව. 5:15

සි. →

බු. →

උදේ හිමිදිරි
සුදු එළිය
පුළුල් වීම

**මඳ රතුපාට**
**(අරුණ)**
**පහළ වීම**

ක්ෂිතිජය →
අප්‍රකටයි



7

පෙ.ව. 5:20

සි. →

බු. →

උදේ හිමිදිරි
සුදු එළිය
තව පුළුල් වීම

මඳ රතුපාට
පුළුල් වීම

ක්ෂිතිජය →
ප්‍රකට මදි



8

පෙ.ව. 5:30

සි. →

බු. →

උදේ හිමිදිරි
සුදු එළිය
තව පුළුල්
වීම

රතුපාට තදවීම
හා තව පුළුල් වීම

ක්ෂිතිජය →
ප්‍රකට මදි



9

පෙ.ව. 5:45

උදේ හිමිදිරි
සුදු එළිය
සිවු දිසාවන්හි
පැතිරීම

වැඩීගෙන එන
තද රතුපාටයි

ක්ෂිතිජය
මනාසේ
ප්‍රකටයි →

මුහුදේ නිල්
පාටත් ප්‍රකටයි



10

මෙම වේලාවේ (පෙ.ව. 5:45) දී :

1. සූයර්‍යාලෝකය පැතුරුන බැවින් නැගෙනහිර- දකුණ - බස්නාහිර - උතුරු යන සිවු දිසාවන්හි සුදුපාට දක්නා ලැබේ.
2. මෙම කාලය පටන් රතුපාට ඊට වඩා උඩට නොයේ. ශීර්ෂයට (මුදුනට) පැමිණේ.
3. ක්‍රමානුකූලව වැඩි වැඩියෙන් එළි වේ.
4. ඉර උදාවන වේලාව - 6:20

## ශ්‍රී ලංකාවේ උදේ හිමිදිරි සුදු එළිය
## පටන්ගන්නා වේලාව (TW1) හා ඉර උදාවීම (SR)

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ පර්යේෂණය හා පරිගණක දත්තයන් අනුවත් ලංකාවේ වර්ෂයක් තුල උදේ හිමිදිරි සුදු එළිය පටන්ගන්නා වේලාව ද ඉර උදවන වේලාව ද මෙසේ යි:

| දිනය | උදේ හිමිදිරි සුදු එළිය (TW 1) | ඉර උදාවීම (SR) |
|---|---|---|
| **දෙසැම්බර්** | | |
| 28 | 5:05 | 6:20 |
| 29 | 5:06 | 6:21 |
| 30 | 5.06 | 6:21 |
| 31 | 5:07 | 6:22 |
| **ජනවාරි** | | |
| 1 | 5:07 | 6:22 |
| 3 | 5:08 | 6:22 |
| 5 | 5:09 | 6:23 |
| 7 | 5:10 | 6:24 |
| 9 | 5:11 | 6:25 |
| 12 | 5:12 | 6:26 |
| 14 | 5:13 | 6:27 |
| 17 | 5:14 | 6:27 |
| 20 | 5:15 | 6:28 |
| 24 | 5:16 | 6:29 |
| 29 | 5:17 | 6:29 |
| 31 | 5:17 | 6:29 |
| **පෙබරවාරි** | | |
| 1 | 5:17 | 6:29 |
| 18 | 5:17 | 6:27 |
| 19 | 5:16 | 6:27 |
| 24 | 5:15 | 6:25 |
| 28 | 5:14 | 6:24 |
| **මාර්තු** | | |
| 2 | 5:13 | 6:23 |
| 5 | 5:12 | 6:22 |
| 7 | 5:11 | 6:21 |
| 10 | 5:10 | 6:20 |
| 12 | 5:09 | 6:19 |
| 14 | 5:08 | 6:18 |
| 17 | 5:07 | 6:16 |
| 19 | 5:06 | 6:15 |
| 21 | 5:05 | 6:14 |
| 23 | 5:04 | 6:13 |
| 25 | 5:03 | 6:12 |
| 27 | 5:02 | 6:11 |
| 29 | 5:01 | 6:10 |
| 30 | 5:00 | 6:10 |

| දිනය | උදේ හිමිදිරි සුදු එළිය (TW 1) | ඉර උදාවීම (SR) |
|---|---|---|
| **අප්‍රේල්** | | |
| 1 | 4:59 | 6:09 |
| 3 | 4:58 | 6:08 |
| 5 | 4:57 | 6:07 |
| 7 | 4:56 | 6:06 |
| 9 | 4:55 | 6:05 |
| 11 | 4:54 | 6:04 |
| 12 | 4:53 | 6:04 |
| 14 | 4:52 | 6:03 |
| 16 | 4:51 | 6:02 |
| 18 | 4:50 | 6:01 |
| 20 | 4:49 | 6:00 |
| 22 | 4:48 | 6:00 |
| 25 | 4:47 | 5:59 |
| 27 | 4:46 | 5:58 |
| 29 | 4:45 | 5:57 |
| **මැයි** | | |
| 1 | 4:44 | 5:57 |
| 4 | 4:43 | 5:56 |
| 7 | 4:42 | 5:55 |
| 10 | 4:41 | 5:55 |
| 13 | 4:40 | 5:54 |
| 17 | 4:39 | 5:54 |
| 23 | 4:38 | 5:53 |
| 31 | 4:38 | 5:53 |
| **ජූනි** | | |
| 1 | 4:38 | 5:53 |
| 13 | 4:39 | 5:55 |
| 19 | 4:40 | 5:56 |
| 24 | 4:41 | 5:57 |
| 28 | 4:42 | 5:58 |
| **ජූලි** | | |
| 2 | 4:43 | 5:59 |
| 5 | 4:44 | 6:00 |
| 9 | 4:45 | 6:01 |
| 12 | 4:46 | 6:01 |
| 15 | 4:47 | 6:02 |
| 19 | 4:48 | 6:03 |
| 23 | 4:49 | 6:04 |

| දිනය | උදේ හිමිදිරි සුදු එළිය (TW 1) | ඉර උදාවීම (SR) |
|---|---|---|
| **ජූලි ඉතිරි කොටස** | | |
| 26 | 4:50 | 6:04 |
| 31 | 4:51 | 6:04 |
| **අගෝස්තු** | | |
| 5 | 4:52 | 6:05 |
| 12 | 4:53 | 6:05 |
| **සැප්තැම්බර්** | | |
| 8 | 4:52 | 6:02 |
| 16 | 4:51 | 6:01 |
| 23 | 4:50 | 6:00 |
| 30 | 4:49 | 5:59 |
| **ඔක්තෝම්බර්** | | |
| 6 | 4:48 | 5:58 |
| 14 | 4:47 | 5:57 |
| **නොවැම්බර්** | | |
| 11 | 4:48 | 6:00 |
| 17 | 4:49 | 6:02 |
| 21 | 4:50 | 6:03 |
| 25 | 4:51 | 6:04 |
| 28 | 4:52 | 6:06 |
| **දෙසැම්බර්** | | |
| 1 | 4:53 | 6:07 |
| 3 | 4:54 | 6:08 |
| 6 | 4:55 | 6:09 |
| 8 | 4:56 | 6:10 |
| 10 | 4:57 | 6:11 |
| 12 | 4:58 | 6:12 |
| 15 | 4:59 | 6:14 |
| 17 | 5:00 | 6:15 |
| 19 | 5:01 | 6:16 |
| 21 | 5:02 | 6:17 |
| 23 | 5:03 | 6:18 |
| 25 | 5:04 | 6:19 |
| 27 | 5:05 | 6:20 |
| 29 | 5:06 | 6:21 |
| 31 | 5:07 | 6:22 |

ALL TIMES IN SRI LANKA STANDARD TIME : TW1 - BEGINNING OF MORNING TWILIGHT SR- SUN RISE
DEPARTMENT OF METEOROGY, COLOMBO, SRI LANKA

මෙම සංඛ්‍යා ලේඛන අනුව,

**උදේ හිමිදිරි සුදු එළිය**

- වැඩි තරමින් පටන්ගන්නා වේලාව : ජනවාරි 29, පෙ.ව. 5:17 යි. මෙය ඉර උදවට පැය 1:12 ට, නොහොත් විනාඩි 72 ට පෙර සිදුවේ. ඊට පෙර සම්පූර්ණයෙන්ම අඳුරුයි. ක්ෂිතිජයේ එකම පාට පවතී, එනම් කළුපාටයි.
- අඩු තරමින් පටන්ගන්නා වේලාව : මැයි 23, පෙ.ව. 4:38 යි. මෙය ඉර උදවට පැය 1:15 ට, නොහොත් විනාඩි 75 ට පෙර සිදුවේ. ඊට පෙර සම්පූර්ණයෙන්ම අඳුරුයි. ක්ෂිතිජයේ එකම පාට පවතී, එනම් කළුපාටයි.

**මඳ රතුපාට** (අරුණ) නම් උදේ හිමිදිරි සුදු එළියට විනාඩි 10 ට පසු පහළ වේ. ඉර උදවට විනාඩි 65 ට පෙර පහළ වේ. හාත්පස තවම අන්ධකාරයක් පවතී.

**වැඩීගෙන එන තද රතුපාට** නම් උදේ හිමිදිරි සුදු එළියට විනාඩි 40 ට පසු පහළ වේ. ඉර උදවට විනාඩි 30-35 ට පෙර පහළ වේ. හාත්පස එළිය පවතී.

වර්ෂයක් තුළ සාමාන්‍ය වශයෙන් සටහනක් දැක්වූවොත් ඒ සියලු වේලාවන් මෙසේ පෙනේ :
(කරුණාකර ඊළඟ පිටුවෙහි සටහන 11 හා ඒ ගැන විස්තරය බලන්න.)

## සටහන 11 ට විස්තරය

ශ්‍රී ලංකාවේ වර්ෂයක් තුළ : (I) උදේ හිමිදිරි සුදු එළිය පටන්ගන්නා වේලාව.
(II) මඳ රතුපාට (අරුණ) පහළ වන වේලාව.
(III) වැඩීගෙන එන තද රතුපාට හෝ ලේ පාට හා සිවු දිසා සුදුපාට වන වේලාව.
(IV) ඉර උදවන වේලාව.

**සංලක්ෂ්‍යය :**

මෙහි I, II, III, IV යනු ප්‍රත්‍යක්ෂයෙන් ඔප්පු කළ හැකි සිද්ධි. යට ගැසූ ⊗ වක් රේඛාව ඉර උදවට සිංහල පැය හතරකට පෙර (= ඉංග්‍රීසි පැය 1:36 ට = ඉංග්‍රීසි විනාඩි 96 ට පෙර) අරුණෝදය සිදුවේ යැයි යන ඒ ගණන් ක්‍රමය අනුව වේලාව දක්වයි. ඒ ගණන් ක්‍රමය දඹදිවේ භාවිත වන පඤ්චාංග ලිත් ආදී පොත්වල සටහන් වී තිබේ නමුත්, ශ්‍රී ලංකාවේ කවදවත් ප්‍රත්‍යක්ෂයෙන් ඔප්පු කළ නො හැකිය. මේ වේලාවේ ක්ෂිතිජයෙහි එකම පාට පවතී, එනම් කළුපාටයි.

සටහන 11




ශ්‍රී ලංකාවේ වර්ෂයක් තුල I නියම උදේ හිමිදිරි සුදු එළිය, II නියම මද රතුපාට (අරුණ) III නියම වැඩීගෙන එන තද රතුපාට හා සිවු දිසා සුදුපාට වීම, IV නියම ඉර උදවීම යන වේලාවන් සාමාන්‍ය වශයෙන් දැක්වෙන සටහන ⓧ යනු ප්‍රත්‍යක්ෂ නොකල හැකි අරුණෝදය

### 1995 මාර්තු 27 වන දිනයෙහි ශ්‍රී පාද කඳු මුදුනකදී ප්‍රත්‍යක්ෂ කළ අරුණ

1995 මාර්තු 27 දිනයෙහි මමත්, පියරතන සාමණේර ආයුෂ්මතුන් වහන්සේත්, ඇස්වත්තු වාසී වික්‍රමසිංහ මහතා ප්‍රධාන විශාල ගිහි පිරිසක් එකතුව, පෙ.ව. 4:00 ට සිරිපා මළුවට පිවිසියෙමු. පෙ.ව. 5:00 වන තුරු සම්පූර්ණයෙන්ම අන්ධකාරය පැවතිණි. නමුත්,

- පෙ.ව. 5:02 ට පමණ නැගෙනහිර දිග ක්ෂිතිජයේ **උදේ හිමිදිරි සුදු එළිය** පෙනෙන්නට පටන් ගත්තේය.
- විනාඩි 10 කට පමණ පසු (5:12ට) මඳ රතුපාට පහළ විය.
- පෙ.ව. 5:40 ට පමණ **වැඩීගෙන එන තද රතුපාට** මුළු නැගෙනහිර අහසේ පහළ කොටසෙහි පළල් අතට පැතිරී ගිය. උදේ හිමිදිරි සුදු එළියත් සිව් දිසාවන්හි පැතිරී ගිය. රාත්‍රිය ගෙවී එළි විය.
- ක්‍රමානුකූලව වැඩි වැඩියෙන් එළි විය.
- පෙ.ව. 6:11 ට පමණ ඉර උදා විය.

(කරුණාකර පිට 12 හා 14 බලා සංසඳනය කරන්න.)

### වෙනත් ස්වාමීන්වහන්සේලා විසින් අහස නිරීක්ෂණය කිරීම තුළින් උදේ හිමිදිරි එළිය හා අරුණ සම්බන්ධව සටහන් කර ගන්නා ලද දත්ත

1. **1999 ජනවාරි 29 වන දිනයෙහි ශ්‍රී පාද කඳු මුදුනකදී**

   1999.1.29 වන දිනයෙහි පූජ්‍ය කටුගස්ගොඩ සනාථවිහාරී ස්වාමීන්වහන්සේ හිමිදිරි පාන්දර සිරිපා මළුවෙන් නැගෙනහිර දිසාවෙහි ක්ෂිතිජය නිරීක්ෂණය කොට පහත සඳහන් තොරතුරු දුන්නේය:

   - පෙ.ව. 5:18 වන විට ආලෝකය පහළ විය යනුයි.

   ජනවාරි 29 වන දිනයෙහි උදේ හිමිදිරි සුදු එළියේ නිවැරදි වේලාව නම් පෙ.ව. 5:17 යි. මෙසේ උන්වහන්සේ විසින් ඒ එළිය විනාඩි 1 කට පසු දක්නා ලදී.

   (කරුණාකර 12 හා 14 පිට බලා සංසඳනය කරන්න.)

2. **1999 අප්‍රේල් 28 වන දිනයෙහි නාඋයනේ ප්‍රදේශයෙහි කඳු මුදුනකදී**

   පූජ්‍ය ගාල්ලේ සංඝසෝභන ස්වාමීන් වහන්සේත්, පූජ්‍ය ඕස්ට්‍රේලියාවේ විසාරද ස්වාමීන් වහන්සේත් ඇතුළු තවත් ස්වාමීන් වහන්සේලා පිරිසකුත් එකතුව අරුණ බලා ගැනීම සඳහා නාඋයන ප්‍රදේශයෙහි කඳු මුදුනකට නැග රාත්‍රි කාලය එහි ගත කළහ. උදෑසන, එනම් 1999.4.28 වන දින හිමිදිරි පාන්දර පූජ්‍ය ගාල්ලේ සංඝසෝභන ස්වාමීන් වහන්සේත් පූජ්‍ය ඕස්ට්‍රේලියාවේ විසාරද ස්වාමීන් වහන්සේත් නැගෙනහිර දිසාවෙහි ක්ෂිතිජය නිරීක්ෂණය කොට පහත සඳහන් දත්තයන් සටහන් කළාහුය:

   - පෙ.ව. 4:52 වන විට සුදු එළිය පහළ විය.
   - පෙ.ව. 5:12 වන විට පළමුවැනි මඳ රතුපාට පහළ විය.
   - පෙ.ව. 5:58 වන විට ඉර උදාවිය යනුයි.

මෙදින ආකාශයේ මීදුම තිබූ බැවි උන්වහන්සේලා පැවසූහ. ආකාශය මීදුමෙන් තොරව පැහැදිලිව තිබුණි නම් අප්‍රේල් 28 වන දිනයෙහි නිවැරදි වේලාවන් මෙසේය:

- පෙ.ව. 4:46 වන විට පළමුවැනි සුදු එළිය පහළ වීමය.
- පෙ.ව. 4:56 වන විට පළමුවැනි මඳ රතුපාට පහළ වීමය.
- පෙ.ව. 5:58 වන විට ඉර උදාවීමය යනුයි.

මේ අයුරින් උන්වහන්සේලා විසින් ආකාශයේ මීදුම තිබූ බැවින් පළමු සුදු එළිය විනාඩි 6කට **පසු** දක්නා ලදී. පළමු මඳ රතුපාට විනාඩි 18කට **පසු** දක්නා ලදී. කොහොම නමුත් මෙම දත්තයන්ගේ ලොකු වෙනස්කමක් නොමැත.

අපට මෙහි පැහැදිලිවන කාරණය නම් අප්‍රේල් 28 වන දිනයෙහි ඉර උදාවට විනාඩි 72 කට පමණ පෙර පළමුවැනි සුදු එළිය පහළ වන බව හා ඉර උදාවට විනාඩි 52 කට පමණ පෙර පළමුවැනි රතුපාට පහළ වන බව යනුයි.

(කරුණාකර 12 හා 14 පිට බලා සංසඳනය කරන්න.)

## 1997 මාර්තු 23 දිනයෙහි 'බුදු සරණ' පත්‍රයේ ශ්‍රී පාදේ ඉර සේවය ගැන පහළ වූ ලිපියකි



**සිතිජ ඉමේ හිරු මතුවීමට මොහොතකට පෙර**

## මිහිපිට අසිරිමත් වණී සැණකෙළිය
# ඉර සේවය

"වේලාව හිමිදිරි පාන්දර හයට [6:00ට] ඉතා ආසන්නව ඇත.
දැන් සිරිපා මළුව මත සුදුවතින් සැරසුණු බැතිමතුන් ලොකු උනන්දුවකින් රොක් වෙනු දැකිය හැකිය.
දැන් දැන් සිතිජ ඉමේ ගගන තලය කෙමෙන් කෙමෙන් **තැඹිලි පැහැයට** හැරෙනු පෙනේ. ඊට වමෙන් මෙන්ම දකුණෙන් ද දිස්වනුයේ ලා කහ පැහැයකි. මොහොතික් මොහොත එම වර්ණවල ඇතිවනුයේ වෙනසකි.
දැන් වේලාව උදේ හයයි විනාඩි දහය [6:10] බව අත බැඳි හෝරා යතුර කියා පායි. දැන් දැන් සිතිජය කෙළවර වූ මන්දලෝකය කෙමෙන් තීව්‍ර වෙනු පෙනේ. එක් ස්ථානයක අහසේ පැහැය තැඹිලි පැහැය ඉක්මවමින් **ලා රත් පැහැයක්** ගනී. එය මොහොතින් මොහොත වෙනස් වෙද්දී මළුව මත සිටින පිරිස තුළ නොඉවසිල්ල රජයනු පෙනේ. වැඩියෙන් ආලෝකය සහිත ස්ථානයෙන් සූර්ය දිව්‍යරාජයා සිය ප්‍රභාමත් සිරස ඔසවනු ඇති බව බැතිමත්හු දනිති. විනාඩියෙන් විනාඩිය ගතවන විට ඇත ගගන තලයේ ඉහළ දෙසට මුහුදු මට්ටමේ සිට ආලෝක කදම්බයන් එල්ලවීමට පටන්ගැනෙනුයේ අති ප්‍රබල විදුලි පන්දම් දස දහස් ගණනක් එකවර දැල්වූ කලෙක මෙනි. ගතවූයේ තව නිමේෂයකි. එකවරම සිතිජ ඉමෙන් ලා කහ පැහැති රෝදයක් බඳු හිරු ඉහළට නගිනු පෙනෙන්නට විය. විනාඩියක් ගතවෙත්ම සම්පූර්ණ සූර්යයා සිතිජයෙන් ඉහළ අහසේ අඩියක් පමණ ඉහළට එසැවී තිබිණ. සූර්යයාගෙන් නිකුත්වන ප්‍රභා කදම්භය සිරිපා මළුව වෙත එක එල්ලේම එල්ල විණි."

සටහන සහ සේයාරූ
නිමල් විජයතුංග
ඇහැලියගොඩ
විශේෂ වාර්තාකරු

**සංලක්ෂ්‍යය**- මේ දත්ත සියල්ල පෙබරවාරි 1-15 දිනවල අතර ගන්නා ලද බව හා පරණ වේලාව අනුව මේ ලිපියේ විනාඩි 30 ක් අඩු කළයුතු බව ලේක්හවුස් ආයතනයේ 'බුදු සරණ' අංශයේ අධ්‍යක්ෂක හා නිමල් විජයතුංග මහතා පවසයි. එසේ නම්, මේ ලිපියේ සටහන් වන "**හිමිදිරි පාන්දර හයට [6.00ට]**" යනුඃ පහයි තිහට (5:30ට) විය යුතුයි. "**උදේ හයයි විනාඩි දහය** [6:10]" යනුඃ උදේ පහයි හතළිහයි (5:40) විය යුතුයි.
(කරුණාකර 12 හා 14 පිට බලා සංසඳනය කරන්න.)

# II. අරුණෝද්ගමන විනිශ්චය

## දෙවැනි පරිච්ඡේදය

# අරුණෝද්ගමනය යනු කුමක්ද?

### 1. අරුණ හා අරුණෝද්ගමනය අතර වෙනස

අරුණ යන මේ වචනය මුළු විනය පිටකයේ '**අන්තො අරුණෙ**' (අරුණ තුළ/සමීපයේ) වශයෙන් දෙවරක් ද, '**පුරාරුණා**' (අරුණට පෙර) වශයෙන් දෙවරක් ද දක්නට ලැබේ. එහෙත් '**අරුණුග්ගමනං**' , '**අරුණුග්ගං**' වශයෙන් හෝ '**උද්ධස්තෙ අරුණෙ**'(අරුණ නැගි කල්හි) වශයෙන් හෝ යන මේ යෙදුම්වලින් නොයෙක් තැන්වල පෙනේ.

ඇත්ත වශයෙන් කියතොත් විනය පිටකයේ '**අරුණ**' නොව, '**අරුණොද්ගමනය**' යනු ඇවැත් විනිශ්චය සඳහා ප්‍රධානතම මිම්මය. උදහරණ වශයෙන් මෙහි i) අරුණ හා ඇවැතක් නැති බව ගැන සහ ii) අරුණෝද්ගමනය හා ඇවැතක් ඇති බව ගැන නිදර්ශන කීපයක් දැක්විය හැක :

#### i) <u>අරුණ හා ඇවැතක් නැති බව</u>

| පාළි | සිංහලානුවාදය |
|---|---|
| 1. "අනාපත්තිඃ අන්තො අරුණෙ [චීවරං] පච්චුද්ධරති/අධිට්ඨෙති." | 1. **අරුණ තුළ** (අන්තො අරුණෙ) සිවුර පච්චුද්ධරණ/අධිෂ්ඨාන කෙරේ නම් ඇවැතක් නැත." (පාරා.510/පාචි.ii.96) |
| 2. "අනාපත්තිඃ තතියාය රත්තියා පුරාරුණා නික්ඛමිත්වා පුන වසති." | 2. "තෙවැනි රාත්‍රියෙහි **අරුණට පෙර** (පුරාරුණා) නික්ම නැවත වෙසේ නම් ඇවැතක් නැත." (පාචි. i.58, 290) |
| ඉධ "**අන්තො අරණෙ**'තිඃ අරුණොදයතො පුරෙතරමෙව." | මෙහි "**අරුණ තුළ** යනුඃ අරුණෝදයට පෙරම." (වින.අ.ටී.2.224,229) |
| "**අරුණොදයන්**'තිඃ අරුණුග්ගමනවෙලායං." | "**අරුණෝදය** යනුඃ අරුණෝද්ගමන වේලාවයි." (නම.ටී.49) |
| එවං '**අන්තො අරණෙ**'තිඃ අරුණුග්ගමනතො පුරෙතරො එව කාලො'ති අත්ථො. | මෙසේ '**අරුණ තුළ**' යනුඃ අරුණෝද්ගමනයට පෙර වූ කාලය යන අර්ථයයි. '**අරුණ තුළ**' යන මේ කාලපරිච්ඡේදය රාත්‍රියේ පශ්චිම යාමයෙහි **ප්‍රත්‍යූෂ** කාලයට අන්තර්-ගතයි. එය මෙසේ කියන ලදිඃ- |
| "**පච්චූසකාලො**'තිඃ පච්ඡිමයාමකාලෙ අරු-ණොදයතො පුරෙතරමෙව. තථා හි වක්ඛන්ති 'අන්තො අරුණෙයෙව'." | "**ප්‍රත්‍යූෂ කාලය** යනුඃ පශ්චිම යාම කාලයෙහි අරුණෝදයට පෙරම. එහෙයින් '**අරුණ තුළම**' (අන්තො අරුණෙයෙව) එසේද කියති." (වින.අ.ටී.2.224) |

'**ප්‍රත්‍යූෂ**' නැතහොත් '**අරුණ තුළ**' යනු රාත්‍රි, අඳුරු කාලයට අන්තර්ගතයි. '**රත්තියා පච්චූස-සමයං**' යන පාළි යෙදුම පාචි.i.348 හි කරුණාකර බලන්න.

අරුණෝද්ගමනය නමුත් රාත්‍රිය ගෙවුණු කල්හි, පශ්චිම යාමය නික්ම ගිය කල්හි ද සිදු වන බව ත්‍රිපිටකයෙහි නොයෙක් තැන්වල පෙනේ. උදහරණයක් නම්:

| | |
|---|---|
| "ආයස්මා ආනන්දෙ...භගවන්තං එතදවොච: 'අභික්ඛන්තා, භන්තෙ, රත්ති. නික්ඛන්තො පච්ඡිමො යාමො. උද්ධස්තං අරුණං, නන්දි-මුඛී රත්ති." | "ආයුෂ්මත් ආනන්ද තෙරුන් වහන්සේ... භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ කීය: "ස්වාමිනි, රාත්‍රිය ගෙවී ගියා, **පශ්චිම යාමය නික්ම ගියා, අරුණ නැග්ගේය,** (උද්ධස්තං අරුණං), රාත්‍රිය සතුටුදයක පෙනුමක් ඇත්තේය." (චු.ව.ii.424; අං.නි.v.94; උද.228) යනුයි. |
| ඉධ "උද්ධස්තං අරුණන්'ති: අරුණුග්ගම-නන්'ති අත්ථො." | මෙහි "**උද්ධස්තං අරුණං** යනු අරුණෝද්-ගමනය (අරුණුග්ගමනං) යන අර්ථයයි." (සා.දී.ටී.3.426; අං.නි.ටී.3.231) |

## ii) අරුණෝද්ගමනය හා ඇවැතක් ඇති බව

| | |
|---|---|
| 1. "සහ අරුණුග්ගමනා [චීවරං] නිස්ස-ග්ගියං හොති." | 1. "**අරුණෝද්ගමනය සමග** (සහ අරුණු-ග්ගමනා) සිවුර නිසැඟි වෙයි." (පාරා.506) |
| 2. "එකාදසෙ අරුණුග්ගමනෙ [චීවරං] නිස්සග්ගියං හොති." | 2. "එකොළොස්වැනි **අරුණෝද්ගමනයේදී** (අරුණුග්ගමනෙ) සිවුර නිසැඟි වෙයි." (පාරා.500) |
| 3. "එකතිංසෙ අරුණුග්ගමනෙ [චීවරං] නිස්සග්ගියං හොති." | 3. "එක්තිස්වැනි **අරුණෝද්ගමනයේදී** (අරුණුග්ගමනෙ) සිවුර නිසැඟි වෙයි." (පාරා.516) |
| 4. "එකාදසෙ අරුණුග්ගමනෙ [පත්තො] නිස්සග්ගියො හොති." | 4. "එකොළොස්වැනි **අරුණෝද්ගමනයේදී** (අරුණුග්ගමනෙ) පාත්‍රය නිසැඟි වෙයි." (පාරා.594) |
| 5. "අට්ඨමෙ අරුණුග්ගමනෙ [භෙසජ්ජං] නිස්සග්ගියං හොති." | 5. "අටවැනි **අරුණෝද්ගමනයේදී** (අරුණු-ග්ගමනෙ) බෙහෙත නිසැඟි වෙයි." (පාරා.610) |
| 6. "විකාලො නාම: මජ්ඣන්තිකෙ වීතිවත්-තෙ යාව අරුණුග්ගමනා. විකාලෙ කාලසඤ්ඤී ...භුඤ්ජති ආපත්ති පාචිත්තියස්ස." | 6. "විකාලය නම්: මධ්‍යාහ්නය ඉක්ම ගිය කල්හි සිට **අරුණෝද්ගමනය** වන තුරු. විකාලයෙහි කාලසංඥා ඇතියේ...බුදී නම් පචිති ඇවැතක් වේ." (පාචි.i.238) |
| 7. "උද්ධස්තෙ අරුණෙ ඡන්නා හොති ආපත්ති." | 7. "**අරුණ නැගී කල්හි** (උද්ධස්තෙ අරුණෙ) ඇවැත වැසුනේ වේ." (චූ.ව.i.316) |

ඉධ "උද්ධස්තෙ අරුණෙ'ති: අරුණුග්ග-මනෙ.-උග්ගතෙ අරුණසීසෙ'ති අත්ථො."

මෙහි "උද්ධස්තෙ අරුණෙ යනු: අරුණෝද්ගමනයේදී; අරුණේ ශීර්ෂය නැගී කල්හිය (උග්ගතෙ අරුණසීසෙ) යන අර්ථයයි."

(සා.දී.ටී.3.426; අං.නි.ටී.3.231 - සා.දී.ටී.3.340, 3.383, 3.426; අං.නි.අ.762)

"උග්ගමන්'ති: උද්ධං ගමනං."

"උද්ගමනය යනු: උඩට නැගී යාමය." (අභි.ප.සූ.52)

එවං 'අරුණුග්ගමන්'ති: අරුණස්ස උද්ධං ගමනන්'ති අත්ථො.

මෙසේ 'අරුණෝද්ගමනය යනු: අරුණ [රතු-පාට] උඩට නැගී යාමය යන අර්ථයයි.

## 2. අරුණෝද්ගමන විනිශ්චය

ඉදින් විනය පිටකයේ 'අරුණෝද්ගමනය' සැළකිල්ලට භාජන වේ නම්,

- අරුණෝද්ගමනය හඳුනාගන්නේ කෙසේද?
- අරුණෝද්ගමනය රැස් භේදයන් අතර මඳ රතුපාටද? නොහොත් වැඩීගෙන එන තද රතුපාට හෝ ලේ පාටද?
- අරුණෝද්ගමනය සිදු වූ කල්හි විශේෂ නිමිති හා ලකුණු කුමක්ද?
- අරුණෝද්ගමනයෙහිදී සිදු වෙන්නේ කුමක්ද? යනු පෙළ අටුවා ටීකාවෙන් විස්තර සහිත සාධක කරුණු හා සාක්ෂි ඊළඟ පරිච්ඡේදයේ සඳහන් වේ.

## 3. අරුණෝද්ගමනයට සමානාර්ථ වාචන

පෙළ අටුවා හා ටීකාවෙහි අරුණෝද්ගමනයට සමානාර්ථ වාචන කීපයක් පෙනේ. ඒවා මතු පරිච්ඡේදයන්හි පුනරුක්ත වන බැවින් මෙහි සටහන් කරන්ට වටී. එනම්:

1. "අරුණුග්ගන්'ති = අරුණුග්ගමනන්'ති අත්ථො." (සං.නි.v.50; වින.වි.ටී.2.471)
2. "අරුණොදයන්'ති = අරුණුග්ගමනවෙලායං." (ජා.අ.vii.500; නම.ටී.49)
3. "උද්ධස්තං අරුණන්'ති = අරුණුග්ගමනං" (සා.දී.ටී.3.426; අං.නි.ටී.3.231)
   "උද්ධස්තෙ අරණෙ'ති = උග්ගතෙ අරුණෙ." (උද.228; උද.අ.168)
   "උද්ධස්තෙ අරුණෙ'ති = උග්ගතෙ අරණසීසෙ." (සා.දී.ටී.3.340; අං.නි.අ.762)
   "උද්ධස්තෙ අරුණෙ'ති = උට්ඨිතෙ අරුණෙ." (සා.දී.ටී.3.371)
4. "උට්ඨිතෙ අරුණෙ'ති = අරුණුග්ගමනෙ'ති අත්ථො." (සා.දී.ටී.3.371; වින.වි.ටී.1.246)
5. "වුට්ඨිතෙ අරුණෙ'ති = ව-කාරාගමො+උට්ඨිතෙ."අරුණුග්ගමනෙ'ති අත්ථො."(වින.වි.ටී.1.246)

මෙහි 'උද්ධස්තෙ/උග්ගතෙ අරුණෙ', 'උට්ඨිතෙ/වුට්ඨිතෙ අරණෙ ' යනු අරුණ නැගී කල්හි, අරුණ නැගී සිටි කල්හි, එනම් අරුණෝද්ගමනය සිදු වූ කල්හි යන සිංහල තේරුම යි.

## තෙවැනි පරිච්ඡේදය

# අරුණෝද්ගමනයෙහිදී සිදු වන දේ

1. අරුණුග්ගතසමයෙ චතුදිසානං ඔදත-භාවො ච රත්තියා නන්දිමුඛීභාවො ච

1. අරුණෝද්ගමනය සිදු වූ කල්හි සිවු දිසා සුදුපාට වන බව හා රාත්‍රිය සතුටුදයක පෙනුමක් ඇති බව

විනයාලංකාර ටීකාවෙහි මෙසේ විස්තර වේ:-

"අරුණුග්ගතසමයෙ පුරත්ථිමදිසාය රත්තවණ්ණත්තා වුත්තා. තස්මා තස්මිං සමයෙ **අරුණස්ස උට්ඨිතත්තා**,

[i] පුරත්ථිමාය දිසාය රත්තභාහො,

[ii] සූරියාලොකස්ස පත්ථටත්තා සෙසදිසානං ඔදත-භාවො විඤ්ඤායති."

"අරුණෝද්ගමනය සිදු වූ කල්හි නැගෙනහිර දිසාවේ රතුපාට බව කියන ලදි. එහෙයින් එකල්හි **අරුණ නැගී සිටි** බැවින්,

[i] නැගෙනහිර දිසාවේ රතුපාට කොටස ද,

[ii] සූර්‍යාලෝකය පැතුරුන බැවින් **සෙසු දිසාවන්හි සුදු (ඔදත) පාට බව** ද දක්නා ලැබේ." (වින.අ.ටී.1.0022 ; අභි.ප.සූ.26)

වුත්තඤ්හෙතං විනයසුත්තපිටකෙසු :-

විනය හා සූත්‍ර පිටකයන්හි වනාහි එය මෙසේ කියන ලදි:

"තතියම්පි ඛො ආයස්මා ආනන්දෙ අභික්කන්තාය රත්තියා[1],

[1] **නික්ඛන්තෙ පච්ඡිමෙ යාමෙ,**

[2] **උද්ධස්තෙ අරුණෙ,**

[3] **නන්දිමුඛියා රත්තියා**

"තෙවනුව ද ආයුෂ්මත් ආනන්ද තෙරුන් වහන්සේ රාත්‍රිය ගෙවුණු කල්හි ,

[1] **පශ්චිම යාමය නික්ම ගිය කල්හි,**

[2] **අරුණ නැගි කල්හි** *(උද්ධස්තෙ අරුණෙ)*

[3] **රාත්‍රිය සතුටුදයක පෙනුමක් ඇති වූ කල්හි** *(නන්දිමුඛියා රත්තියා)*

...භගවන්තං එතදවොච: 'අභික්කන්තා, භන්තෙ, රත්ති, නික්ඛන්තො පච්ඡිමො යාමො, උද්ධස්තං අරුණං, නන්දිමුඛී රත්ති,... උද්දිසතු ...භගවා... පාතිමොක්ඛන්'ති."[2]

...භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ කීය: "ස්වාමීනි, රාත්‍රිය ගෙවී ගියා, පශ්චිම යාමය නික්ම ගියා, අරුණ නැග්ගේය, රාත්‍රිය සතුටුදයක පෙනුමක් ඇත්තේය,... භාග්‍යවතුන් වහන්සේ... පාමොක් උදෙසන සේක්වා" යි.[1]
(චූ.ව.ii.424; අං.නි.v.94; උද.228)

---

1. "අරුණෝද්ගමනය පැමිණි නමුත්, ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගෙන් පාමොක් උදෙසන්ට ඉල්ලුවේ, ඒ කාලයේ "මහණෙනි, පෝය නොවන දිනයේ පෝය නොකළ යුතු යැ'යි යන මේ ශික්ෂාපදය නො පණවන ලදි බැවිනි. - මෙහි, 'පාමොක්' යනු ඔවාද ප්‍රාතිමෝක්ෂය උදෙසන සේක්වා'යි යන අර්ථයයි." *(අරුණුග්ගමනං පත්වා'පි ථෙරො භගවන්තං පාතිමොක්ඛුද්දෙසං යාචි, තස්මිං කාලෙ 'න, භික්ඛවෙ, අනුපොසථෙ උපොසථො කාතබ්බො'ති [ම.ව.340], සික්ඛාපදස්ස අපඤ්ඤත්තත්තා. එත්ථ, 'පාතිමොක්ඛන්'ති ඔවාදපාතිමොක්ඛං උද්දිසතූ'ති.)"* (සා.දී.ටී.3.426 ; අං.නි.ටී.3.231 ; උද.අ.198)

ඉමස්ස පාළිපාඨස්ස අත්ථවණ්ණනායං:-

[1] "**නික්ඛන්තෙ පච්ඡිමෙ යාමෙ**'ති: නිග්ගතෙ, අපගතෙ පච්ඡිමෙ යාමෙ'ති අත්ථො."

[2] "**උද්ධස්තෙ අරුණෙ**'ති: අරුණුග්ගමනෙ/ උට්ඨිතෙ අරුණෙ/උග්ගතෙ අරුණසීසෙ'ති අත්ථො."

[3] **නන්දිමුඛියා රත්තියා**'ති: ඔදත-දිසාමුඛතාය, තුට්ඨි-මුඛියා./පසන්න-දිසාමුඛියා'ති අත්ථො."

යන මේ පෙළ පාඨයෙහි අර්ථ වර්ණනාවේ:-

[1] "**පශ්චිම යාමය නික්ම ගිය කල්හි** යනු: පශ්චිම යාමය ඉක්ම ගිය කල්හි, ඉවත් වූ කල්හි යන අර්ථයයි." (උද.අ.124)

[2] "**අරුණ නැගී කල්හි** *(උද්ධස්තෙ අරුණෙ)* යනු: අරුණෝද්ගමනයෙහිදී *(අරුණුග්ගමනෙ)*/අරුණ නැගී සිටි කල්හිය *(උට්ඨිතෙ අරුණෙ)*./අරුණේ ශීර්ෂය නැගී කල්හිය *(උග්ගතෙ අරුණසීසෙ)* යන අර්ථයයි."

(සා.දී.ටී.3.426; අං.නි.ටී.3.231/සා.දී.ටී. 3.371/සා.දී.ටී.3.340, 3.383, 3.426; අං.නි.අ.762)

[3] "**රාත්‍රිය සතුටුදයක පෙනුමක් ඇති වූ කල්හි** *(නන්දිමුඛියා)* යනු: දිසාවන් සුදු *(ඔදත)* පාටකින් පෙනෙන බැවින්, තුටුදයක පෙනුමක් ඇති වූ කල්හිය./ දිසාවන් පහන් *(පසන්න)* වූ පෙනුමක් ඇති වූ කල්හි යන අර්ථයයි."

(විම.වි.ටී.478/438; වින.අ.ටී.1.0022/1.0028)

තත්ථ:"අරුණුට්ඨිතකාලෙ ඔදත-දිසාමුඛතාය, නන්දි මුඛං එතිස්සං රත්තියන්'ති = නන්දිමුඛී රත්ති. තාය නන්දිමුඛියා රත්තියා. තෙන වුත්තං සමන්තපාසාදිකායං:-'අරුණුට්ඨිතකාලෙ'පි හි නන්දිමුඛා විය රත්ති ඛායතී'ති."

එහි : "අරුණ නැගී සිටි කල්හි දිසාවන් සුදු *(ඔදත)* පාටකින් පෙනෙන බැවින්, ඒ රාත්‍රියට සතුටුදයක පෙනුමක් අත්තේ නුයි = සතුටුදයක පෙනුමක් වූ රාත්‍රියයි *(නන්දිමුඛී රත්ති)* යනු වේ. ඒ රාත්‍රිය සතුටුදයක පෙනුමක් ඇති වූ කල්හිය යනුයි. එබැවින් සමන්තපාසාදිකා අටුවාවෙහි [948 පි./3 අධෝලිපියේ] මෙය මෙසේ කියන ලදි:- "අරුණ නැගී සිටි කල්හි වනාහි රාත්‍රිය සතුටුදයක පෙනුමක් ඇති මෙන් වැටහේයි."[3] (පා.යො.පා.530)

"දිසා-මුඛා'ති: චතු-දිසා-මුඛා."

"**දිසාවන් පෙනෙන** *(දිසා-මුඛා)* යනු: සිවු දිසාවන් පෙනෙන *(චතු-දිසා-මුඛා)*" යනුයි." (සං.නි.අ.ii.253)

තස්මා නික්ඛන්තෙ පච්ඡිමෙ යාමෙ, අරුණස්ස උට්ඨිතත්තා,

(i) පුරත්ථිමාය දිසාය හෙට්ඨාභාගෙ රත්තභාවො,

එබැවින් පශ්චිම යාමය නික්ම ගිය කල්හි, අරුණ නැගී සිටි බැවින්,

(i) නැගෙනහිර දිසාවේ **පහළ** කොටසේ රතුපාට බව ද,

---

3. "පීතිමුඛා විය රත්ති ඛායති (රාත්‍රිය ප්‍රීතිමත් පෙනුමක් ඇති මෙන් වැටහේයි)" යන වින.අ.ටී. 1.0029 හි සටහන් වේ.

(ii) සෙස-(පුරත්ථිමා-දක්ඛිණා-පච්ඡිම-උත්තරා) චතුදිසානං ඔදාතභාවො ච, පසන්නභාවො ච, නන්දිමුඛීභාවො ච, තුට්ඨිමුඛීභාවො ච, පීතිමුඛීභාවො ච පඤ්ඤායතී'ති දට්ඨබ්බං.

ඉදං පන කාරණං පරතො සුපාකටං භවිස්සති.

එවං,

"අරුණුග්ගතකාලෙ අරුණොභාසෙන ඔදාත-දිසා-මුඛ-භාවො වුත්තො."

(ii) සෙසු (නැගෙනහිර-දකුණ-බටහිර-උතුර) සිවු දිසාවන්හි සුදුපාට බව ද, පහන් බව ද, සතුටුදායක, තුටුදායක පෙනුමක් ඇති බව ද, ප්‍රීතිමත් පෙනුමක් ඇති බව ද දක්නා ලැබේ යැයි දත යුතු.

මේ කාරණය වනාහි පසුවට ඉතා ප්‍රකට වන්නේය.

මෙසේ,

"අරුණෝද්ගමනය සිදු වූ කල්හි අරුණු එළිය හේතු කොට ගෙන දිසාවන් සුදුපාටකින් පෙනෙන බව කියන ලදි."

(වින.අ.ටී.1.0022 ; අභි.ප.සූ.26)

**2. අරුණුග්ගතසමයෙ රත්තියා විභාතමානභාවො**

අරුණුග්ගතසමයෙ,

(i) රත්ති නන්දිමුඛතාය,
(ii) ඔදාත-දිසා-මුඛතාය,
රත්ති විභායති.

වුත්තඤ්හෙතං උදානට්ඨකථායං:-

"**නන්දිමුඛියා රත්තියා**'ති: අරුණස්ස උග්ගතත්තා එව අරුණප්පභාය සූරියාලොකූපජීවිනො සත්තෙ නන්දාපනමුඛියා විය රත්තියා ජාතාය; **විභාතමානායා**'ති අත්ථො."

**2. අරුණෝද්ගමනය සිදු වූ කල්හි රාත්‍රිය එළි වන බව.**

අරුණෝද්ගමනය සිදු වූ කල්හි

(i) රාත්‍රිය සතුටුදායක පෙනුමක් ඇති බැවින්,
(ii) දිසාවන් සුදුපාටකින් පෙනෙන බැවින්,
රාත්‍රිය එළි වේ.

උදාන අටුවාවෙහි මෙය මෙසේ කියන ලදි:

රාත්‍රිය "**සතුටුදායක පෙනුමක් ඇති වූ කල්හි** (*නන්දිමුඛියා රත්තියා*) යනු: අරුණෝද්ගමනය සිදු වූ කල්හි අරුණ ප්‍රභාවෙන් සූර්‍ය්‍යාලෝකය නිසා ජීවත් වන සත්වයන් සතුටු කරවන පෙනුමක් ඇති මෙන් හටගත් රාත්‍රියයි; [**රාත්‍රිය**] **එළි වූ කල්හි** (*විභාතමානාය*) යන අර්ථයයි." (උද.අ.124)

තත්ථ '**වි-භාත-මානායා**'ති: **වි** පුබ්බො + **භා** ධාතුයා දිත්තියං, සජ්ජිතං කිතකපදං.

"**භාති**: දිසා භන්ති විරොචමානා; රත්ති විභාති."

**දිසා භන්තී**'ති: සබ්බා දිසා විගතන්ධකාරා පඤ්ඤායන්ති."

එහි '**වි-භාත-මානාය**' (එළි වූ කල්හි) යනු: **වි** පූර්ව+ **භා** දීප්තිමත් වීමෙහි යන ධාතුවෙන් සැදුන කිතක පදයකි. (කච.ධා.ම.)

**උදාහරණ:**

"**භාති** (එළිවෙයි) : බබළන්නා වූ දිසා එළිවේ. (*දිසා භන්ති විරොචමානා*); **රත්ති විභාති** රාත්‍රිය එළි වේ." (නිරු.දී.389)

"**දිසා එළිවේ** (*දිසා භන්ති*) යනු: සියලු (*සබ්බා*) දිසා පහවූ අඳුර ඇතිව පෙනේ."

(විම.වි.ටී.-වෙරඤ්ජකණ්ඩය)

"විභාතී'ති : සොභති, දිබ්බති, විසෙසෙන පභාති."

"[රාත්‍රිය] එළිවේ (විභාති) යනු:හොබී, දීප්තිමත් වේ, විශේෂයෙන් ප්‍රභාමත් වේ." (සුබෝ.අ.ටී.4-පරිච්ඡේදය)

රාත්‍රිය එළි නොවේ නම් අඳුර පවතී. එය මෙසේ කියන ලදි:-

"රත්ති න විභායති. අන්ධකාරෝ ජාතො."

"රාත්‍රිය එළි නොවේ (රත්ති න විභායති). අඳුරක් විය." (සු.නි.අ.131)

යනුවෙන් හා ධාතුවෙන් සැදෙන පද බබළන ගතියක්, එළි වන ගතියක්, අඳුර නැති ගතියක්, හොබන ගතියක්, දීප්තිමත් ගතියක් හා විශේෂයත් පභාමත් ගතියක් ප්‍රකාශ කරයි.

**සංලක්ෂ්‍යය**:- මෙහි, සාමාන්‍ය වශයෙන් කියතොත්, **සත්වයෝ** කොටස් දෙකට බෙදේ. එනම්:
(i) දවාල් කාලයෙහි ආලෝකය (එළිය) නිසා ක්‍රියාත්මක වන හා සතුටු වන සත්වයෝ ද,
(ii) රාත්‍රි (අඳුර) කාලයෙහි උන්ගේ රාත්‍රි දෘෂ්ටිය නිසා ක්‍රියාත්මක වන සත්වයෝ ද යනුයි.

මනුෂ්‍යයෝ, වඳුරෝ, බහුතර වූ කුරුල්ලෝ ආදී සත්වයෝ පළමු කොටසට අයිතියි. විශේෂයෙන්ම කුරුල්ලෝ, **එළි වන වේලාවේම**, තම කැදැලිවලින් ඉගිළ, එකවර සතුටු නාදය කරන බව සුප්‍රසිද්ධයයි. මෙය *'අරුණ අනුගායනාව'* යැ'යි කියනු ලැබේ. පුරාණ කාලය සිට අරුණ ප්‍රභාවෙන් නොහොත් අරුණාලෝකයෙන් ලැබෙන සතුටුදායක ගුණ, සිංහල විශ්වකෝෂයෙහි මෙසේ සඳහන් වේ :

"වේදකාලයේදී අරුණාලෝකය '**උෂස්**' නමින් මූර්තිමත් වුණා. උෂස් තෝමෝ අරුණෝදය පිළිබඳ දෙවඟනයි. ඕ පැමිණෙන කල මිනිසුන් හා සතුන් පණ ගන්වා පුබුදුවයි. එකල කුරුල්ලෝ තම කැදැලිවලින් ඉගිලෙති. ඕ මාර්ග ආලෝක කරයි. හරකුන් තම ගාල විවෘත කරන්නාක් මෙන් ඕ අඳුරෙහි දොරටුව විවෘත කරයි."[1] (සිං.වි.කෝ.-'අරුණ' හා 'උෂස්')

එබැවින් උදාන අටුවාවෙහි ද:"**රාත්‍රිය සතුටුදායක පෙනුමක් ඇති වූ කල්හි** යනු: අරුණෝද්ගමනය සිදු වූ කල්හි අරුණ ප්‍රභාවෙන් සූර්‍යාලෝකය නිසා ජීවත්වන සත්වයන් සතුටු කරවන පෙනුමක් ඇති මෙන් හටගත් රාත්‍රියයි; රාත්‍රිය එළි වූ කල්හි යන අර්ථයයි" කියන ලදි.

---

1. දෙවැනි පරිච්ඡේදයෙහි සඳහන් කළ 'පච්චූස' යන මේ පාළි වචනය **පති** පූර්ව+ඌස ධාතුවෙන් සැදුන පදයකි. (අභි.ප.සූ.212) **උෂස්** නම්: "ආර්යයන් ඇදහූ අරුණෝදයට අධිපති දෙවඟන, උද දෙවිය." (ප්‍ර.සිං.ශ.) එබැවින් '**පච්චූස**' (පති+ඌස) යන පදයෙහි තේරුම: 'අරුණෝදයට (උෂස්ට) පෙර (පති) කාලයයි. '**පච්චූස**' යන මේ කාලය රාත්‍රියේ අඳුරෙහි පශ්චිම යාමයෙහි අරුණෝදයට පෙරම සිදුවන කාලය ඉහත කියන ලදි. මෙසේ ත්‍රිපිටක පෙළ අටුවා ටීක අනුවත් අරුණෝදය (=අරුණෝද්ගමනය) සිදු වෙන්නේ පශ්චිම යාමය ඉක්ම ගිය කල්හි, රාත්‍රිය එළි වූ කල්හි, සිවු දිසාවන්හි සුදුපාට බව ද පහන් බව ද සතුටුදායක පෙනුමක් ඇති බව ද දක්නා ලැබෙන කල්හිය.

### 3. විභාතමානාය රත්තියා අරුණුග්ගතභාවො

### 3. රාත්‍රිය එළි වූ කල්හි අරුණෝද්ගමනය සිදු වන බව

රාත්‍රිය එළි වූ කල්හි අරුණෝද්ගමනය සිදු වන බව ගැන නොයෙක් නිදර්ශන දැක්විය හැකි නමුත් මෙහි උදහරණ වශයෙන් කීප පමණක් දක්වනු ලැබේ.

- පඨමං නිදස්සනං -

සසපණ්ඩිතචරියං:

"**විභාතාය රත්තියා අරුණුග්ගමනවෙලායමෙව** උපොසථම්හි දිවසෙ පණ්ණරසෙ එතෙසං මක්කටාදීනං මය්හං සහායානං...'දනාදීනි පටියාදෙථා'ති ආදිනා ...පටිපත්තිවිධානං ආචික්ඛින්'ති."

- පළමුවැනි නිදර්ශනය -

සස පණ්ඩිතයාගේ චය්‍යාව :

"**රාත්‍රිය එළි වූ කල්හි** (*විභාතාය රත්තියා*) **අරුණෝද්ගමන වේලාවේම** (*අරුණුග්ගමනවෙලායමෙව*) පසළොස්වක පෝය දිනයේදී ඒ වඳුරා ආදී මාගේ යාලුවන්ට... 'දන ආදිය පිළියෙල කරව් යැ'යි යනාදි නයින් ... ප්‍රතිපත්ති පිළිවෙල කීම් යි.' (ච.පි.අ.85)

- දුතියං නිදස්සනං -

උදෙනස්ස උප්පත්ති :

"අථස්සා [රාජමහෙසියා] සුරියත්ථඞ්ගමනකාලෙ කම්මජවාතා චලිංසු. සබ්බදිසාසු ගච්ඡන්තො මහාමෙඝො උට්ඨහි. සුඛෙධිතාය රාජමහෙසියා...**සබ්බරත්තිං** නිද්ද නාම නාහොසි. **විභාතමානාය පන රත්තියා**, වලාහකවිගමො ච **අරුණුග්ගමනඤ්ච** තස්සා ගබ්භවුට්ඨානඤ්ච **එකක්ඛණෙ යෙව** අහොසි. සා මෙඝ-උතුඤ්ච, පබ්බත-උතුඤ්ච, අරුණ-උතුඤ්ච ගහෙත්වා ජාතත්තා පුත්තස්ස 'උදෙනො'ති නාමමකාසී'ති.

- දෙවැනි නිදර්ශනය -

උදෙන රජුගේ උත්පත්තිය :

"ඉක්බිති [රජමෙහෙසියට] ඉර බහින වේලාවේ විළිරුදව හටගත්තේය. සියලු දිසාවන්ට යන්නා වූ මහ වැහි වලාකුළක් වහින්ට පටන්ගත්තේය. සුවසේ වැඩුනු හැදුනු රජ මෙහෙසියට...**මුළු රාත්‍රියෙහි** (*සබ්බරත්තිං*) නින්දෙක් නොවීය. **රාත්‍රිය එළි වූ කල්හි වනාහි** (*විභාතමානාය පන රත්තියා*), වළාකුලු ඉවත්වීම ද **අරුණෝද්ගමනය ද** (*අරුණුග්ගමනඤ්ච*), ඇගේ දරුවා බිහිවීම ද **එකවරම** (*එකක්ඛණෙ යෙව*) සිදු විය. ඇය මහ වැහි වළාකුල ඍතු ද, ගැබ්බරින් සැහැල්ලු ඍතු ද, අරුණු ඍතු ද යන සලකාගෙන පුතා උපන් බැවින්, ඒ පුතාට 'උදෙන' යි නම් තැබුවාය." (ධ.අ.83)

- තතියං නිදස්සනං -

මහාවෙස්සන්තරජාතකෙ මද්දීදෙවියා වත්ථු:

"**අථ රත්ති විභායි, අරුණොදයො** ජාතො. සා පුන ගන්ත්වා මහාසත්තස්ස සන්තිකෙ

- තෙවැනි නිදර්ශනය -

මහාවෙස්සන්තර ජාතකයෙහි මද්දී මෙහෙසියගේ කථාව :

"**ඉක්බිති රාත්‍රිය එළි විය** (*රත්ති විභායි*), **අරුණෝදය ඇති විය** (*අරුණොදයො*

යීතා පරිදෙවි."

ජාතො). ඕ නැවත ගොස් බෝසතාණන් වහන්සේගේ සමීපයෙහි සිට හැඬුවාය." (ජා.අ.vii. 500)

තත්ථ, "**අරුණොදයො**'ති: අරුණ-උදයො'ති පදච්ඡෙදෙ. අරුණුග්ගමනවෙලායන්'ති අත්ථො."

එහි, "**අරුණෝදය** යනු: අරුණ හා උදය (උදවීම, නැගීම) යන පද කැඩීම සිදු වේ. **අරුණෝද්ගමන වේලාවේ** (*අරුණුග්ගමනවෙලායං*) යන අර්ථයයි." (නම.ටී.49)

\- චතුත්ථං නිදස්සනං -

"අථ බො මිලින්දෙ රාජා **පභාතාය රත්තියා, උග්ගතෙ අරුණෙ** සීසං නහාත්වා, ...අතීතානාගතපච්චුප්පන්නෙ සම්මාසම්බුද්ධෙ අනුස්සරිත්වා, අට්ඨවතපදනි සමාදියි."

\- සිවුවැනි නිදර්ශනය -

"ඉක්බිති මිලිඳු රජ තෙමේ **රාත්‍රිය එළි වූ කල්හි** (*පභාතාය රත්තියා*) **අරුණ නැගි කල්හි** (*උග්ගතෙ අරුණෙ*) ඉස් සෝද, නහාපියා... අතීතානාගත වර්තමාන වූ සියලුම සර්වඥවරයන් සිහි කොට අෂ්ටව්‍රතපද සමාදන් වූහ." (මිලි.ප.87)

එත්ථ '**ප-භා-තායා**'ති: ප පුබ්බො + භා ධාතුයා දිත්තියං සජ්ජිතං කිතකපදං. (කච්.ධ.ම.) '**විභාතමානාය, විභාතායා**'ති කිතකපදනං එතං වෙවචනං.

මෙහි '**ප-භා-තාය**' (එළි වූ කල්හි) යනු: ප පූර්ව + භා දීප්තිමත් වීමෙහි යන ධාතුවෙන් සෑදුන කිතක පදයකි. (කච්.ධ.ම.) '**විභාතමානාය, විභාතාය**' යන කිතක පදයන්ට මෙය සමානාර්ථ පදයකි.

\- පඤ්චමං නිදස්සනං -

ථෙරිගාථාට්ඨකථායං පටාචාරත්ථෙරියා වත්ථු :

\- පස්වැනි නිදර්ශනය -

ථෙරිගාථා අටුවාවෙහි පටාචාර තේරියගේ කථාව. පටාචාරාව ඇගේ හිමියා සොයාගන්ට පිටත් වේ:

"සා...[මග්ගෙ] රත්තිං විතිනාමෙත්වා **විභාතාය රත්තියා** මංසපෙසිවණ්ණං එකං පුත්තං පිළොතිකචුම්බටකෙ නිපජ්ජාපෙත්වා හත්ථෙහි, උරෙහි ච පරිග්ගහෙත්වා, ඉතරං 'එහි, තාත. පිතා තෙ ඉතො ගතො'ති වත්වා, සාමිකෙන ගතමග්ගෙන ගච්ඡන්තී, තං වම්මිකසමීපෙ කාලකතං නිසින්නං දිස්වා ... පරිදෙවන්තී ..."

"ඇය...[පාරේ] රාත්‍රිය ගත කොට, **රාත්‍රිය එළි වූ කල්හි** (*විභාතාය රත්තියා*) මස් පිඩුවක් වැනි එක් පුතෙකු රෙදි. දරණුවෙහි හොවා, අතින් හා ළයෙන් ගෙන, අනිත් පුතාට 'එන්න, දරුව. ඔබගේ පියා මෙතැනින් ගියේ යැ'යි කියා හිමියා ගිය මගින් යන්නී තුඹස සමීපයෙහි මැරී වැටී සිටි ඔහු **දැක** (*දිස්වා*)...හඬමින්... " (ථෙරී.අ.87)

ධම්මපදට්ඨකථාවසෙන පටාචාරා **වුට්ඨිතෙ අරුණෙ** යෙව සාමිකං පරියෙසිතුං අගච්ඡි. අයං කාලො **විභාතරත්තිකාලෙන** සද්ධිං සමෙති. වුච්චති හි ධම්මපදට්ඨකථායං :

ධම්මපද අටුවාව අනුව පටාචාරාව හිමියා සොයාගන්ට පිටත් වූයේ **අරුණ නැගී සිටි කල්හිම** (*වුට්ඨිතෙ අරුණෙ*). මේම වේලාව **රාත්‍රිය එළි වන වේලාව** (*විභාතරත්ති*) හා

ගැලපේ. මේ කාරණය ධම්මපද අටුවාවෙහි මෙසේ සටහන් වේ ඃ

"සා...[මග්ගෙ] රත්තිං වීතිනාමෙසි... **වුට්ඨිතෙ අරුණෙ** මංසපෙසිවණ්ණං එකං පුත්තං අඞ්කෙනාදය, එකං අඞ්ගුලියා ගහෙත්වා 'එහි, තාත. පිතා තෙ ඉතො ගතො'ති වත්වා, සාමිකස්ස ගතමග්ගෙන ගච්ඡන්තී, තං වම්මිකමත්ථකෙ කාලං කත්වා පතිතං නීලවණ්ණං ථද්ධසරීරං දිස්වා ... පරිදෙවන්තී පායාසි."

"ඇය...[පාරේ] රාත්‍රිය ගත කළේය...**අරුණ නැගී සිටි කල්හි** (*වුට්ඨිතෙ අරුණෙ*) මස් පිඩුවක් වැනි එක් පුතෙකු ඇකයෙන් ගෙන, එක් පුතෙකු ඇඟිල්ලෙන් අල්ලාගෙන 'එන්න, දරුව. ඔබගේ පියා මෙතැනින් ගියේ යැ'යි කියා, හිමියා ගිය මගින් යන්නී තුඹස මත මැරී වැටී සිටි නිල්පාට දරදඬු වූ සිරුර ඇති ඔහු **දැක** (*දිස්වා*)... හඬමින් මග බැස ගියාය." (ධ.අ.336)

එත්ථ 'වුට්ඨිතෙ අරුණෙ'ති ඃ ව-කාරාගමො + උට්ඨිතෙ. "අරුණුග්ගමනෙ'ති අත්ථො."

මෙහි 'වුට්ඨිතෙ අරුණෙ' යනුඃ ව-කාරාගමය + උට්ඨිතෙ. "අරුණෝද්ගමනයෙහි යන අර්ථයයි." (වින.වි.ටී. 1.246)

පුන ච පරං, අංගුත්තරනිකායට්ඨකථාවසෙන පටාචාරා **ආලොකෙ සංජාතෙ** යෙව සාමිකං පරියෙසිතුං අගච්ඡි. අයඤ්ච කාලො **විභාතරත්තිකාලෙන** චෙව **වුට්ඨිත-අරුණ-කාලෙන** ච සමෙති. වුච්චති හි අංගුත්තරනිකායට්ඨකථායං ඃ

නැවත ද වනාහි අංගුත්තර නිකාය අටුවාව අනුව පටාචාරාව හිමියා සොයාගන්ට පිටත් වූයේ **ආලෝකය පහළ වූ කල්හිය** (*ආලොකෙ සංජාතෙ*). මේම වේලාව ද **රාත්‍රිය එළි වන වේලාව** (*විභාතරත්ති*) සමග ද **අරුණ නැගී සිටි වේලාව** (*වුට්ඨිත-අරුණ*) සමග ද ගැලපේ. මේ කාරණය අංගුත්තරනිකාය අටුවාවෙහි මෙසේ සටහන් වේ ඃ

"සා ...[මග්ගෙ] **සබ්බරත්තිං** ඛෙපෙත්වා... **ආලොකෙ සංජාතෙ** පදනුසාරෙන ඔලොකෙන්තී වම්මිකපාදෙ පතිතං දිස්වා... පරිදෙවිත්වා. ..."

"ඇය...[පාරේ] **මුළු රාත්‍රිය** (*සබ්බරත්තිං*) ගෙවා...**ආලෝකය පහළ වූ කල්හි** (*ආලොකෙ සංජාතෙ*) හිමියාගේ පියවර අනුව බලන්නී තුඹස පාමුළ වැටී සිටි ඔහු **දැක** (*දිස්වා*) හඬා... ." (අං.නි.අ.195)

**4. විභාතමානාරත්ති' හා 'අරුණුග්ගමන' යන පදයන්ගේ සමාන අදහස් ඇති බව**

මේ යට දැක්වූ නිදර්ශනවලින් පැහැදිලි වෙන්නේ '**විභාතමානාය රත්තියා**' කියා හෝ '**විභාතාය රත්තියා**' කියා හෝ '**රත්ති විභායි**' කියා හෝ '**පභාතාය රත්තියා**' කියා හෝ '**අරුණොදයො ජාතො**' කියා හෝ '**උග්ගතෙ අරුණෙ**' කියා හෝ '**වුට්ඨිතෙ අරුණෙ**' කියා හෝ '**ආලොකෙ සංජාතෙ**' කියා හෝ යනු එක වේලාවට, එක කාලයට, එකවිටම, **එකවරම** (*එකක්ඛණෙයෙව*) සිදු වන සිද්ධි. එනම්ඃ **අරුණෝද්ගමන වේලාවේම** (*අරුණුග්ගමනවෙලායමෙව*). මෙසේ අරුණෝද්ගමනය (*අරුණුග්ගමන*) සිදු වෙන්නේ (i) මුළු රාත්‍රිය (*සබ්බරත්ති*) ගෙවී, (ii) එළි වූ කල්හි (*විභාතමානාය රත්තියා*), නොහොත් ආලොකය පහළ වූ කල්හිය (*ආලොකෙ සංජාතෙ*). එහෙයින් මේ පද සියලුම සමාන අදහස් ඇත්තේය. මේ කාරණය තව තව පැහැදිලි වන්නේය.

**5. අරුණුග්ගතසමයෙ රූපානං දිස්සමානභාවො**

රත්තියා අදිස්සමානරූපානි පන අරුණුග්ගතසමයෙ,

(i) සූරියාලොකස්ස පත්ථටත්තා ච,
(ii) චතුදිසානං ඔදාතභාවො විඤ්ඤායතත්තා ච,
(iii) රත්තියා විභාතත්තා ච,
(iv) ආලොකසංජාතත්තා ච පාකටානි හොන්ති. එත්ථ තීණි නිදස්සනානි දස්සීයන්ති :

**5. අරුණෝද්ගමනය සිදු වූ කල්හි රූප පෙනෙන බව**

රාත්‍රියෙහි නොපෙනෙන රූප වනාහි අරුණෝද්ගමනය සිදු වූ කල්හි

(i) සූර්‍යයාලෝකය පැතුරුන බැවින් ද,
(ii) සිවු දිසාවන්හි සුදුපාට බව දක්නා ලැබෙන බැවින් ද
(iii) රාත්‍රිය එළි වූ බැවින් ද
(iv) ආලෝකය පහළ වූ බැවින් ද ඒ රූප ප්‍රකට වෙත්. මෙහි නිදර්ශන තුනක් දක්වනු ලැබේ.

- පඨමං නිදස්සනං -

භාණුකොණ්ඩඤ්ඤ-ථෙරස්ස වත්ථු :

"සාවත්ථියං අන්තරාමග්ගෙ...සො කිර ථෙරො එකස්මිං පිට්ඨිපාසාණෙ නිසින්නො ඣානං සමාපජ්ජි. අථෙකං ගාමං විලුම්පිත්වා පඤ්චසතා චොරා භණ්ඩිකං බන්ධිත්වා දූරං ගන්ත්වා : 'ඉමස්මිං පිට්ඨිපාසාණෙ විස්සමිස්සාමා'ති, පිට්ඨිපාසාණසන්තිකං ගන්ත්වා ථෙරං දිස්වා'පි : 'ඛාණුකො අයන්'ති සඤ්ඤිනො අහෙසුං. අථෙකො චොරො ථෙරස්ස සීසෙ භණ්ඩිකං ඨපෙසි. අපරො තං නිස්සාය භණ්ඩිකං ඨපෙසි. එවං පඤ්චහි සතෙහි ථෙරං පරික්ඛිපිත්වා සයම්පි නිසින්නා නිද්දායිත්වා **අරුණුග්ගමනකාලෙ** පබුජ්ඣිත්වා අත්තනො අත්තනො භණ්ඩිකානි ගණ්හන්තා **ථෙරං දිස්වා** : 'අමනුස්සො'ති සඤ්ඤාය පලායිතුං ආරභිංසු. ථෙරො ආහ : 'මා භායථ උපාසකා ! පබ්බජිතො අහන්'ති. ථෙරස්ස පාදමූලෙ නිපජ්ජිත්වා : 'ඛමථ භන්තෙ ! මයං ඛාණුකසඤ්ඤිනො අහුවම්හා'ති, ථෙරං ඛමාපෙසුං."

- පළමුවැනි නිදර්ශනය -

භාණු කොණ්ඩඤ්ඤ තෙරුන්ගේ කථාව :

"ඒ තෙරුන් වහන්සේ වනාහි සැවැත් නුවර අතර මග එක් ගල් තලාවක හුන්නේ ධ්‍යානයට සමවැදුනහ. ඉක්බිති පන්සියයක් සොරු එක් ගමක සොරකම් කොට බඩු පොදි බැඳ දුර ගොස් : 'මේ ගල් තලාවේ ගිමන් හරිමු යැ'යි [රාත්‍රියේ] ගල් තලාව වෙත ගොස් තෙරුන් දැක ද : 'මෙය කණුවකැ'යි සඤ්ඤා ඇත්තෝ වූහ. ඉක්බිති එක් සොරෙක් තෙරුන් හිස මත බඩු පොදියක් තැබීය. තවත් සොරෙක් උන්වහන්සේ අසළ බඩු පොදියක් තැබීය. මෙසේ බඩු පොදි පන්සියයෙන් තෙරුන් වහන්සේ වට කොට තමන් ද හිඳ නිදගෙන **අරුණෝද්ගමන කාලයෙහි** (*අරුණුග්ගමනකාලෙ*) පිබිද තම තමන්ගේ බඩු පොදි ගන්නාහු **තෙරුන් දැක** (*දිස්වා*): 'අමනුෂ්‍යයෙකැ'යි යන හැඟීමෙන් පලායන්නට පටන් ගත්හ. 'උපාසකයෙනි ! බිය නොවවු. මම පැවිද්දෙක්මි'යි තෙරුන්වහන්සේ කීහ. [හොරු පන්සියය] තෙරුන් පාමුල වැඳ හෙව : 'ස්වාමීනි, ක්ෂමාවනු මැනවි ! අපි කණුවක් ය යන සඤ්ඤා ඇත්තෝ වීමු යැ'යි තෙරුන් කමා කරවූහ." (ධ.අ.339)

- දුතියං නිදස්සනං -

සොසක-සෙට්ඨිනො උප්පත්ති :

"කොසම්බියං පඤ්චසකටසතානි පච්චූසකාලෙ උට්ඨාය වණිජ්ජාය ගච්ඡන්ති.[1] සා දසී තං දරකං නෙත්වා වක්කමග්ගෙ නිපජ්ජාපෙයි. තද සාකටිකජෙට්ඨකො පුරතො අහොසි. අථස්ස ගොණා තං ඨානං පත්වා, ධුරං ඡඩ්ඩෙසුං. පුනප්පුනං ආරොපෙත්වා පාජියමානාපි පුරතො න ගච්ඡිංසු. එවං තස්ස හි තෙහි සද්ධිං වායමන්තස්සෙව **අරුණං උට්ඨහි.** සො 'කිං නාමෙතං ගොණා කරිංසු' ති මග්ගං ඔලොකෙන්තො **දාරකං දිස්වා,** තුට්ඨ-මානසො තං ගෙහං නෙසි."

- දෙවැනි නිදර්ශනය -

සෝෂක සිටුගේ උපත :

"කොසඹෑ නුවර ගැල් පන්සියයක් ප්‍රත්‍යූෂ කාලයේ අවදිව වෙළඳම පිණිස යති.[1] ඒ දසිය ඒ දරුවා ගෙන ගොස් ගැල් රෝද මාර්ගයේ නිදි කරවූවාය. එකල්හි ගැල් නායක තෙමේ ඉදිරියෙන් [ගමන් ගත්තේ] විය. ඉක්බිති ඔහුගේ ගොන්නු ඒ තැනට පැමිණ, විය ගස අත් හළහ. නැවත නැවත විය බැඳ තබා පදවනු ලබන විට ද ඉදිරියට නොගියහ. මෙසේ ඒ ගොනුන් සමග ඔහු වෙහෙසෙද්දී **අරුණ නැගී සිටියේය** (අරුණං උට්ඨහි). හේ 'මේ ගොන්නු කුමක් කළාහු දැ'යි මාර්ගය දෙස බලනුයේ **දරුවා දැක** (දිස්වා) සතුටු සිතැත්තේ ඒ දරුවා ගෙදර ගෙන ගියේය." (ධ.අ.89)

- තතිය නිදස්සනං -

එලජාතකං :

"තෙ [ගාමවාසිනො] තං දිවසම්පි **අරුණුග්ගමනකාලෙයෙව** 'මය්හං බලිවද්ද භවිස්සන්ති, මයහං සකටං, මය්හං භණ්ඩන්'ති වෙගෙන තං රුක්ඛමූලං ගන්ත්වා මනුස්සෙ නිරොගෙ දිස්වා...පුච්ඡිංසු."

- තෙවැනි නිදර්ශනය -

එල ජාතකය:

"ඒ [ගම්වැසියෝ] ඒ දවසේත් **අරුණෝද්ගමන කාලයෙහිම** (*අරුණුග්ගමනකාලෙයෙව*) 'මම ගොනුන් ලබන්නෙමි, මම කරත්තයක්, මම බඩු යැ'යි සිතා, වේගයෙන් ඒ ගසේ මුලට ගොස්, **නිරෝගි මිනිස්සුන් දැක** (දිස්වා) ... ප්‍රශ්නයක් ඇසූහ." (ජා.අ.i.233)

### 6. විභාතාය රත්තියාපි රූපානං දිස්සමානභාවො

අරුණුග්ගතසමයෙ යථා, විභාතාය රත්තියා'පි රූපානි දිස්සන්ති යෙව. එත්ථ උදහරණවසෙන තීණි නිදස්සනානි දස්සීයන්ති:

### 6. රාත්‍රිය එළි වූ කල්හිත් රූප පෙනෙන බව

අරුණෝද්ගමනය සිදු වූ කල්හි රූප පෙනෙන මෙන්, රාත්‍රිය එළි වූ කල්හිත් (*විභාතාය රත්තියා*) එසේමය. උදහරණ වශයෙන් නිදර්ශන තුනක් මෙහි දක්වනු ලැබේ:

---

1. 'පච්චූස' (ප්‍රත්‍යූෂ) කාලය රාත්‍රියට අන්තර්ගත වන කාලය ඉහත කියන ලදි. රාත්‍රි කාලයේ ගොන්නු, බල්ලෝ, බළල්ලු, මීයෝ, වල් ඌරෝ, බකමූණෝ යනාදී සත්තු පාර ආදී අරමුණු දකින්ට සමත් වෙති. ගොනුන්ට පෙනෙන නිසා ඒ වෙළෙන්දන් රාත්‍රියේ අරුණෝද්ගමනයට පෙර (පච්චූසකාලෙ) ගැල් පන්සියයකින් නුවරින් පිටත් වූයේ එළිය වැටුණු පසු නුවර තුළ මාවත්වල මිනිස්සුන්, සතුන් ආදීන්ගෙන් ගැවසීගත්ව ගමනාගමනය අපහසු වන බැවිනි.

### - පඨමං නිදස්සනං -

කස්සකස්ස වත්ථු:

"චොරා [රත්තියං]... එකස්මිං අඩ්ඪකුලෙ උම්මග්ගං භින්දිත්වා බහුං හිරඤ්ඤසුවණ්ණං ගහෙත්වා උදකනිද්ධමනෙනෙව [නගරා] නික්ඛමිංසු. ... මනුස්සා'පි **විභාතාය රත්තියා** ගෙහෙ චොරෙහි **කතකම්මං දිස්වා**, පදානුපදං ගච්ඡන්තා [කස්සකස්ස] ඛෙත්තං ගන්ත්වා තත්ථ චොරෙහි භණ්ඩස්ස භාජිතට්ඨානං **දිස්වා**, කස්සකස්ස පදවලඤ්ජං **අද්දසංසු**. තෙ තස්ස [කස්සකස්ස] පදානුසාරෙන ගන්ත්වා ථවිකාය ඨපිතට්ඨානං **දිස්වා**..."

### - පළමුවැනි නිදර්ශනය -

එක්තරා ගොවියකුගේ කථාව :

"සොරු [රාත්‍රියේ]... එක් ධනවත් කුලයේ ගෙට උමගක් කැන, බොහෝ රන් පැහැර ගෙන, දිය සොරොව්වෙන්ම [නුවරින්] නික්ම ගියෝය. ... ගෙයි මිනිස්සු ද **රාත්‍රිය එළි වූ කල්හි** (*විභාතාය රත්තියා*) සොරුන් විසින් ගෙයි **කළ වැඩ දැක** (*දිස්වා*) සොරුන්ගේ **පියවරක් පියවරක්** අනුව යන්නෝ [ගොවියාගේ] කුඹුරට ගොස්, එහි සොරුන් විසින් **බඩු බෙදූ තැන දැක** (*දිස්වා*), ගොවියාගේ **පියවර සටහන් දැක්කාහ** (*අද්දසංසු*). ඔවුහු ඒ ගොවියාගේ පියවර අනුව ගොස් මුදල් පොදිය **තුබූ තැන දැක** (*දිස්වා*)..." (ධ.අ.232-3)

### - දුතියං නිදස්සනං -.

"විස්සකම්මදෙවපුත්තො...**රත්තිභාගෙන**... පොක්ඛරණියො මාපෙසි...'පඤ්චවණ්ණානි චෙත්ථ පදුමානි පුප්ඵන්තූ'ති අධිට්ඨාසි. එවං තා මාපෙත්වා...ගතො. තතො **විභාතාය රත්තියා** මහාජනො **දිස්වා**...ගන්ත්වා රඤ්ඤො ආරොචෙසි. රාජා මහාජනපරිවාරො ගන්ත්වා පොක්ඛරණියො **දිස්වා**...අත්තමනො අහොසි."

### - දෙවැනි නිදර්ශනය -

විශ්වකර්ම දේව පුත්‍රයා...**රාත්‍රිකාලයේ**... පොකුණු මැවූවේය. ... 'මෙහි දූ පියුම් වර්ග පහක් පිපේවා යැ'යි අධිෂ්ඨාන කළේය. මෙසේ ඒවා මවා...ගියේය. ඉක්බිති **රාත්‍රිය එළි වූ කල්හි** (*විභාතාය රත්තියා*) මහජනයා **ඒවා දැක** (*දිස්වා*) ... ගොස් රජුට දැනුම් දුන්නේය. මහජන පිරිවර ඇති රජ තෙමේ ගොස් **පොකුණු දැක** (*දිස්වා*)...සතුටු සිතැති විය. (අං.නි.අ.379)

### - තතියං නිදස්සනං -

ථූපවංසායං මරීචවට්ටිවිහාරකථා:

"අථ **විභාතාය රත්තියා** ගාමවාසිනො **සුවණ්ණබීජානි දිස්වා** ... පාතියං පූරෙත්වා ආගන්ත්වා රඤ්ඤො දස්සෙසුං."

### - තෙවැනි නිදර්ශනය -

ථූපවංසයෙහි මිරිස්වැටි විහාර ගැන කථාව:

"ඉක්බිති **රාත්‍රිය එළි වූ කල්හි** (*විභාතාය රත්තියා*) ගම්වැසියෝ **රන් ඇට දැක** (*දිස්වා*) ... තැටියක් පුරා ගෙන අවුත් රජුට දැක්වූහ." (ථූ.ව. මරීචවට්ටිවිහාරකථා)

**7. සකලරත්තියා අච්චයෙන අරුණුග්ගමනස්ස ච රත්තියා විභාතතාස්ස ච ආලොකස්ස සංජාතතාස්ස ච සිද්ධභාවො**

**7. මුළු රාත්‍රිය ඇවෑමෙන් අරුණෝද්ගමනය, රාත්‍රිය එළිවීම හා ආලෝකය පහළ වීම සිදුවන බව**

න හෙව කොට්ඨාසෙන, සකලරත්තියා අච්චයෙන එව අරුණුග්ගමනස්ස ච රත්තියා විභාතතාස්ස ච ආලොකස්ස සංජාතතාස්ස ච සිද්ධභාවස්ස නිදස්සනානි:

කොටසක් නොව, මුළු රාත්‍රිය ඇවෑමෙන්ම (i) අරුණෝද්ගමනය ද (ii) රාත්‍රිය එළි වීම ද (iii) ආලෝකය පහළ වීම ද සිදු වන බවට නිදර්ශන කීපයකි :

(i) **සකලරත්තියා අච්චයෙන අරුණුග්ගමනං**

(i) **මුළු රාත්‍රිය ඇවෑමෙන් අරුණෝද්ගමනය සිදුවීම**

- පඨමං නිදස්සනං -

- පළමුවැනි නිදර්ශනය -

මහාඋම්මග්ගජාතකෙ චූළනීරඤ්ඤො වත්ථු:

මහා උම්මග්ග ජාතකයෙහි චූළනී රජුගේ කථාව:

"අථ තස්සා **රත්තියා අච්චයෙන** චූළනීරාජා සෙනඞ්ගං විචාරයමානො තං නගරං උපාගමි. තමත්ථං පකාසෙන්තො සත්ථා ආහ:

"ඉක්බිති ඒ **රාත්‍රිය ඇවෑමෙන්** (*රත්තියා අච්චයෙන*) චූළනී රජ තෙමේ සේනාව හසුරුවන්නේ ඒ නුවරට එළඹියේය. මේ කාරණය ප්‍රකාශ කරමින් ශාස්තෘන්වහන්සේ මෙසේ වදාළ සේක :

"රක්ඛිත්වා **කසිණං රත්තිං** චූළනීයො මහබ්බලො, **උදෙන්තං අරුණුග්ගම්හි** උපකාරිං උපාගමි."

"මහත් බල ඇති චූළනී රජ තෙමේ **මුළු රාත්‍රියේ** (*කසිණං රත්තිං*) ආරක්ෂාවක් තබා **අරුණෝද්ගමනයෙහි** (*උදෙන්තං අරුණුග්ගම්හි*) උපකාරී නුවරට එළඹියේය."

තත්ථ '**කසිණං රත්තින්**'ති සකලං රත්තිං."

එහි '**කසිණං රත්තිං**' යනු මුළු රාත්‍රියයි. (*සකලං රත්තිං*)." (ජා.අ.vii.394)

- දුතියං නිදස්සනං -

- දෙවැනි නිදර්ශනය -

සුධාභොජනජාතකං:

සුධාභෝජන ජාතකය:

"**පච්ඡිමරත්තිං**, **රත්තිපරියොසානෙ**, **අරුණෙ උග්ගතෙ** පුරත්ථිමා දිසා රත්තසුවණ්ණතාය උත්තමරූපධාරා හුත්වා දිස්සතී'ති."

"**රාත්‍රියේ කෙළවර** (*පච්ඡිමරත්තිං*), **රාත්‍රියේ අවසානයේ** (*රත්තිපරියොසානෙ*), **අරුණ නැගි කල්හි** (*අරුණෙ උග්ගතෙ*) නැගෙනහිර දිසාව ලස්සන රතුපාට ඇති බැවින් උතුම් රූපයෙන් යුතුව පෙනේ." (ජා.අ. vi.241)

"එවං සබ්බත්ථ **රත්තිපරියොසානෙ** ආගමිඅරුණවසෙනෙව **අරුණුට්ඨානං** දස්සිතං."

"මෙලෙස සෑම තන්හි **රාත්‍රියේ අවසානයේ** (*රත්තිපරියොසානෙ*) පැමිණෙන අරුණ වශයෙන්ම **අරුණ නැගී සිටීම** (*අරුණුට්ඨානං*) දක්වන ලදි." (වින.අ.ටී.1.410)

රත්තියා අදිභූතඤ්ච පරියොසනඤ්ච දීඝනිකායට්ඨකථායම්පි එවං විත්ථාරිතං:

"සූරියත්ථංගමනතො **යාව අරුණුග්ගමනා** රත්ති."

රාත්‍රියේ ආරම්භය හා අවසානය දීඝනිකාය අටුවාවෙහි ද මෙසේ විස්තර කරන ලදි:

"ඉර බැසීමෙහි පටන් **අරුණෝද්ගමනය වන තුරු** (*යාව අරුණුග්ගමනා*) රාත්‍රියයි."
(දී.අ.630)

"අරුණුග්ගතසමයෙ පුරත්ථිමාය දිසාය රත්තභාගො, සූරියාලොකස්ස පත්ථටත්තා සෙස-දිසානං ඔදතභාවො විඤ්ඤායති."

රාත්‍රියේ (අඳුරේ) අවසානයට හේතුව නම්: අරුණෝද්ගමනය සිදු වූ කල්හි නැගෙනහිර දිසාවේ රතුපාට කොටස ද, සූර්‍යයාලෝකය පැතුරුන බැවින් සෙසු දිසාවන්හි සුදුපාට බව ද දක්නා ලැබේ." යනුයි.
(වින.අ.ටී.1.0022;අභි.ප.සූ.26)

(ii) **සකලරත්තියා අච්චයෙන රත්තියා විභාතතා**

(ii) **මුළු රාත්‍රිය ඇවෑමෙන් රාත්‍රිය එළි වීම**

- පඨමං නිදස්සනං -

"එකො [භික්ඛු] සූරියෙ අත්ථංගතමත්තෙයෙව ...චඞ්කමන්තො...කණ්ටකං අක්කමි...සො තං වෙදනං අබ්බොහාරිකං කත්වා **සබ්බරත්තිං** චඞ්කමිත්වා **විභාතාය රත්තියා** අඤ්ඤස්ස සඤ්ඤං අදසි."

- පළමුවැනි නිදර්ශනය -

"එක් [භික්ෂුවක්] ඉර බැසීමෙහිම ... සක්මන් කරමින්...කටුවක් පෑගුවේය. උන්වහන්සේ ඒ වේදනාව ගණන් නොගත යුතු යැයි සලකා **මුළු රාත්‍රිය** (*සබ්බරත්තිං*) සක්මන් කොට **රාත්‍රිය එළි වූ කල්හි** (*විභාතාය රත්තියා*) අන් භික්ෂුවකුට දැනුම් දුන්නේය."
(සං.නි.අ.ii.216)

- දුතියං නිදස්සනං -

උදෙනස්ස උප්පත්ති:

"රාජමහෙසියා...**සබ්බරත්තිං** නිද්ද නාම නාහොසි. **විභාතමානාය පන රත්තියා**, වලාහකවිගමො ච **අරුණුග්ගමනඤ්ච** තස්සා ගබ්භවුට්ඨානඤ්ච එකක්ඛණෙ යෙව අහොසි."

- දෙවැනි නිදර්ශනය -

උදෙන රජුගේ උත්පත්තිය:

"රජ මෙහෙසියට...**මුළු රාත්‍රියෙහි** (*සබ්බරත්තිං*) නින්දෙක් නොවීය. **රාත්‍රිය එළි වූ කල්හි වනාහි** (*විභාතමානාය පන රත්තියා*), වළාකුළු ඉවත්වීම ද **අරුණෝද්ගමනය** ද (*අරුණුග්ගමනඤ්ච*) ඇගේ දරුවා බිහිවීම ද **එකවරම** (*එකක්ඛණෙ යෙව*) සිදු විය."
(ධ.අ.83)

(iii) **සකලරත්තියා අච්චයෙන ආලොකෙ සංජාතෙ**

- පඨමං නිදස්සනං -

පටාචාරත්ථෙරියා වත්ථු:

"සා ...[මග්ගෙ] **සබ්බරත්තිං** බෙපෙත්වා ... **ආලොකෙ සංජාතෙ** පදනුසාරෙන ඔලොකෙන්තී වම්මිකපාදෙ පත්තං **දිස්වා** ... පරිදෙවිත්වා. ..."

(iii) **මුළු රාත්‍රිය ඇවෑමෙන් ආලෝකය පහළ වීම**

- පළමුවැනි නිදර්ශනය -

පටාචාර තේරියගේ කථාව:

"ඇය ...[පාරේ] **මුළු රාත්‍රිය** (සබ්බරත්තිං) ගෙවා ... **ආලෝකය පහළ වූ කල්හි** (*ආලොකෙ සංජාතෙ*) හිමියාගේ පියවර අනුව බලන්නී තුඹස පාමුළ වැටී සිටි ඔහු **දැක** (*දිස්වා*). .. හඬා ... ."

(අං.නි.අ.195)

**සංලක්ෂ්‍යය** - ඉහත කී පරිදි ධම්මපද අටුවාව හා ථෙරිගාථා අටුවාව අනුව පටාචාරාව (i) මුළු රාත්‍රිය ගත කළාට පසු, (ii) අරුණෝද්ගමනයට අනතුරුවම, නොහොත් රාත්‍රිය එළි වීමට අනතුරුවම හිමියාගේ ගිය මග ද, තුඹස මත මැරී වැටී සිටි හිමියාගේ නිල්පාට දරදඩු වූ සිරුර ද දැක්කාය. රාත්‍රියේ වනාහි අඳුරෙහි නිල්පාට ආදී අරමුණු නොපෙනේ. ඒවා දකින්ට නම් අවට පරිසරයේ කලින්ම ආලෝකය තිබිය යුතු යැයි සිතාගත හැකිය. ඒ අලෝකයට හේතුව රාත්‍රිය හෝ අඳුර නොව, අරුණෝද්ගමනයම ය.

මෙසේ අරුණෝද්ගමනය සිදු වූ කල්හි,

(i) මුළු රාත්‍රිය (*සබ්බරත්ති*) ගෙවී යෑම ද,

(ii) ආලෝකය පහළ වීම ද (*ආලොකෙ සංජාතෙ*) සිදු වෙයි.

එනම් මුළු රාත්‍රිය ගෙවී එළිවේ යැයි (*විභාතාය රත්තියා*) යන අර්ථයයි.

එම නිසා ඉර උදවට පෙර යම් අවස්ථාවකදී

(i) අහස තලේ සිවු දිසාවන්හි සුදුපාට බව දක්නා ලැබේ නම්,

(ii) තම අවට පරිසරයේ පෙනීමට ප්‍රමාණවත් ස්වාභාවික ආලෝකය පහළ වුණා නම්,

ඒ අවස්ථාවේ අරුණෝද්ගමනය සිදු වුණා යැයි තේරුම් ගත යුතුයි. ඒ අවස්ථාවේ පාර දකින්ට, මිනිසුන් දකින්ට, බඩු දකින්ට, පොකුණු දකින්ට, පියුම් වගී එනම් නිල්, රතු, කහ, සුදු යනාදී පාට දකින්ට, රන් ඇට ආදී අරමුණු දකින්ට ද ස්වාභාවික ආලෝකයෙන්ම හැකිවේ.

8.

# 1994 දෙසැම්බර් 28-31 දිනවල

# නිමලව අරණ්‍යයේ සමුද්‍රකුටියේදී

# ප්‍රත්‍යක්ෂ කළ

# අරුණෝද්ගමනය

# නැගෙනහිර දිසාවේ රාත්‍රියේ ආකාශය




පෙ.ව. 5:15

සිකුරු තරුව →
බුද →

උදේ හිමිදිරි සුදු එළිය පුළුල් වීම.
**මද රතුපාට පහළ වීම.**
ක්ෂිතිජය අප්‍රකටයි →
අවට පරිසරය අඳුරුයි.



7

පෙ.ව. 5:20

සිකුරු තරුව →

බුද →

උදේ හිමිදිරි සුදු එළිය තව පුළුල් වීම.
මද රතුපාටත් පුළුල් වීම.

ක්ෂිතිජය ප්‍රකට වෙයි →
අවට පරිසරය අඳුරුයි.



8

පෙ.ව. 5:30

සි.

බු.

උදේ හිමිදිරි
සුදු එළිය
තව පුළුල් වීම.

රතුපාට තදවීම
හා තව පුළුල් වීම.
ක්ෂිතිජය ප්‍රකට
මදි. →
අවට පරිසරය
තවම අඳුරුයි.



9

පෙ.ව. 5:45

උදේ හිමිදිරි
සුදු එළිය
සිවු දිසාවන්හි
පැතිරීම.

වැඩීගෙන එන
තද රතුපාටයි.
ක්ෂිතිජය මනාසේ
ප්‍රකටයි. →
මුහුදේ නිල් පාට
ප්‍රකටයි.
අවට පරිසරය
එළි වේ.



10

මෙම වේලාවේ (පෙ.ව. 5:45) දී:

1. වැඩීගෙන එන තද රතුපාට පළල් අතට මුළු නැගෙනහිර දිසාවේ පහළ කොටසේ පැතැරී යයි. උස් අතට ඊට වඩා උඩට නොයේ. ශීඝ්‍රයට පැමිණේ. මෙය ද මෙසේ විස්තර කරන ලදි:- "**අරුණ නැගි කල්හි**' යනුː අරුණෝ ශීඝ්‍රය නැගි කල්හි." (සා.දී.ටී.3.340, 3.383, 3.426; අං.නි.අ.762). එනම්: '**රතුපාට ශීඝ්‍රය නැගි කල්හි**' යන අර්ථයයි. මෙය වනාහි 'අරුණ නැගීම', 'අරුණෝද්ගමනය', 'අරුණෝදය' හෝ කියනු ලැබේ.

2. සූර්යාලෝකය පැතුරුන බැවින් ද මුළු රාත්‍රිය (අඳුර) ගෙවී ගිය බැවින් ද සෙසු සිවු දිසාවන්හි සුදුපාට ද පහන් (ප්‍රසන්න) බව ද දක්නා ලැබේ. රාත්‍රිය ද සතුටුදායක පෙනුමක් ඇතිවී **'එළි වේ'** යන අර්ථයයි. කුරුළු ආදී සත්තු මෙම වෙලාවේ එකවර සතුටු නාදය කරති.
3. පෙර නොපෙනුන රූප දැන් ප්‍රකට වේ. අවට පරිසරයේ මිනිස්සු, පාර, ගස් කොළන් ආදී අරමුණු ද නිල්, කහ ආදී පාට ද දෘශ්‍යමාන වේ. ගමන් යාම ආදිය ද පහසු යැය. ස්වාභාවික එළිය පවතින බැවින් ගිනිහුළු, පහන්, විදුලි පන්දම ආදී කෘතිම එළියක් අවශ්‍ය නැත.
4. මෙම කාලය පටන් ක්‍රමානුකූලව වැඩි වැඩියෙන් එළි වේ.
5. ඉර උදවන වේලාව - 6:20.

**සංලක්ෂ්‍යය**- මෙහි සටහන් වන වේලාව **පෙ.ව. 5:15 සිට 5:45 දක්වා** යන මේ කාලය තුළ අරුණ (මඳ රතුපාට) පවතින කාලය හා **පෙ.ව. 5:45** දී අරුණෝද්ගමනය (වැඩීගෙන එන තද රතුපාට) පවතින කාලය යැයි සැලකිය යුතුය. ඉහත සඳහන් කළ **'අන්තො අරුණෙ'** (අරුණ තුළ) යන විනය අධිවචනය මෙහි **පෙ.ව. 5:15 සිට 5:45 දක්වා** යන මේ කාලය තුළ විය යුතු යැයි සැලකිය හැකිය. විනයාලංකාර ටීකාවෙහි මෙය මෙසේ කියන ලදි:

"**අන්තො අරුණෙ'ති**: අරුණෝදයතො පුරෙතරමෙව."

"**අරුණ තුළ *(අන්තො අරුණෙ)*** යනු අරුණෝදයට පෙරම." (වින.අ.ටී.2.224, 229)

මෙසේ **'අරුණ තුළ'** ***(අන්තො අරුණෙ)*** යනු අරුණෝදයට හෝ අරුණෝද්ගමනයට හෝ පෙර වූ කාලයකි. එනම් මෙහි **පෙ.ව. 5:45**ට පෙර වූ කාලය යන අර්ථයයි.

# 2001 සැප්තැම්බර් 19 දිනයෙහි ත්‍රිකුණාමලයේදී ප්‍රත්‍යක්ෂ කළ අරුණ හා අරුණෝද්ගමනය

**සංලක්ෂ්‍යය–** මෙම දිනයෙහි සංස්කාරක විසින් විශේෂ වර්ගයේ කැමරාවකින් පිංතූර ගන්නා ලදී. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට අනුව මෙදින උදේ හිමිදිරි සුදු එළිය පෙ.ව. *4:51* ට පටන් ගනී. එහෙත් ක්ෂිතිජයේ වළාකුළු තිබූ හෙයින් ඒ සුදු එළිය පින්තූර ගැනීමට නොහැකි විය. නමුත් පෙ.ව. 5:05 සිට, එනම් විනාඩි 14 කට පසු, ඉර උදාවන තුරු, එනම් 6:00 දක්වා, ඉතිරි පිංතූර ගන්නා ලදී. මෙම නිරීක්ෂණයෙහිදී නැගෙනහිර තමන්කඩුව දෙපලාතේ සංඝ නායක පූජ්‍ය මිහිඳුපුර මහින්දවංස නාහිමි සහභාගි විය.

**පෙ.ව 4:30**



සැප්තැම්බර් මාස-
යේ සිකුරු හා බුද
තරුවල උතුරු
පථයෙහි (උත්තරා-
යණයෙහි) ගමන්
කරන සැටි.

1

**පෙ.ව 5:05**



මඳ රතුපාට (අරු-
ණ) පහළ වීම.
විනාඩි 14 කට
පෙර පහළ වූ උදේ
හිමිදිරි සුදු එළිය
දැන් ඉහලින්
පෙනේ.
මුහුදේ ඈතින් ආ-
ලෝක ලප දෙකක්
පෙනෙන අතර ඒවා
ලොකු හමුදා නැව්
දෙකකි.

2

පෙ.ව 5:11

උදේ හිමිදිරි සුදු
එළිය පුළුල් වීම.
මද රතුපාටත්
පුළුල් වීම.



3

පෙ.ව 5:20
උදේ හිමිදිරි සුදු
එළිය තව පුළුල්
වීම. මද රතුපාටත්
තව පුළුල් වීම.
පින්තූරේ පසු බිමේ
පවතින රතුපාට
ඇසට ප්‍රකටව පෙ-
නෙන නමුත් නැ-
ගෙනහිර දිසාවේ
අහසේ සුදු එළිය
වැඩි වූ බැවින් ඒ
රතුපාට කැමරාවට
නියම ආකාරයෙන්
ගෝචර නොවිය.
ගොඩබිම තුළ
තවමත් අඳුරු ගති-
යක් පවතී.



4

පෙ.ව 5:25

උදේ හිමිදිරි සුදු
එළිය ගොඩබිම
තුළ පැතිරේ.



5

පෙ.ව 5:30
උදේ හිමිදිරි සුදු
එළිය ගොඩබිම
තුළ පැතිරුණේය.
අවට පරිසරය එළි
වේ. රතුපාට පළල්
අතට මුළු නැගෙ-
නහිර දිසාවේ
පහළ කොටසේ
පැතිරී යයි.
මේ මොහොතෙහි
කුරුල්ලෝ සතුටු
නාදය දෙමින් තම
කැදැලිවලින් ඉගි-
ළෙති.
අරුණෝද්ගමනයේ
ලකුණු දැන් මතු
වේ.



6

පෙ.ව 5:30

සූර්යාලෝකය පැතුරුන බැවින් ද මුළු රාත්‍රිය (අඳුර) ගෙවී ඇති බැවින් ද සෙසු දිසාවන්හි සුදුපාට ද ප්‍රසන්න බව ද දක්නා ලැබේ. අවට පරිසරයේ මිනිස්සු, පාර, ගස් කොළන් ආදී අරමුණු ද නිල්, රතු ආදී පාට ද දෘශ්‍යමාන වේ. ගමන් යාම ආදිය ද කෘතිම එළියක් නොමැතිව පහසුය.



7

පෙ.ව 5:39

ඉර උදාවට විනාඩි 21 ට පෙර අරමුණු සියුම් ලෙස පෙනෙන සැටි.



8

පෙ.ව 6:00

ඉර උදාව.
රතුපාට තවමත්
පවතී. අහස නිල්-
පාටට හැරුණු
බැවින් ඒ රතුපාට
කැමරාවට නැවත
ගෝචර විය.
අහසේ දර්ශනය
වෙන ලප තුන කු-
රුල්ලන් තිදෙනෙකි.



# 1995 මාර්තු 27 දිනයෙහි

# ශ්‍රී පාද කඳු මුදුනයේදී

# ප්‍රත්‍යක්ෂ කළ

# අරුණෝද්ගමනය

**සංලක්ෂ්‍යය-** 1995-3-27 වන දිනයෙහි මමත්, පියරතන සාමණේර ආයුෂ්මතුන් වහන්සේත්, ඇස්වත්තු වාසී වික්‍රමසිංහ මහතා ප්‍රධාන විශාල ගිහි පිරිසක් එකතුව, පෙ.ව. 4.00 ට සිරිපා මළුවට පිවිසියෙමු. පෙ.ව. 5:00 වනතුරු සම්පූර්ණයෙන්ම අන්ධකාරය පැවතිණි. නමුත් පෙ.ව. 5:02 ට පමණ නැගෙනහිර දිග ක්ෂිතිජයේ උදේ හිමිදිරි සුදු එළිය පෙනෙන්නට පටන් ගත්තේය. විනාඩි 10 කට පමණ පසු මඳ රතුපාට පහළ විය. වික්‍රමසිංහ මහතා සතුව තිබූ කැමරාව සාමාන්‍ය එකකි. මේ වන විට ඈත ක්ෂිතිජයේ මඳ ආලෝකයක් පවතින බැවින් මෙවැනි කැමරාවකින් පිංතූර නොගනියි. එවැනි පිංතූර ගැනීමට විශේෂ වර්ගයේ කැමරාවක් අවශ්‍ය වෙයි. එවැනි කැමරා වර්ග දුර්ලභයි. එබැවින් පෙ.ව. 5:02 සිට 5:40 දක්වා කිසිම පින්තූරයක් ගත නොහැකි විය. එහෙත් පෙ.ව. 5:40 ට පමණ රතුපාට ආලෝකය මුළු නැගෙන දිග අහසේ පහළ කොටසෙහි පළල් අතට පැතිරී ගිය කල්හි, එනම් රාත්‍රිය ගෙවී එළි වූ කල්හි, පළමුවැනි පින්තූරය ගන්නා ලදී. එයට හේතුව, අවට පරිසරයේ - සාමාන්‍ය කැමරාවකින් පින්තූර ගැනීමට සුදුසු - පෙනීමට ප්‍රමාණවත් ස්වාභාවික ආලෝකය ඇති වූ හෙයිනි. මෙදින ආකාශයේ මීදුම හා වළාකුළු ටිකක් තිබූ හෙයින් මෙම පින්තූරයන්හි රතුපාට ටිකක් දුර්වලව පෙනෙයි.

පෙ.ව. 5:40



1

පෙ.ව. 5:55



2

පෙ.ව. 6:11

ඉර උදාවීම →



3

පෙ.ව. 6:12

ඉර ක්ෂිතිජය මත.
රතුපාට තව පවතී.



4

පෙ.ව. 6:13



ඉර ක්ෂිතිජය මත.
රතුපාට තව පවතී.

5

පෙ.ව. 6:18



ඉර ක්ෂිතිජයෙන්
ඉහළට යයි.
රතුපාට තව පවතී.

6

## 1999 මැයි 21 වන දිනයෙහි නාඋයන අරණ්‍යයේදී

පූජ්‍ය ගාල්ලේ සංඝසෝභන ස්වාමීන්වහන්සේ විසින් අරුණෝද්ගමනය ප්‍රත්‍යක්ෂ කරගැනීම සඳහා නාඋයන අරණ්‍ය සේනාසනයේදී පහත සඳහන් දත්තයන් සටහන් කරගන්නා ලදීඃ

- පෙ.ව. 5ඃ20 වන විට සිව් දිසාවන්හි සුදුපාට ආලෝකය පහළ විය. අවට පරිසරයේ ස්වාභාවික එළිය පැතිරී ගිය බැවින් පාරවල්, ගස්කොලන්, මල්, තිල්, කහ ආදී පාට ද, අතේ ඇති කුඩා රේඛා පවා ද දක්නට ලැබිණ.
- පෙ.ව. 5ඃ53 වන විටදී ඉර උදාව සිදුවිය.

මෙම දත්තයන්ට අනුව ද අපට පැහැදිලිවන කාරණය නම් මැයි 21 වන දිනයෙහි ඉර උදාවට විනාඩි 33 කට පමණ පෙර අවට පරිසරයේ ඇති වස්තූන් කෘතිම එළි නොමැතිව බලාගැනීමට ප්‍රමාණවත් ස්වාභාවික ආලෝකයක් ඇති වූ බවය. (කරුණාකර 14 පිට බලා සංසදනය කරන්න.)

## සිවුවැනි පරිච්ඡේදය

# අරුණෝද්ගමනය සිදුවීම හා නොසිදුවීම අතර වෙනස

I. අරුණස්ස අනුග්ගමනං

1. අරුණෙ අනුග්ගතසමයෙ අන්ධකාරභාවො ච රූපානං අදිස්සමානභාවො ච **උක්කාදිනා කිත්තිමාලොකධාරියමානෙන ඉච්ඡිතබ්බභාවො ච කම්මන්තානං අප්පවත්තනභාවො** ච පාළිපාඨෙසු දිස්සති.

- පඨමං නිදස්සනං -

චූල්ලතිස්සත්ථෙරවත්ථු:

"නාරදෙ...ඉද්ධිබලෙන **අරුණුග්ගමනං** නිවාරෙසි. නාගරා **අරුණෙ අනුග්ගච්ඡන්තෙ** රාජද්වාරං ගන්ත්වා, 'දෙව, ... අරුණං නො උට්ඨාපෙහී'ති කන්දිංසු... . තං බාණසද්දෙව රාජා **උක්කාහි ධාරියමානාහි** තත්ථ ගන්ත්වා නාරදං ආහ:

'කම්මන්තා නප්පවත්තන්ති
ජම්බුදීපස්ස, නාරද !
කෙන ලොකො තමොභූතො?
තම්මෙ අක්ඛාහි පුච්ඡිතො'ති."

- දුතියං නිදස්සනං -

මාතඞ්ගඉසිස්ස වත්ථු:

"මහාසත්තො... ඉද්ධියා සූරියස්ස උග්ගන්තුං න අදාසි. ඉද්ධිමතො ඉද්ධිවිසයො අචින්තෙය්‍යො. තතො පට්ඨාය **අරුණුග්ගමනං න පඤ්ඤායති.** රත්තින්දිවපරිච්ඡෙදෙ නත්ථි. කසිවණිජ්ජාදීනි කම්මානි පයොජෙන්තො නාම නත්ථි. මනුස්සා 'යක්ඛාවට්ටො නු ඛො අයං, භූතදෙවතානාගසුපණ්ණාවට්ටො'ති උපද්දවප්පත්තා...රාජකුලං ගන්ත්වා තමත්ථං ආරොචෙසුං...රාජා මාතඞ්ගඉසිස්ස සන්තිකං

I. අරුණෝද්ගමනය නොසිදුවීම.

1. අරුණෝද්ගමනය නොසිදු වූ කල්හි **අඳුරු බව, රූප නොපෙනෙන බව, ගිනි හුළු ආදි කෘතිම එළිය දැරීමක් අවශ්‍ය** වන බව හා **වැඩ කටයුතුවල නොයෙදෙන බව** යනු පාළි පාඨයන්හි දක්නා ලැබේ.

- පළමුවැනි නිදර්ශනය -

චූල්ලතිස්ස තෙරුන්ගේ කථාව:

"නාරද (තවුසා)[1]... සෘද්ධිබලයෙන් **අරුණෝද්ගමනය** (අරුණුග්ගමනං) වැළැක්වීය. නගරවැසියෝ **අරුණ නොනැගෙන කල්හි** (අරුණෙ අනුග්ගච්ඡන්තෙ) රජගෙට ගොස්, 'දෙවයන් වහන්ස, ... අපට අරුණ නංවන්නැ'යි ඝෝෂා කළහ... . රජ තෙමේ ඒ වේලෙහිම **ගිනි හුළු** ගෙන එහි ගොස් නාරද තවුසාට... මෙසේ කීය:

'නාරදයෙනි ! දඹදිවේ
**වැඩ කටයුතු නො පැවැත්වේ.**
කුමක් නිසා ලොව **අඳුරු** වීද?
එය විචාරනු ලබන්නේ
මට කියනු මැනව'." (ධ.අ.21-2)

- දෙවැනි නිදර්ශනය -

මාතඞ්ග සෘෂියාගේ[1] කථාව:

"බෝසතාණන්වහන්සේ.... සෘද්ධියෙන් ඉර උදවන්නට ඉඩ නො දුන්හ. සෘද්ධිමත්හුගේ සෘද්ධි විෂය සිතිය නො හැකිය. එතැන් පටන් **අරුණෝද්ගමනය** (අරුණුග්ගමනං) **නොපෙනේ.** රෑ හා දවල් අතර **පිරිසිඳීමක්** නැත. ගොවිකම්, වෙළඳාම් ආදී **වැඩ කටයුතුවල** යෙදෙන්නෙකු ද නැත. මිනිස්සු 'මෙය යක්ෂාවේශයක්ද, භූත-දේව-නාග-ගුරුළාවේශයක්දැ'යි කරදරයට පත්...

1. පෙර සංසාරයේ අපේ බෝසතාණන් වහන්සේ.

ගන්ත්වා 'භන්තෙ, තුම්හෙ **අරුණස්ස උග්ගන්තුං** න දෙථා'ති, පුච්ඡි. 'ආම, මහාරාජා'ති... ."

රජකුලයට ගොස් මේ කරුණ දැන්වූහ.... රජ තෙමේ මාතඞ්ග ඍෂියා වෙත ගොස් 'ස්වාමීනි, **අරුණ නගින්ට** (*අරුණස්ස උග්ගන්තුං*) නො දෙන්නේ ඔබ වහන්සේදැ' යි ඇසීය. 'මහරජ, එසේයැ'යි..."

**(ම.නි.අ.iii. 58)**

තත්ථ, '**තතො පට්ඨාය අරුණුග්ගමනං න පඤ්ඤායතී'ති**: "තතො රත්ති න විභායති. අන්ධකාරො ජාතො."

එහි, '**එතැන් පටන් අරුණෝද්ගමනය** (*අරුණුග්ගමනං*) **නොපෙනේ**' යනු :"එතැන් සිට රාත්‍රිය එළි නොවේ (*රත්ති න විභායති*). අඳුරක් විය" යනුයි.

**(සු.නි.අ.131-මාතඞ්ගඉසිස්ස වත්ථු)**

II. **අරුණුග්ගමනං**

අරුණුග්ගතසමයෙ පන,

(i) ලොකෙ අන්ධකාරො නත්ථි,
(ii) උපද්දවප්පත්තියා කිච්චං නත්ථි,
(iii) කන්දනෙන කිච්චං නත්ථි,
(iv) උක්කාපදීපාදි-ධාරියමානෙන කිච්චං නත්ථි,
(v) රත්තියා විභාතභාවො අත්ථි,
(vi) රත්තින්දිවපරිච්ඡෙදෙ අත්ථි,
(vii) පකතිචාරිත්තවසෙන ච කම්මන්තා පවත්තන්තී'ති දට්ඨබ්බං. තං තථෙව:

II. **අරුණෝද්ගමනය සිදුවීම**

අරුණෝද්ගමනය සිදු වූ කල්හි වනාහි

(i) ලොවේ අඳුරක් නැත,
(ii) කරදරයට පත්වීමක් අවශ්‍ය නැත,
(iii) ඝෝෂා කිරීමක් අවශ්‍ය නැත,
(iv) ගිනි හුළු, පහන් ආදී දැරීමක් අවශ්‍ය නැත,
(v) රාත්‍රිය එළි වනු ඇත,
(vi) රෑ හා දවල් අතර පිරිසිඳීමක් ඇත,
(vii) ස්වාභාවික, සාමාන්‍ය සිරිත් ලෙස ද රටේ වැඩ කටයුතු පවතිනු ඇතැයි දත යුතුය. ඒ මෙසේයි :

1. අරුණුග්ගතසමයෙ **උක්කාපදීපාදිනා කිත්තිමාලොකජාලනධාරියමානෙන ච කිච්චං නත්ථිභාවො**

1. අරුණෝද්ගමනය සිදු වූ කල්හි **ගිනි හුළු, පහන් ආදි කෘත්‍රිම එළිය දැල්වීමක් හා දැරීමක් අවශ්‍ය නැති බව**

- නිදස්සනං -

නිමිරාජචරියං:

"නිමිරාජා...පඤ්ච දනසාලායො කාරෙත්වා... **අරුණුග්ගං** ආදිං කත්වා යාව පකතියා පවෙසනකාලො, තාව දනං පවත්තෙති. ඉතරස්මිම්පි කාලෙ අනෙකසතපදීපා ඣායන්ති- යද යද අත්ථිකා ආගච්ඡන්ති, තද තද [දනං] දීයතෙව."

- නිදර්ශනය -

නිමි රජුගේ[1] චර්‍යාව:

"නිමි රජ තෙමේ... දනශාලා පහක් කරවා... **අරුණෝද්ගමනය** (*අරුණුග්ගං*) ආරම්භ කොට **ස්වාභාවික ලෙස** (පකතියා) ඇතුල් වන කාලය දක්වා, එතෙක් කල් දනය පවත්වයි. ඉතිරි කාලයෙහි ද නොයෙක් සියගණන් පහන් දැල්වෙති-යම් යම් කලෙක දිළින්දෙ පැමිණෙත් නම්, ඒ ඒ කලෙක දනය දෙනු ලැබේම ය." **(ච.පි.අ.44)**

1. පෙර සංසාරයේ අපේ බෝසතාණන් වහන්සේ.

**සංලක්ෂ්‍යය-** මෙහි වනාහි අරුණෝද්ගමනයෙහි සිට ඉර බැසයන තුරු ස්වාභාවික ලෙස ඇතුල් වන කාලයයි. මේ කාලය හැර ඉතිරි කාලයෙහි, එනම් ඉර බැසයාමෙහි සිට, රාත්‍රියේ අඳුරෙහි, අරුණෝද්ගමනය වන තුරු පහන් දැල්වෙත් ද ඒ ඒ කාලෙක දනය දෙනු ලැබේ ද යැයි දත යුතුයි. දීඝ නිකාය අටුවාවෙහි මෙය මෙසේ කියන ලදි:-

පාළි

(i) "අරුණුග්ගමනතො යාව සූරියත්ථඞ්ගමනා දිවා.

(ii) සූරියත්ථඞ්ගමනතො යාව අරුණුග්ගමනා රත්තී'ති."

සිංහලානුවාදය

(i) "අරුණෝද්ගමනයෙහි සිට ඉර බැසයන තුරු දවාලයි *(දිවා)*.

(ii) ඉර බැසීමෙහි සිට අරුණෝද්ගමනය වන තුරු රාත්‍රියයි." (දී.නි.අ.630)

තත්ථ 'දිවා'ති:- "දීයති, ඛීයති අන්ධකාරො එතෙනා'ති =දිවා. **දී** ඛයෙ. ආචරියා පන "දිබ්බති, ඔභාසතී'ති = දිවා"ති **දිවු** ධාතුවසෙනා'පි දිවා-සද්දස්ස අත්ථං සංවණ්ණෙන්ති."

එහි 'දිවා' (*දවාල*) යනු :- "එයින් **අඳුර** ගෙවේ, ක්ෂය වේ යැ'යි = **දිවා**. **දී** ධාතුවෙන් ක්ෂය වීමෙහි. ආචාර්යයෝ වනාහි "බබලයි, ආලෝක කරයි යැ'යි=**දිවා** යන **දිවු** ධාතුව වශයෙන් ද දිවා-ශබ්දයේ අර්ථය වර්ණනා කරති."

(අභි.ප.සූ.17 ; කච්.ධා.ම.)

විමතිවිනොදනීටීකායඤ්ච වුත්තං:-

විමතිවිනොදනී ටීකාවෙහි මෙසේ ද කියන ලදි:-

"අරුණුග්ගමනං නාම දිවසස්ස ආදිභූතං."

"අරුණෝද්ගමනය නම් දවසේ ආරම්භයයි."

(විම.වි.ටී.258)

තත්ථ '**අන්ධකාරො**' නාම රත්තියා එව ලක්ඛණං, න දිවාය (ආලොකස්ස). වුත්තඤ්හෙතං මහාවග්ගපාළියං :-

එහි '**අඳුර**' නම් රාත්‍රියටම ලක්ෂණයකි. දවාලට (ආලෝකයට), දවසට හෝ ලක්ෂණයක් නො වේ. මහ වග්ග පාළියෙහි මෙය මෙසේ කියන ලදි:-

"භික්ඛූ **රත්තියා...අන්ධකාරෙ** ඛාණුම්පි, කණ්ටකම්පි අක්කමන්ති. පාදා දුක්ඛා හොන්ති...'අනුජානාමි, භික්ඛවෙ, අජ්ඣාරමෙ...පදීපං...'' ති, භගවතා රත්තියා අන්ධකාරෙ පදීපාදීනි ජාලෙතුං ච ධාරෙතුංච අනුඤ්ඤාතං.

"භික්ෂූහු **රාත්‍රියේ...අඳුරෙහි** කණු ද කටු ද පාගත්. පා රිදේ... 'මහණෙනි, ආශ්‍රමය තුළ... පහනක්...අනුදනිමි"යි (ම.ව.492) යන භාග්‍යවතුන් වහන්සේ රාත්‍රියේ අඳුරෙහි පහන් ආදී දල්වන්ට ද දරන්ට ද අනුමත කළ සේක.

පදීපුජ්ජලනා ලද්ධාලොකො පකතාලොකො න හොති. තං පන කිත්තිමං. අරුණුග්ගතසමයෙ පන,

පහන් දැල්වීමෙන් ලැබෙන ආලෝකය ස්වාභාවික ආලෝකය නොවේ. එය කෘතිමයි. එහෙත් අරුණෝද්ගමනය සිදු වූ කල්හි

(i) පකතිසූරියාලොකස්ස පත්ථටත්තා ච,
(ii) චතුදිසානං ඔදාතභාවො විසදභූය-තත්තා ච,
(iii) රත්තියා විභාතත්තා ච,
(iv) දිවාය/දිවසස්ස ආදිභූතත්තා ච,
(v) අන්ධකාරස්ස නත්ථිතා ච,
(vi) පකතියා බාණු-කණ්ටකාදීනං රූපාරම්මණානං දිස්සමානත්තා ච,

පදීපං ජාලෙතුං ච ධාරෙතුං ච කිච්චං නත්ථී'ති දට්ඨබ්බං.

(i) ස්වාභාවික සූර්‍යාලෝකය පැතුරුන බැවින් ද,
(ii) සිවු දිසාවන්හි සුදුපාට බව දක්නා ලැබෙන බැවින් ද,
(iii) රාත්‍රිය එළි වූ බැවින් ද,
(iv) දවාල/දවස ආරම්භ වුණ බැවින් ද,
(v) අඳුරක් නැති බැවින් ද,
(vi) ස්වාභාවික ලෙස කණු, කටු ආදී රූප අරමුණු පෙනෙන බැවින් ද,

පහන් දැල්වීමක් ද දැරීමක් ද අවශ්‍ය නැතැයි දත යුතුය.

මෙසේ නිමි රජුගේ වර්‍ෂා කථාවෙහි-

**"අරුණෝද්ගමනය ආරම්භ කොට ස්වාභාවික ලෙස ඇතුල් වන කාලය දක්වා"** යනු: අරුණෝද්ගමනයෙහි සිට පහන් ආදි කෘතිම ආලෝකයෙන් නොව, ස්වාභාවික ආලෝකයෙන්ම දානශාලාවට ඇතුල් වන කාලය ප්‍රකාශ වේ.

**'ඉතිරි කාලයෙහි නොයෙක් සියගණන් පහන් දැල්වෙති'** යනු: අරුණෝද්ගමන කාලය එනම් ස්වාභාවික ආලෝකය පවතින කාලය හැර, ඉතිරි කාලයෙහි රාත්‍රියේ අඳුරෙහි පහන් ආදි කෘතිම ආලෝකයෙන් දානශාලාවට ඇතුල් වන කාලය ප්‍රකාශ වේ.

ඉහත තොරතුරු සටහනකින් මෙසේ දැක්විය හැක:

සටහන 12




## 2. අරුණුග්ගමනං දිවාසංඛං ගච්ඡන්තභාවො

අරුණුග්ගමනං දිවසස්ස ආදිභූතභාවස්ස ච දිවාසංඛං ගච්ඡන්තභාවස්ස ච අනෙකානි නිදස්සනානි දස්සෙතුං සක්කා. ඉධ පන උදාහරණවසෙන කතිපයානි එව දස්සීයන්ති. ඉමෙහි නිදස්සනෙහි න කොට්ඨාසවසෙන, සබ්බරත්තියා අපරභාගෙ පුන දිවසෙ අරුණුග්ගමනස්ස සිද්ධභාවො දිස්සති.

## 2. 'අරුණෝද්ගමනය' යනු දවාල සංඛ්‍යාවට යන බව

'අරුණෝද්ගමනය' දවසේ ආරම්භය වන බව ගැන හා දවාල සංඛ්‍යාවට යන බව ගැන නොයෙක් නිදර්ශනයන් දැක්විය හැකි නමුත්, මෙහි උදාහරණ වශයෙන් කීප පමණක් දක්වනු ලැබේ. මේ නිදර්ශනවලින් පෙනෙන්නේ: කොටසක් වශයෙන් නොව **මුළු රාත්‍රියෙන්** (සබ්බරත්තියා) පසු, **ඊළඟ දවසේ** (පුන දිවසෙ) අරුණෝද්ගමනය සිදු වන බව.

- පඨමං නිදස්සනං -

අඤ්ඤකොණ්ඩඤ්ඤත්ථෙරස්ස පරිනිබ්බාණං:

"පඤ්ච භික්ඛුසතානි ආකාසෙනාගන්ත්වා **සබ්බරත්තිං** සජ්ඣායමකංසු... . **පුන දිවසෙ, අරුණුග්ගමනවෙලායමෙව** චිතකං නිබ්බාපෙත්වා... ධාතුනං... සත්ථු හත්ථෙ ඨපයිංසු."

- පළමුවැනි නිදර්ශනය -

අඤ්ඤකොණ්ඩඤ්ඤ තෙරුන්ගේ පරිනිර්වාණය:

"භික්ෂූන් පන්සිය නමක් අහසින් වැඩ **මුළු රාත්‍රියේ** (සබ්බරත්තිං) සජ්ඣායන කළහ.... **ඊළඟ දවසේ** (පුන දිවසෙ), **අරුණෝද්ගමන වේලෙහිම** (අරුණුග්ගමනවෙලායමෙව) දරසෑය නිවා...ධාතුන්...ශාස්තෘන් වහන්සේගේ අතේ තැබූහ." (සං.නි.අ.i.219)

- දුතියං නිදස්සනං -

"සො [පඨවින්ධරො නාගරාජා]...පදුමුත්තරදසබලං නිමන්තෙත්වා...**සබ්බරත්තිං** සක්කාරසම්මානං සජ්ජෙසි. සත්ථා **පුන දිවසෙ, උට්ඨිතෙ අරුණෙ** අත්තනො උපට්ඨාකං සුමනත්ථෙරං ආමන්තෙසි: "සුමන, **අජ්ජ** තථාගතො දූරං භික්ඛාචාරං ගමිස්සති."

- දෙවැනි නිදර්ශනය -

"ඒ [පඨවින්ධර නාරජ තෙමේ]...දශබල වූ පදුමුත්තර බුදුන් වහන්සේ ආරාධනා කොට... **මුළු රාත්‍රියේ** (සබ්බරත්තිං) සත්කාර හා බුහුමන පිළියෙළ කළේය. ශාස්තෘන් වහන්සේ **ඊළඟ දවසේ** (පුන දිවසෙ), **අරුණ නැඟී සිටි කල්හි** (උට්ඨිතෙ අරුණෙ) තමාගේ උපස්ථායක වූ සුමන තෙරුන් වහන්සේ ඇමතූ සේක: "සුමනයෙනි, **අද දවස** (අජ්ජ) තථාගතයන් වහන්සේ පිඬු පිණිස හැසිරීමට දුර තැනට වඩින්නේය." (අං.නි.අ.142)

- තතියං නිදස්සනං -

"මහාසත්තො...**තං රත්තිං** නිවෙසනෙයෙව සයිත්වා **පුන දිවසෙ, අරුණුග්ගමනවෙලාය** මාතපිතරො වන්දිත්වා...නගරා නික්ඛම්ම...."

- තෙවැනි නිදර්ශනය -

"බෝසතාණන් වහන්සේ... **ඒ රාත්‍රියේ** ගෙයි ම නිදගෙන **ඊළඟ දවසේ** (පුන දිවසෙ), **අරුණෝනද්ගමන වේලෙහිම** (අරුණුග්ගමනවෙලාය) මවුපියන් වැඳ...නුවරින් නික්මී... ." (ජා.අ.vi.311)

- චතුත්ථං නිදස්සනං -

"ආළවකො පන **සබ්බරත්තිං**...කිඤ්චි කාතුං අසක්කොන්තො සත්ථාරං උපසඞ්කමිත්වා අට්ඨ පඤ්හෙ පුච්ඡි... . **පුන දිවසෙ, උට්ඨිතෙ අරුණෙ**...රඤ්ඤො ආරොචෙසුං."

- සිවුවැනි නිදර්ශනය -

"ආළවක යක්ෂයා වනාහි **මුළු රාත්‍රියේ** (සබ්බරත්තිං)... කිසිවක් කරන්ට නොහැකි වූයේ ශාස්තෘන්වහන්සේ වෙත එළඹ ප්‍රශ්න අටක් ඇසීය.... **ඊළඟ දවසේ** (පුන දිවසෙ), **අරුණ නැඟී සිටි කල්හි** (උට්ඨිතෙ අරුණෙ)... රජුට දැනුමක් දුන්හ."[1] (අං.නි.අ.212)

**3. අරුණුග්ගතසමයෙ ආලොකසංජාතත්තා කම්මන්තානං පවත්තනභාවො**

දීඝනිකායත්ථකථායං බො පන රඤ්ඤො චක්කවත්තිස්ස මණිරතනාලොකො ච අරුණුග්ගමනවෙලායං සංජාතාලොකො ච සමානො විය නිද්දිට්ඨො. තස්මිං ආලොකෙ සංජාතෙ **කම්මන්තානං පවත්තනභාවො** එවං වුත්තො :

"රඤ්ඤො චක්කවත්තිස්ස...වෙපුල්ලපබ්බතතො මණිරතනං ආගච්ඡති. තස්සෙවං ආගතස්ස මුත්තාජාලකෙ ඨපෙත්වා වෙණුපරම්පරාය සට්ඨිහත්ථප්පමාණං ආකාසං ආරොපිතස්ස රත්තිභාගෙ සමන්තා යොජනප්පමාණං ඔකාසං ආභා ඵරති, යාය සබ්බො සො ඔකාසො **අරුණුග්ගමනවෙලාය විය** සඤ්ජාතාලොකො හොති. තතො කස්සකා කසිකම්මං, වාණිජා ආපනුග්ඝාටනං, තෙ තෙ සිප්පිනො **තං තං කම්මන්තං** පයොජෙන්ති 'දිවා'ති මඤ්ඤමානා."

**3. අරුණෝද්ගමනය සිදු වූ කල්හි ආලෝකය පහළ වූ බැවින් වැඩ කටයුතුවල යෙදෙන බව**

දීඝ නිකාය අටුවාවෙහි චනාහි චක්‍රවර්ති රජුගේ මැණික් රත්නාලෝකය ද අරුණෝද්ගමන වෙලාවේ පහළ වූ ආලෝකය ද යන මේ ආලෝක දෙකම සමාන කොට දක්වන ලදි. ඒ ආලෝකය පහළ වූ කල්හි **වැඩ කටයුතුවල යෙදෙන බව** මෙසේ සටහන් වේ :

"චක්‍රවර්ති රජුට... වෛපුල්‍යය පර්වතයෙන් මැණික් රත්නයක් එයි. මෙසේ ආවා වූ එය මුතුදැල තුළ තබා උණගස් පිළිවෙළින් රියන් හැටක් පමණ අහසට නංවන ලද්දේ රාත්‍රි කාලයේ හාත්පසින් යොදුනක් පමණ අවකාශයෙහි එහි ප්‍රභාව (ආභා : ආලෝකය) පැතිරේ. එයින් ඒ මුළු අවකාශය **අරුණෝද්ගමන වේලාවේ මෙන්** (අරුණුග්ගමනවෙලාය විය) ආලෝකවත් වේ. ඉක්බිති 'දවාල' (දිවා) යැ'යි හඟිමින් ගොවියෝ ගොවිකම් ද, වෙළෙන්දෝ කඩ ඇරීම් ද, ඒ ඒ ශිල්පියෝ **ඒ ඒ වැඩ කටයුතුවල ද යෙදෙති.**"

(දී.නි.අ. iii. 441)

**සංලක්ෂ්‍යය**- වේද පොත්වලත් අරුණාලෝකය සම්බන්ධව සඳහන් වන කරුණු මෙහි වැඩි විස්තර සහිතව නැවතත් සටහන් කරන්ට වටී:

"වේදකාලයේදී අරුණාලෝකය '**උෂස්**' නමින් මූර්තිමත් වුණා. උෂස් තොමෝ අරුණෝදය පිළිබඳ දෙවඟනයි. ඕ පැමිණෙන කල මිනිසුන් හා සතුන් පණ ගන්වා පුබුදුවයි. එකල කුරුල්ලෝ තම කැදැලිවලින් ඉගිළෙති. **මිනිස්සු තම වැඩවල යෙදෙති. ඕ මාර්ග ආලෝක කරයි. නපුරට හා අඳුරට අරක්ගත් භූතයන් පලා හරියි.** හරකුන් තම ගාල විවෘත කරන්නාක් මෙන් ඕ අඳුරෙහි දෙරටුව විවෘත කරයි."

(සිං.වි.කෝ. - 'අරුණ' හා 'උෂස්' යටතේ කරුණාකර බලන්න.)

1. වෙනත් නිදර්ශන නම්: ම.නි.අ.iv.183 ;අං.නි.අ.183 (පුන දිවසෙ, උට්ඨිතෙ අරුණෙ) ; අං.නි.අ.149 (පුන දිවසෙ, අරුණෙ උට්ඨිතෙ) යනාදි තැන්වල දක්නට ලැබේ.

I. **අරුණස්ස අනුග්ගමනං**

1. අරුණෙ අනුග්ගතසමයෙ **ගමනස්ස වජ්ජිතබ්බභාවො**

පුරෙ අරුණුග්ගතසමයෙ රූපානං අදිස්සමානපච්චයා අට්ඨකථාචරියා එවං ඔවදන්ති:

"රත්තිං චණ්ඩවාලාදීනං පරිපන්ථෙ සති **අරුණුග්ගමනං** ආගමිතබ්බං."

තත්ථ '**රත්තිං චණ්ඩවාලාදීනන්**'ති : රත්තිං රත්තිදිට්ඨිකා කිරියසීලානං චණ්ඩවාලාදීනන්'ති අත්ථො.

II. **අරුණුග්ගමනං**

1. අරුණුග්ගතසමයෙ **ගමනස්ස පකතියා භබ්බභාවො**

අරුණුග්ගතසමයෙ රත්තියා (අන්ධකාරස්ස) ඛයෙන ච පකතාලොකපත්ථරණෙන ච රූපානං දිස්සමානත්තා පකතියා ගමනභබ්බභාවස්ස අනෙකානි නිදස්සනානි දස්සෙතුං සක්කා. ඉධ පන උදාහරණවසෙන කතිපයානි එව දස්සීයන්ති:

- පඨමං නිදස්සනං -

පටාචාරත්ථෙරියා වත්ථු:

"සා... [මග්ගෙ] රත්තිං වීතිනාමෙසි... **වුට්ඨිතෙ අරුණෙ/ආලොකෙ සංජාතෙ** මංසපෙසිවණ්ණං එකං පුත්තං අඞ්කෙනාදාය, එකං අඞ්ගුලියා 'එහි, තාත. පිතා තෙ ඉතො ගතො'ති වත්වා, සාමිකස්ස **ගතමග්ගෙන ගච්ඡන්තී,** තං... කාලං කත්වා පතිතං... **දිස්වා** පරිදෙවන්තී පායාසි. සා සකලරත්තිං දෙවෙන වට්ටත්තා අචිරවතිං ථනප්පමාණෙන උදකෙන පරිපුණ්ණං **දිස්වා** ... ජෙට්ඨපුත්තං ඔරිමතීරෙ ඨපෙත්වා ඉතරං ආදාය **පරතීරං ගන්ත්වා**...."

I. **අරුණෝද්ගමනය නොසිදුවීම**

1. අරුණෝද්ගමනය නොසිදු වූ කල්හි **ගමන් යාම වැළැක්විය යුතු බව**

අරුණ නැඟීමට පෙර රූප නොපෙනෙන බැවින් අටුවාචාරීහු මෙසේ අවවාද කරති:

"රාත්‍රියෙහි සැඩ වනසතුන් ආදීන්ගෙන් උවදුරු ඇති කල්හි **අරුණෝද්ගමනය** (අරුණුග්ගමනං) බලාපොරොත්තු විය යුතුය."

(ම.නි.අ.ii.59; අං.නි.අ.796)

එහි '**රාත්‍රියෙහි සැඩ වනසතුන්**'යනු : රාත්‍රියෙහි උන්ගේ රාත්‍රි දෘෂ්ටිය නිසා ක්‍රියාත්මක වන සැඩ වනසතුන් යැයි අර්ථයයි.

II. **අරුණෝද්ගමනය සිදුවීම**

1. අරුණෝද්ගමනය සිදු වූ කල්හි **ගමන් යාම ස්වාභාවික ලෙස කළ හැකි බව**

අරුණ නැඟි කල්හි, රාත්‍රි (අඳුර) ගෙවීමෙන් ද ස්වාභාවික ආලෝකය පැතිරීමෙන් ද රූප පෙනෙන බැවින් ස්වාභාවික ලෙස ගමන් යාම කළ හැකි බව ගැන නොයෙක් නිදර්ශනයන් දැක්විය හැකි නමුත් මෙහි උදාහරණ වශයෙන් කීප පමණක් දක්වනු ලැබේ:

- පළමුවැනි නිදර්ශනය -

පටාචාර තේරියගේ කථාව:

"ඇය... [පාරේ] රාත්‍රිය ගත කළේය... **අරුණ නැඟී සිටි කල්හි/ආලෝකය පහළ වූ කල්හි** මස් පිඩුවක් වැනි එක් පුතෙකු ඇකයෙන් ගෙන, එක් පුතෙකු ඇඟිල්ලෙන් අල්ලාගෙන 'එන්න, දරුව. ඔබගේ පියා මෙතැනින් ගියේ යැ'යි කියා, හිමියා ගිය **මඟින් යන්නී,** ... මැරී වැටී සිටි...ඔහු **දැක**...හඬමින් මග බැස ගියාය. මුළු රාත්‍රියේ වැස්සා වූ වැසි දියෙන් තන මත්තක් පමණට පිරී ගිය අචිරවතී ගඟ **දැක**... දෙටු පුතා මෙතෙරෙහි තබා අනිත් පුතා ගෙන **එතෙරට ගොස්**..."

(ධ.අ.336/අං.නි.අ.195)

**සංලක්ෂ්‍යය**- මෙහි, පටාචාරාව අරුණ නැගී සිටි කල්හිම පහන් ආදි කෘතිම ආලෝකයෙන් නොව, ස්වාභාවික ආලෝකයෙන්ම පොඩි දරු **දෙදෙනෙකු** අරගෙන මගින් ගොස් බාල පුතෙකු ගෙන තන මත්තක් පමණට ගලා බසින ගඟවකට බැස එතෙරට ගියාය. මෙවැනි ගමනක් අඳුරෙහි හෝ පහන් ආදි දැරීමෙන් සිදු වුණා යැයි සිතා නොගත හැකිය. කරුණාකර ඒ මුළු කථාව සඳහන් පොත් බලන්න.

- දුතියං නිදස්සනං -

"තෙ [ගාමවාසිනො] **තං දිවසම්පි අරුණුග්ගමනකාලෙයෙව** 'මය්හං බලිවද්දෙ භවිස්සන්ති...', වෙගෙන තං රුක්ඛමූලං **ගන්ත්වා**, මනුස්සේ නිරොගෙ **දිස්වා**...පුච්ඡිංසු."

- දෙවැනි නිදර්ශනය -

"ඒ [ගම්වැසියෝ] **ඒ දවසේත් අරුණෝද්ගමන කාලයෙහිම** (අරුණුග්ගමනකාලෙයෙව) 'ගොනුන් ලබන්නෙමු...යැ'යි සිතා, වේගයෙන් ඒ ගසේ මුලට **ගොස්**, නිරෝගී මිනිසුන් **දැක** (දිස්වා)... ප්‍රශ්නයක් ඇසූහ." (ජා.අ.i.233)

- තතියං නිදස්සනං -

"අථ ඛො ආයස්මා ච අනුරුද්ධො, ආයස්මා ච ආනන්දො තං **රත්තාවසෙසං** ධම්මියා කථාය වීතිනාමෙසුං. **අථඛො** ආයස්මා අනුරුද්ධො ආයස්මන්තං ආනන්දං ආමන්තෙසිඃ "ගච්ඡාවුසො ආනන්ද! කුසිනාරං පවිසිත්වා කොසිනාරකානං මල්ලානං ආරොචෙහිඃ 'පරිනිබ්බුතො, වාසෙට්ඨා, භගවා... .' - 'එවං භන්තෙ'ති ඛො ආයස්මා ආනන්දො ආයස්මතො අනුරුද්ධස්ස පටිස්සුත්වා කුසිනාරං පාවිසි."

- තෙවැනි නිදර්ශනය -

"ඉක්බිති ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ ද, ආයුෂමත් ආනන්ද තෙරණුවෝ ද **ඒ රාත්‍රියෙහි ඉතුරු කොටස** (රත්තාවසෙසං) දැහැමි කථාවෙන් ගෙවූහ. **ඉක්බිති** ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ ආයුෂ්මත් ආනන්ද තෙරුන් ඇමතූහඃ 'ඇවැත්නි ආනන්ද, යව! කුසිනාරාවට පිවිස කුසිනාරා වැසි මල්ලවයන්ට මෙසේ කියවඃ 'වාසෙට්ඨයනි, භාග්‍යවතුන් වහන්සේ පිරිනිවියාය...' - 'එසේය ස්වාමීනි'යි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන්ට පිළිවදන් අස්වා කුසිනාරාවට පිවිසියහ." (දී.නි.ii.250)

තදට්ඨකථායං :

"තත්‍ථ '**රත්තාවසෙසන්**'ති: බලවපච්චූසෙ[1] පරිනිබ්බුතත්තා, රත්තියා අවසෙසං, චූල්ලකාද්ධානං. තෙසං හි තං කථං කථෙන්තානං මුහුත්තෙනෙව **අරුණං උග්ගච්ඡි**."

එම අටුවාවෙහිඃ

"එහි '**රාත්‍රියෙහි ඉතුරු කොටස**' (රත්තාවසෙසං) යනුඃ[භාග්‍යවතුන් වහන්සේ] බලවත් ප්‍රත්‍යූෂ කලයේදී[1] පිරිනිවී බැවින්, රාත්‍රියෙහි ඉතුරු කෙටි වේලාවක් (චූල්ලකද්ධානං) යනුයි. උන්වහන්සේලා ඒ කථා කරන අතර, මොහොතකින්ම **අරුණ නැංගේය** (අරුණං උග්ගච්ඡි).

1. '**බලවපච්චූස**' යනුඃරාත්‍රියේ පශ්චිම යාමයේ අරුණෝද්ගමනයට ඉතා ආසන්න කාලයයි. කරුණාකර 26 පිටේ, 1 අධෝලිපිය බලන්න.

'**අථ ඛො**'ති : අරුණුග්ගං දිස්වාව ථෙරො ථෙරං එතදවොච: 'ගච්ඡාවුසො ආනන්ද !...'

'**ඉක්බිති**' යනු අරුණෝද්ගමනය *(අරුණුග්ගං)* දැකම *(දිස්වාව)* ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ ආයුෂ්මත් ආනන්ද තෙරුන්ට : "ඇවැත්නි ආනන්ද, යව!..." [යනාදිය] පැවසූහ."

(දී.නි.අ.418)

එවං, අරුණුග්ගං දිස්වාව ඉමස්මිං යෙව කාලෙ ගමනං පකතියා භබ්බං හොති. තං කිස්ස හෙතු? වීතිවත්තෙ හි රත්තාවසෙසෙ රත්ති විභායති. වුත්තං හෙතං :

මෙසේ, අරුණෝද්ගමනය දැකම මේ වේලාවේ ම ගමන් යාම ස්වාභාවික ලෙස කළ හැක. කුමක් හෙයින් ද යත්? රාත්‍රියෙහි ඉතුරු කොටස *(රත්තාවසෙසං)* ගෙවෙද්දී රාත්‍රි එළිවන බැවිනි *(රත්ති විභායති)*. මෙය මෙසේ කියන ලදී :

"රාජා [පසෙනදි කොසලො]...**තං රත්තාවසෙසං** දුක්ඛෙන වීතිනාමෙත්වා **විභාතාය රත්තියා** පුරොහිතං පක්කොසාපෙත්වා තං පවත්තිං කථෙසි."

"[පසේනදි කොසොල්] රජ තෙමේ...ඒ **රාත්‍රියෙහි ඉතුරු කොටස** *(රත්තාවසෙසං)* දුකින් ගත කොට, **රාත්‍රිය එළි වූ කල්හි** *(විභාතාය රත්තියා)* පුරෝහිතයා කැඳවා ගෙන ඒ සිද්ධිය කියේය."

(පෙ.ව.අ.201)

පුන ච පරං, වීතිවත්තෙ බලවපච්චූසෙ පුන දිවසො ආරභති. තස්මා ගමනං පකතියා භබ්බං හොති. වුත්තඤ්හෙතං :

තවද, බලවත් ප්‍රත්‍යූෂ කාලය ගෙවෙද්දී ඊළඟ දවස *(පුන දිවසො)* ආරම්භ වේ. එබැවින් ගමන් යාම ස්වාභාවික ලෙස කළ හැක. මෙය ද මෙසේ කියන ලදී :

"භගවා **බලවපච්චූසසමයෙ**...බුද්ධචක්ඛුනා ලොකං ඔලොකෙන්තො...ඤාණජාලං පත්ථරි... 'ධම්මයාගො මහා භවිස්සතී'ති ඤත්වා, **පුන දිවසෙ** කතසරීරපටිජග්ගනො මහාභික්ඛුසඞ්ඝපරිවුතො සාවත්ථිං පිණ්ඩාය පවිසිත්වා... ."

"භාග්‍යවතුන් වහන්සේ **බලවත් ප්‍රත්‍යූෂ කාලයේදී** 'බුදු ඇසින් ලොව බලන සේක්, ඤාණ දැල පැතිරවූහ... . 'මහත් ධම් යාගයක් සිදු වන්නේය'යි දැනගෙන, **ඊළඟ දවසේ** (පුන දිවසෙ) කරන ලද සිරුරු පිළිදැගුම් ඇතිසේක් උන්වහන්සේ මහාභික්ෂුසඞ්ඝයා පිරිවරා සැවැත් නුවරට **පිඬු පිණිස පිවිස**..."

(ධ.අ.13-14)

තථෙව, සබ්බරත්තියා වීතිවත්තාය පුන දිවසෙ අරුණං උට්ඨාති. තස්මා ගමනං පකතියා අරුණාලොකෙන භබ්බං හොති. වුත්තඤ්චෙතං :

එසේම, මුළු රාත්‍රිය *(සබ්බරත්ති)* ගෙවෙද්දී ඊළඟ දවසෙ *(පුන දිවසෙ)* අරුණ නැගී සිටී. එබැවින් **ගමන් යාම** ස්වාභාවික අරුණාලෝකයෙන් කළ හැක. මෙය ද මෙසේ කියන ලදී :

- චතුත්ථං නිදස්සනං -

"සො [පඨවින්ධරො නාගරාජා]... පදුමුත්තරදසබලං නිමන්තෙත්වා...**සබ්බරත්තිං** සක්කාරසම්මානං සජ්ජෙසි. සත්ථා **පුන දිවසෙ, උට්ඨිතෙ අරුණෙ** අත්තනො උපට්ඨාකං සුමනත්ථෙරං ආමන්තෙසි : "සුමන, **අජ්ජ** තථාගතො දූරං භික්ඛාචාරං ගමිස්සති... ඡළභිඤ්ඤ'ව ආගච්ඡන්තු'ති...සත්ථාරා සද්ධිං සතසහස්සා භික්ඛූ ආකාසං පක්ඛන්දිංසු. පඨවින්ධරො නාගපරියාය සද්ධිං දසබලස්ස පච්චුග්ගමනං ආගතො... භික්ඛුසංඝං ඔලොකෙත්වා... ."

- සිවුවැනි නිදර්ශනය -

"ඒ [පඨවින්ධර නාගරජ තෙමේ]...දශබල වූ පදුමුත්තර බුදුන් වහන්සේ ආරාධනා කොට... **මුළු රාත්‍රියේ** (සබ්බරත්තිං) සත්කාර හා බුහුමන පිළියෙළ කළේය. ශාස්තෘන් වහන්සේ **ඊළඟ දවසේ** (පුන දිවසෙ), **අරුණ නැගී සිටි කල්හි** (උට්ඨිතේ අරුණෙ) තමාගේ උපස්ථායක වූ සුමන තෙරුන් වහන්සේ ඇමතූ සේක. "සුමනයෙනි, **අද දවස** (අජ්ජ) තථාගතයන් වහන්සේ පිඬු පිණිස හැසිරීමට දුර තැනට වඩින්නේය...ජළභිඥ ඇති භික්ෂූහු වඩිත්වා මැනවැ'යි...ශාස්තෘන් වහන්සේ සමග භික්ෂූන් වහන්සේ එක් ලක්ෂයක් අහසට පැන වැඩියාහුය. පඨවින්ධරයා නාපිරිස සමග දශබල වූ බුදුන් වහන්සේ පෙරගමන් කිරීමට පැමිණි...භික්ෂූ සඞ්ඝයා බලා... ."

(අං.නි.අ.142)

- පඤ්චමං නිදස්සනං -

"මහාසත්තෝ...**තං රත්තිං** නිවෙසනෙයෙව සයිත්වා, **පුන දිවසෙ, අරුණුග්ගමනවෙලාය** මාතපිතරො වන්දිත්වා...**නගරා නික්ඛම්ම**.... ."

- පස්වැනි නිදර්ශනය -

"බෝසතාණන් වහන්සේ...**ඒ රාත්‍රියේ** (තං රත්තිං) ගෙයිම නිදගෙන, **ඊළඟ දවසේ** (පුන දිවසෙ), **අරුණෝද්ගමන වේලෙහි** (අරුණුග්ගමනවෙලාය) මවුපියන් වැඳ...**නුවරින් නික්මී**... ."

(ජා.අ.vi.311)

- ඡට්ඨං නිදස්සනං -

"රක්ඛිත්වා කසිණං රත්තිං චූළනීයො මහබ්බලො, **උදෙන්තං අරුණුග්ගම්හි උපකාරිං උපාගමි**."

- සවැනි නිදර්ශනය -

"මහත් බල ඇති චූළනී රජ තෙමේ **මුළු රාත්‍රියේ** (කසිණං රත්තිං) ආරක්ෂාවක් තබා **අරුණෝද්ගමනය සිදු වන කල්හි** (උදෙන්තං අරුණුග්ගම්හි) උපකාරි **නුවරට එළඹියේය**."

(ජා.අ.vii.394)

- සත්තමං නිදස්සනං -

මහාවංසෙ :

106. "වුත්තෙ එවං සඋස්සාහො
බලං සජ්ජිය **රත්තියං**,
**උග්ගතෙ අරුණෙ**
හත්ථිමාරුය්හ කතකම්මකං.

- සත්වැනි නිදර්ශනය -

මහා වංශයෙහි :

106. "මෙසේ කී කල්හි, උත්සාහ ඇත්තා වූ [සේනාපති තෙම] **රාත්‍රියෙහි** සේනාව සකස් කොට, **අරුණ නැගි කල්හි** (උග්ගතෙ අරුණෙ) කරණ ලද කම් ඇති ඇතු පිට නැගී,

107. ද්වාරෙනෙකෙන **නික්ඛම්ම**
පතන්තො අසනී විය
සද්ධිං යොධසහස්සෙහි
සඞ්ගමං'කාසි දුස්සහං."

107. එක දොරටුවකින් **නික්ම**
වැටෙන හෙනක් සෙයින්
යොධයන් දහස් ගණන් සමග
ඉවසිය නො හැකි වූ යුද්ධයක් කෙළේය."[1]
(මහ.වං.චත්තාළීසතිමො පරිච්ඡෙදෙ, 279 පි.)

- අට්ඨමං නිදස්සනං-

"[පුක්කුසාති] කුලපුත්තො...**පුන දිවසෙ, උට්ඨිතෙ අරුණෙ** සරීරපටිජග්ගනං කත්වා පුන සත්ථවාහං **අනුබන්ධති**....එතෙනෙව නියාමෙන අට්ඨහි ඌනකානි ද්වෙයොජනසතානි **ගතො**."

- අටවැනි නිදර්ශනය-

"[පුක්කුසාති] කුලපුත්‍රයා...**ඊළඟ දවසේ** (පුන දිවසෙ), **අරුණ නැඟී සිටි කල්හි** (උට්ඨිතෙ අරුණෙ) සිරුර පිළිදැගුම් කොට නැවත සාත්තු නායකයා ලුහුබඳී.... මේ අයුරින්ම යොදුන් එකසිය අනූ දෙකක් **ගියේය**."
(ම.නි.අ.iv.182)

- නවමං නිදස්සනං -

"[පුක්කුසාති] කුලපුත්තො පත්තචීවරපරියෙසනං **පක්කාමි**. කාය වෙලාය පක්කාමි? **උට්ඨිතෙ අරුණෙ**."

- නවවැනි නිදර්ශනය -

"[පුක්කුසාති] කුලපුත්‍රයා පාසිවුරු සොයන්ට **පිටත් වූයේය**. කවර කාලයේ පිටත් වූයේ ද? **අරුණ නැඟී සිටි කල්හිය** (උට්ඨිතෙ අරුණෙ)."
(ම.නි.අ.iv.182)

මෙතෙක් ප්‍රකාශයට පැමිණි රාත්‍රියේ පශ්චිම යාමය සම්බන්ධ පාළි අධිවචන සටහනකින් මෙසේ දැක්විය හැක:

සටහන 13




1. සිංහලානුවාදය : ශ්‍රී සුමංගල නායක මාහිමි, රත්නාකර මුද්‍රණය, 1967

එහි 'යාමය' යනු: ඉංග්‍රීසි පැය 4 කින් හෝ සිංහල පැය 10 කින් හෝ යුක්ත වූ කාල පරිච්ඡේදයකි.[1]

**චූල්ලකද්ධානං** (කෙටි වේලාවක්) යනු: ටිකක් කාලය, **නාඩිකා දෙක තුන පමණක් වේලාවකි.**"
(*පරිත්තං කාලං, ද්වි-ත්ති-නාඩිකාමත්තං වෙලං.*) (දී.නි.ටී. 420)

'**නාඩිකාව**' යනු: ඉන්දියානු පැයකි. එනම් ඉංග්‍රීසි විනාඩි 24 කි.[2]
'**සිංහල පැයක්**' යනු: යනු ඉංග්‍රීසි විනාඩි 24 කි.[3]
'**නාඩිකා දෙක තුන පමණක් වේලාවකි**' යනු: ඉංග්‍රීසි විනාඩි 48 ක් හෝ 60 ක් හෝ 72 ක් හෝ වේලාවකි.

**2. විභාතාය රත්තියා'පි ගමනස්ස පකතියා හබ්බභාවො**

'*විභාතාමානා රත්ති*', '*විභාතා රත්ති*', '*පභාතා රත්ති*' '*අරුණුග්ගමනං*' 'වා'ති ඉමෙසං පදනං සමානාත්ථො හෙට්ඨා දස්සිතො. ඉධ පන විභාතාය රත්තියා'පි, අරුණුග්ගතසමයෙ විය, ගමනං පකතියා හබ්බභාවො දස්සීයති:

- පඨමං නිදස්සනං -

"අථ තෙ උභො'පි ථෙරා...තං දිවසං තත්ථෙව වසිත්වා, **විභාතාය** ච **රත්තියා** යථාඵාසු-කට්ඨානං **අගමිංසු.**"

- දුතියා නිදස්සනං -

"සත්ථාපි...පච්ඡිමයාමස්ස...තිතියකොට්-ඨාසෙ...බොධනෙය්‍යබන්ධවෙ ඔලොකෙන්-තො...**පභාතාය රත්තියා** කතසරීරපටිජ්ග්-ගනො...මහාභික්ඛුසඞ්සපරිවුතො රාජගහං පිණ්ඩාය පාවිසි."

**2. රාත්‍රිය එළි වූ කල්හිත් (*විභාතාය රත්තියා*) ගමන් යාම ස්වාභාවික ලෙස කළ හැකි බව**

'*විභාතාමානා රත්ති*', '*විභාතා රත්ති*', '*පභාතා රත්ති*' (*රාත්‍රිය එළි වූ කල්හි*) හා '*අරුණුග්-ගමන*' යන පදයන්ගේ සමාන අදහස් ඇති බව යට දක්වන ලදි.[4] මෙහි රාත්‍රිය එළි වූ කල්හිත්, අරුණෝද්ගමනය සිදු වූ කල්හි මෙන්, ගමන් යාම ස්වාභාවික ලෙස කළ හැකි බව දක්වනු ලැබේ:

- පළමුවැනි නිදර්ශනය -

"ඉක්බිති ඒ තෙරුන් වහන්සේ දෙනම...ඒ දවසේ එහිම වැස **රාත්‍රිය එළි වූ කල්හි** (*විභාතාය රත්තියා*) පහසු තැනට **ගියාහුය.**"
(පෙ.ව.අ.10)

- දෙවැනි නිදර්ශනය -

"ශාස්තෘන් වහන්සේ ද...පශ්චිම යාමයෙහි... තුන්වැනි කොටසෙහි ධර්මය අවබෝධ කර-වීමට යොග්‍ය වූ ඥාති ජනයා බලන සේක්...**රාත්‍රිය එළි වූ කල්හි** (*පභාතාය රත්තියා*) කරන ලද සිරුරු පිළිදැගුම් ඇති සේක්...මහාභික්ෂු සඞ්ඝයා පරිවරා රජගහ නුවරට පිඩු පිණිස පිවිසියේය."
(ජා.අ.vi.186)

---

1. 'A SINHALESE - ENGLISH DICTIONARY', C. Carter, M.D. Gunasena, Colombo, 1965
2. ඒ පොතේම 3. ඒ පොතේම: පැය 4. කරුණාකර 29 පිට බලන්න.

- තතියං නිදස්සනං -

"සාවත්ථියං කිර අඤ්ඤතරස්ස වාණිජස්ස භරියාය **පච්චූසවෙලාය** කුච්ඡියං ගබ්භො සණ්ඨාසි. සා තං න අඤ්ඤාසි. වාණිජො **විභාතාය රත්තියා** සකටෙසු භණ්ඩං ආරොපෙත්වා රාජගහං උද්දිස්ස **ගතො**."

- තෙවැනි නිදර්ශනය -

"සැවැත් නුවර වනාහි එක්තරා වෙළෙන්දකුගේ භාර්යාවගේ කුසේ **ප්‍රත්‍යූෂ වේලාවේ** ගැබ් පිහිටියේය. ඕ තොමෝ එය දැන නොගත්තාය. වෙළෙන්ද **රාත්‍රිය එළි වූ කල්හි** (*විභාතාය රත්තියා*) බඩු පටවා රජගහ නුවර දෙස බලා **ගියේය**." (ථෙරී.අ.154-5)

- චතුත්ථං නිදස්සනං -

"පුරොහිතො...[රත්තියං] නක්ඛත්තයොගං උල්ලොකෙන්තො... සන්තිට්ඨානමකාසි. සො **විභාතාය රත්තියා** රඤ්ඤො සන්තිකං **ගතො** සුඛසෙය්‍යං පුච්ඡි."

- සිවුවැනි නිදර්ශනය -

"පුරෝහිතයා...[රාත්‍රියේ] නැකැත් යෝගය බලා සිටිමින්...නිශ්චය කළේය. හේ **රාත්‍රිය එළි වූ කල්හි** (*විභාතාය රත්තියා*) රජතුමා වෙත **ගොස්** සැපසේ නිදීම ප්‍රශ්න විචාළේය." (ථෙර.iii.57)

- පඤ්චමං නිදස්සනං -

මහාවංසෙ:

12. "තතො **පච්චූසකාලම්හි**
දෙවපුත්තං මහිද්ධිකං ...
14. ... සුපිනෙ එවං අද්දක්ඛි ධරණීපති:...
18. පබුජ්ඣිත්වාන සඤ්ජාත-
පීතිවෙගො'ථ **රත්තියා**
**විභාතාය** තතො පුබ්බගාමං
**ගඤ්ඡි** නරුත්තමො."

- පස්වැනි නිදර්ශනය -

මහාවංශයෙහි:

12/14. "ඉක්බිති **ප්‍රත්‍යූෂ කාලයෙහි** මිහිපල් [රජ] තෙමේ මහත් සෘද්ධිමත් දේව පුත්‍රයා සිහිනෙන් දිටී:...

18. පිබිද, හටගත් ප්‍රීතිවෙග ඇත්තේ ඉක්බිත්තෙන් **රාත්‍රිය එළි වූ කල්හි** (*රත්තියා විභාතාය*) රජ තෙමේ එයින් [රජ ගෙයින් නික්ම] පිලගමට **ගියේය**."

(මහා.වං. සට්ඨිතමො පරිච්ඡේදෙ, 346-7 පි.)

- ඡට්ඨං නිදස්සනං -

පුන'පි පටාචාරාත්ථෙරියා වත්ථු:

"සා...[මග්ගෙ] රත්තිං වීතිනාමෙත්වා, **විභාතාය රත්තියා**...සාමිකෙන ගතමග්ගෙන **ගච්ඡන්තී** තං වම්මිකසමීපෙ කාලකතං නිසින්නං **දිස්වා** ...පරිදෙවන්තී... ථනප්පමාණං උදකං සවන්තිං අන්තරාමග්ගෙ නදිං **පත්වා** ...**පරතීරං ගන්ත්වා**..."

- හයවැනි නිදර්ශනය -

නැවත පටාචාර තේරියගේ කථාව:

"ඇය... [පාරේ] රාත්‍රිය ගත කොට, **රාත්‍රිය එළි වූ කල්හි** (*විභාතාය රත්තියා*)...හිමියා ගිය මගින් **යන්නී** තුඹස සමීපයෙහි මැරුණු ඔහු **දැක**...හඬමින්...අතරමගදී තන මත්තක් පමණට ගලා බසින ගංගාවකට **පැමිණ**... **පරතෙරට ගොස්**... ." (ථෙරී.අ.87)

- සත්තමං නිදස්සනං -

"සාකෙතවාසිනො...**විභාතාය රත්තියා** මාලාගන්ධාදීනි ගහෙත්වා භගවතො සන්තිකං **ගන්ත්වා** පූජනවන්දනසම්මොදනාදීනි කත්වා පරිවාරෙත්වා අට්ඨංසු."

- සත්වැනි නිදර්ශනය -

"සාකෙත නගරවැසියෝ... **රාත්‍රිය එළි වූ කල්හි** (*විභාතාය රත්තියා*) මල් සුවඳ ආදිය ගෙන භාග්‍යවතුන් වහන්සේ වෙත **ගොස් පිදීම්** වැඳීම් සතුටු සාමීචි කථා කිරීම් ආදිය කොට උන්වහන්සේ පිරිවරා ගෙන සිටියාහුය." (සු.නි.අ.427)

3. **පුන දිවසෙ, අරුණුග්ගතෙ, පභාතාය රත්තියා සරීරපටිජග්ගනාදීනි පකතියා හබ්බභාවො**

3. **ඊළඟ දවසේ, අරුණෝද්ගමනය සිදු වූ කල්හිත්, රාත්‍රිය එළි වූ කල්හිත් සිරුරු පිළිදැගුම් ආදි ස්වාභාවික ලෙස කළ හැකි බව.**

- පඨමං නිදස්සනං -

"කුලපුත්තො [පක්කුසාති]... **පුන දිවසෙ, උට්ඨිතෙ අරුණෙ සරීරපටිජග්ගනං කත්වා** පුන සත්ථවාහං අනුබන්ධති."

- පළමුවැනි නිදර්ශනය -

"[පුක්කුසාති] කුලපුත්‍රයා... **ඊළඟ දවසේ** (*පුන දිවසෙ*), **අරුණ නැගී සිටි කල්හි** (*උට්ඨිතෙ අරුණෙ*) **සිරුරු පිළිදැගුම්** කොට නැවත සාත්තු නායකයා අනුව යයි." (ම.නි.අ.iv.182)

- දුතියං නිදස්සනං -

"සත්ථා... **පභාතාය රත්තියා කතසරීරපටිජග්ගනො**... රාජගහං පිණ්ඩාය පාවිසි."

- දෙවැනි නිදර්ශනය -

"ශාස්තෘන් වහන්සේ... **රාත්‍රිය එළි වූ කල්හි** (*පභාතාය රත්තියා*) **කරණ ලද සිරුරු පිළිදැගුම් ඇති සේක්**... රජගහ නුවරට පිඬු පිණිස පිවිසියේය." (ජා.අ.v.186)

- තතියං නිදස්සනං -

"භගවා...**පුන දිවසෙ කතසරීරපටිජග්ගනො**... සාවත්ථිං පිණ්ඩාය පාවිසි."

- තෙවැනි නිදර්ශනය -

"භාග්‍යවතුන් වහන්සේ...**ඊළඟ දවසේ** (*පුන දිවසෙ*) **කරන ලද සිරුරු පිළිදැගුම් ඇති සේක්**...සැවැත් නුවරට පිඬු පිණිස පිවිසි සේක." (ධ.අ.13-14)

- චතුත්ථං නිදස්සනං -

"භගවතො...සමාධිතො උට්ඨානදිවසෙ **අරුණුග්ගමනවෙලායමෙව** 'භොජනකිච්චෙන භවිතබ්බන්'ති ඤත්වා සක්කො දෙවරාජා ඔසධහරීටකං උපනෙසි. භගවා තං පරිභුඤ්ජි. පරිභුත්තමත්තස්සෙව සරීරකිච්චං අහොසි. සක්කො මුඛොදකං අදාසි. භගවා මුඛං

- සිවුවැනි නිදර්ශනය -

"භාග්‍යවතුන්වහන්සේට... සමාධියෙන් නැගි දවසේ **අරුණෝද්ගමන වේළෙහිම** (*අරුණුග්ගමනවෙලායමෙව*) 'බොජුන් කිස වියයුතු යැ'යි දැනගෙන සක්දෙව්රජ ඕෂධි අරළු පිළිගන්විය. භාග්‍යවතුන්වහන්සේ එය වැළඳූ සේක. වළඳන ලද පමණකින්ම සිරුරු කිස

ධොවිත්වා තස්මිං යෙව රුක්ඛමූලෙ නිසීදි."

විය. සක්දෙව්රජ **මුව දෙනා පැන්** (මුඛොදකං) දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ මුව සෝද එම [රාජායතන] ගසේ මුල වැඩ හුන් සේක."
**(වින.අ.iii.719)**

- පඤ්චමං නිදස්සනං -

"පාරිලෙය්‍යකහත්ථිනාගො...රත්තිං...'සත්ථාරං රක්ඛිස්සාමී'ති යාව අරුණුග්ගමනා වනසණ්ඩස්ස අන්තරන්තරෙන විචරති... **අරුණෙ උග්ගතෙ** සත්ථුනො **මුඛොදකදානං** ආදිං කත්වා තෙනෙව උපායෙන සබ්බවත්තානි කරොති."

- පස්වැනි නිදර්ශනය -

"පාරිලෙය්‍යක ඇත් රජ ... රාත්‍රියේ 'ශාස්තෘන් වහන්සේ රකින්නෙමි'යි සිතා අරුණෝද්ගමනය වනතුරු වනය තුළ අතරතුර හැසිරෙයි... **අරුණ නැගි කල්හි** (අරුණෙ උග්ගතෙ) ශාස්තෘන් වහන්සේට **මුව දෙනා පැන් දීම** (මුඛොදකදානං) ආදි කොට, ඒ ක්‍රමයෙන්ම සියලු වත් කරයි." (ධ.අ.29-30)

එවං භගවා:

**පුන දිවසෙ, අරුණෙ උග්ගතෙ = පභාතාය රත්තියා** සරීරං පටිජග්ගති, මුඛොදකදානාදිං පටිග්ගණ්හති.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ:

**ඊළඟ දවසේ** (පුන දිවසෙ) **අරුණ නැගි කල්හි** (අරුණෙ උග්ගතෙ) = **රාත්‍රිය එළි වූ කල්හි** (පභාතාය රත්තියා) සිරුරු පිළිදැගුම් කරති, මුඛෝදක දානාදිය පිළිගනිති.

## පස්වැනි පරිච්ඡේදය

# අරුණෝද්ගමනය හා කාල-විකාල භෝජන භේදය

"රත්තිං න භුඤ්ජෙය්‍ය විකාලභොජනං." (සු.නි.120)

### I. කාලභොජනං

අරුණුග්ගතසමයෙ

(i) රත්තියා ඛීයමානත්තා,

(ii) සාමන්තප්පදෙසෙ පකතාලොකස්ස පත්ථරනත්තා,

(iii) රත්තියා විභායමානත්තා,

(iv) පුන දිවසස්ස ආරභමානත්තා ච

භොජනං භුඤ්ජිතුං යාව මජ්ඣන්තිකා සක්කා. ඉදං 'කාලභොජනන්'ති වුච්චති. වුත්තඤ්හෙතං:

"**කාලභොජනං** නාම: අරුණුග්ගමනතො යාව මජ්ඣන්තිකා."

තථෙව :

"අරුනුග්ගමනකාලතො පට්ඨාය යාව මජ්ඣන්තිකා, අයං බුද්ධාදීනං අරියානං ආචිණ්ණසමාචිණ්ණො භොජනස්ස කාලො නාම. තදඤ්ඤෙ විකාලො."

### I. කාල භෝජනය

අරුණෝද්ගමනය සිදු වූ කල්හි

(i) රාත්‍රිය (අඳුර) ගෙවී යන බැවින් ද,

(ii) අවට පරිසරයේ ස්වාභාවික ආලෝකය පැතිරෙන බැවින් ද,

(iii) රාත්‍රිය එළි වන බැවින් ද,

(iv) ඊළඟ දවස ආරම්භ වන බැවින් ද,

භෝජනය අනුභව කරන්ට මධ්‍යාහ්නය වන තුරු කළ හැක. මෙය 'කාල භෝජනය' යැයි කියනු ලැබේ. එය මෙසේ කියන ලදි:

"**කාල භෝජනය** නම්: අරුණෝද්ගමනයෙහි සිට මධ්‍යාහ්නය වන තුරු."

(වින.වි.ටී.1.478; පා.යො.78)

එසේම :

"අරුණෝද්ගමන කාලයෙහි සිට මධ්‍යාහ්නය වන තුරු මෙය බුද්ධාදී ආර්යයාන්ගේ පුරුදු කළ, මනාසේ පුරුදු කළ භෝජනයේ කාලය නම් වේ. එයින් අන්‍ය විකාලයයි."

(දී.නි.ටී.87; ම.නි.ටී.2.158; සං.නි.ටී.2.547; අං.නි.ටී.2.177)

### II. විකාලභොජනං

විකාලභොජනං භගවතා එවං පටික්ඛිත්තං :

"යො පන භික්ඛු විකාලෙ ඛාදනියං වා භොජනියං වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා, පාචිත්තියං."

තත්ථ:

"**විකාලො** නාම: මජ්ඣන්තිකෙ වීතිවත්තෙ යාව අරුණුග්ගමනා."

### II. විකාල භොජනය

විකාල භෝජනය භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ ප්‍රතික්ෂේප කරන ලදි :

"යම් මහණෙක් විකාලයෙහි කෑ යුතු දෙයක් හෝ බුදිය යුතු දෙයක් හෝ කා නම් හෝ බුදී නම් හෝ පචිති [ඇවතක්] වේ යැයි."

(පා.වි.i.238)

එහි:

"**විකාලය** නම් : මධ්‍යාහ්නය ඉක්ම ගිය කල්හි සිට අරුණෝද්ගමනය වන තුරු *(යාව අරුණුග්ගමනා)*."

ඉහත තොරතුරු සටහනකින් මෙසේ දැක්විය හැක:

සටහන 14




## I. කාලභොජනං

**අරුණෙ උග්ගතෙ භොජනං භුඤ්ජිතුං භබ්බභාවො**

- පඨමං නිදස්සනං -

"**උග්ගතෙ අරුණම්හි**...පටිග්ගහෙසි භගවා පච්චග්ඝෙ සෙලමයෙ පත්තෙ මන්ථඤ්ච මධුපිණ්ඩිකඤ්ච./පටිග්ගහෙත්වා ච පරිභුඤ්ජි."

## I. කාල භෝජනය

**අරුණෝද්ගමනය සිදු වූ කල්හි භෝජනය අනුභව කරන්ට හැකි බව**

- පළමුවැනි නිදර්ශනය -

"**අරුණ නැගි කල්හි** (*උග්ගතෙ අරුණම්හි*)... භාග්‍යවතුන් වහන්සේ අලුත් වූ ශෛලමය පාත්‍රයෙහි අත්සුණු ද මී අග්ගලාව ද පිළිගත් සේක./පිළිගෙන අනුභව කළ සේක."

(වින.අ.iii.719-720/ම.ව.i.8)

- දුතියං නිදස්සනං -

"පාරිලෙය්‍යකහත්ථිනාගො... රත්තිං...'සත්ථාරං රක්ඛිස්සාමී'ති යාව අරුණුග්ගමනා වනසණ්ඩස්ස අන්තරන්තරෙන විචරති...**අරුණෙ උග්ගතෙ** සත්ථුනො **මුඛොදකදානං ආදිං** කත්වා තෙනෙව උපායෙන සබ්බවත්තානි කරොති."

- දෙවැනි නිදර්ශනය -

"පාරිලෙය්‍යක ඇත් රජ... රාත්‍රියේ (*රත්තියා*) ...'ශාස්තෘන් වහන්සේ රකින්නෙමි'යි සිතා අරුණෝද්ගමනය වන තුරු (*යාව අරුණුග්ගමනා*) වනය තුළ අතරතුර හැසිරෙයි.... **අරුණ නැගි කල්හි** (*අරුණෙ උග්ගතෙ*) ශාස්තෘන් වහන්සේට **මුඛෝදක දනය ආදි කොට**, ඒ ක්‍රමයෙන්ම සියලු වත් කරයි.'

(ධ.අ.29-30)

එත්ථ '**මුඛොදකදානං ආදිං කත්වා**'ති :-
"භගවතො මුඛධොවනං දෙති, නහානොදකං ආහරති, දන්තකට්ඨං දෙති, අරඤ්ඤතො මධුරානි ඵලානි ආහරිත්වා සත්ථු උපනෙති. සත්ථා **තානි පරිභුඤ්ජති**."

මෙහි '**මුඛෝදක දනය ආදි කොට**' යනු :-
"භාග්‍යවතුන් වහන්සේට මුව දෝනා පැන් දෙයි, නෑමට පැන් ගෙන දෙයි, දැහැටිය දෙයි, කැලෑවෙන් මිහිරි ගෙඩි ගෙන අවුත් ශාස්තෘන්වහන්සේට පිළිගන්වයි. ශාස්තෘන්-

වහන්සේ ඒවා අනුභව කරන සේක."

(උදා.අ.168)

## II. විකාලභොජනං

**අරුණස්ස අනුග්ගතත්තා රත්තියා අන්ධකාරෙ** භොජනං භුඤ්ජිතුං අභබ්බභාවො

## II. විකාල භෝජනය

**අරුණෝද්ගමනය නොසිදු වූ බැවින් රාත්‍රියේ අඳුරෙහි** භෝජනය **අනුභව කිරීම නොකළ හැකි** බව

- නිදස්සනං -

"රාජගහෙ... සත්තරසවග්ගියා [භික්ඛූ] **රත්තියා පච්චූසසමයං** පච්චුට්ඨාය රොදන්ති: 'යාගුං දෙථ, භත්තං දෙථ,...' භික්ඛූ එවං **ආහංසු**: 'ආගමෙථ, ආවුසො, යාව [**රත්ති**][1] **විභායති**. සචෙ යාගු/භත්තං භවිස්සති, **පිවිස්සථ**/ භුඤ්ජිස්සථ'."

- නිදර්ශනය -

"රජගහ නුවර...සත්තරසවර්ගිය [භික්ෂූහු] **රාත්‍රියේ ප්‍රත්‍යූෂ කාලයේ** (*රත්තියා පච්චූසසමයං*) නැගිට: 'කැඳ දෙව්, බත් දෙව්,...' ය'යි හඬත්. භික්ෂූහු මෙසේ කීහ: 'ඇවැත්නි, [**රාත්‍රිය**][1] **එළි වන තුරු** (*යාව රත්ති විභායති*) බලාපොරොත්තු වව්, ඉවසව්. ඉදින් කැඳ/බත් තිබේ නම් පානය කරව්/අනුභව කරව්."

(පා.වි. i.348; ම.ව. 190)

**රත්තියා** පච්චූසසමයං අන්ධකාරො යෙව. **දීපාලොකෙන** විනා රූපානි න පඤ්ඤායන්ති. **වුත්තං** හෙතං:-

රාත්‍රියේ ප්‍රත්‍යූෂ කාලයේ තවම අඳුරුයි, කළුවරයි. පහන් එළියෙන් නැතුව රූප නොපෙනේ. මෙය මෙසේ කියන ලදි:-

"**සො** [බ්‍රාහ්මණො] **පච්චූසකාලෙ** පබුජ්ඣිත්වා **දීපාලොකෙන** අලඞ්කතසිරිගබ්භං **ඔලොකෙන්තො** මහන්තං යසං **දිස්වා**... **චින්තෙසි**..."

"ඒ [බ්‍රාහ්මණ තෙමේ] **ප්‍රත්‍යූෂ කාලයේ** අවදිව **පහන් එළියෙන්** (*දීපාලොකෙන*) අලඞ්කාර කළ රජු නිදන කාමරය බලමින් මහත් වූ සම්පත **දැක** (*දිස්වා*)... මෙසේ සිතිය..."

(ජා.අ. vii.348)

අපිච '**රත්ති**' නාම විකාලභොජනසමයෙ **සමොධානං** ගච්ඡති. වුත්තඤ්හෙතං භගවතා:

තවද '**රාත්‍රිය**' නම් විකාල භෝජන කාලයට ඇතුළත්ය. ඒ කරුණ භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ වදාරණ ලදි:

"ඉඞ්ඝ තුම්හෙ, භික්ඛවෙ, එතං රත්තිං විකාලභොජනං පජහථ."

"මහණෙනි, තොපි ඒ රාත්‍රියේ විකාල භෝජනය දුරු කරව්." (ම.නි. ii.192)

"එකභත්තිකො, රත්තූපරතො විකාලභොජනා."

"එක් බතක් වළඳනුයේ, රාත්‍රියේ විකාල භෝජනයෙන් වැළකුනේ වෙයි, වෙන් වූයේ වෙයි." (අ.නි. ii. 376)

"රත්තිං න භුඤ්ජෙය්‍ය විකාලභොජනං."

"රාත්‍රියේ විකාල භෝජනය අනුභව නො කරන්නේය." (සු.නි. 120)

---

1. 'යාව රත්ති විභායති' යන මරම්ම ඡට්ඨ සංගීති පොත්වල එසේ මුද්‍රණ කළ තිබේ.

රත්තියා ලක්ඛණං නාම අන්ධකාරො, තමො'ති. තස්මා:

රාත්‍රියේ ලක්ෂණය නම් අඳුර, අන්ධකාරය, කළුවර යනුයි. එබැවින්:

**"රත්තිං න භුඤ්ජෙය්‍ය විකාලභොජනන්'ති** අන්ධකාරෙ න භුඤ්ජෙය්‍ය විකාලභොජනන්'ති අත්ථො.

**"රාත්‍රියේ විකාල භෝජනය අනුභව නොකරන්නේය** යනු: "අඳුරෙහි, අන්ධකාරයෙහි විකාල භෝජනය අනුභව නොකරන්නේය" යන අර්ථයයි.

'විකාලභොජනං' නාම "මජ්ඣන්තිකෙ වීතිවත්තෙ **යාව අරුණුග්ගමනා**"ති, උපරි වුත්තං. තස්මා:

'විකාල භෝජනය' නම් "මධ්‍යාහ්නය ඉක්ම ගිය කල්හි සිට **අරුණෝද්ගමනය වන තුරු**" යැයි ඉහත කියන ලදි. එබැවින්:

**"ආගමෙථ, ආවුසො, යාව රත්ති විභායතී'ති"** :-

**"ඇවැත්නි, රාත්‍රිය එළි වන තුරු බලාපොරොත්තු වව්"** යනු:

"ආගමෙථ, ආවුසො, **යාව අරුණුග්ගමනා**'ති" අත්ථො.

"ඇවැත්නි, **අරුණෝද්ගමනය වන තුරු** බලාපොරොත්තු වව්" යන අර්ථයයි.

විභාතමානාය හි රත්තියා අරුණුග්ගමනං හොති. වුත්තඤ්හෙතං:

රාත්‍රිය එළි වූ කල්හි වනාහි අරුණෝද්ගමනය ද සිදු වෙයි. මෙය ඉහත මෙසේ කියන ලදි:

"විභාතමානාය පන රත්තියා ...අරුණුග්ගමනඤ්ච එතක්ඛණෙ යෙව අහොසි."

"රාත්‍රිය එළි වූ කල්හි වනාහි ... අරුණෝද්ගමනය ද එකවරම සිදු විය."[2] (ධ.අ.83)

තවද අරුණෝද්ගමනයෙහි සිට පහන් ආදි කෘතිම එළියෙන් නොව, ස්වාභාවික එළියෙන්ම දනය ගැනීමට දන ශාලාවට ඇතුල් වන කාලය ගැන ඉහත තිම් රජුගේ වයඹ කථාවෙහි ප්‍රකාශ විය. එබැවිනුත්: "ඇවැත්නි, රාත්‍රිය එළි වන තුරු, ස්වාභාවික එළිය වන තුරු, අරුණෝද්ගමනය වන තුරු බලාපොරොත්තු වව්, ඉවසව්. ඉදින් කැඳ/බත් තිබේ නම් පානය කරව්/අනුභව කරව්" යන අර්ථයයි.

## I. කාලභොජනං

## I. කාල භෝජනය

### 1. විභාතාය රත්තිය භොජනං භුඤ්ජිතුං භබ්බභාවො

### 1. රාත්‍රිය එළි වූ කල්හි භෝජනය අනුභව කරන්ට හැකි බව

- පඨමං නිදස්සනං -

- පළමුවැනි නිදර්ශනය -

"භගවා පච්චූසසමයං පච්චුට්ඨාය ...බුද්ධචක්ඛුනා ලොකං ඔලොකෙන්තො ... **විභාතාය රත්තියා පුරෙභත්තකිච්චං කත්වා**... තස්ස යක්ඛස්ස භවනං පාවිසි."

"භාග්‍යවතුන් වහන්සේ ප්‍රත්‍යුෂ කාලයේ නැගිට ... බුදු ඇසින් ලොව බලන සේක්... **රාත්‍රිය එළි වූ කල්හි** (*විභාතාය රත්තියා*) **පෙරබත් කිස [වැළඳීම් ආදි]** කොට ... ඒ යක්ෂයාගේ නිවාසයට පිවිසියේය."

(සං.නි.අ.i.24; සු.නි.අ.163)

2. කරුණාකර 29 පිට ***විභාතමානා රත්ති*** හා ***අරුණුග්ගමන*** යන මේ පදයන්ගේ සමාන අදහස් ඇති බව බලන්න.

තත්ථ:
"**පුරෙභත්තන්**'ති: අරුණුග්ගමනං උපාදය යාව මජ්ඣන්තිකං."

එහි:
"**පෙරබත (පුරෙභත්තං)** යනු: අරුණෝද්ගමනයෙහි පටන් *(අරුණුග්ගමනං උපාදය)* මධ්‍යාහ්නය වන තුරු." (පා.වි.ii.170)

එවං භගවා අරුණුග්ගතසමයෙ පුරෙභත්තකිච්චං අකාසී'ති අත්ථො.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ අරුණෝද්ගමනය සිදු වූ කල්හි පෙරබත් කිස කළ සේක යන අර්ථයයි.

- දුතියං නිදස්සනං -

"මනුස්සා... **විභාතාය රත්තියා** බුද්ධපමුඛස්ස භික්ඛුසඞ්ඝස්ස **මහාදානං** සජ්ජෙත්වා සත්ථාරං භික්ඛුසඞ්ඝඤ්ච නිමන්තෙත්වා පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන පරිවිසිත්වා භගවන්තං... තං පවත්තිං පවෙදෙසුං"

- දෙවැනි නිදර්ශනය -

"මිනිස්සු... **රාත්‍රිය එළි වූ කල්හි** *(විභාතාය රත්තියා)* බුදුන් ප්‍රමුඛ වූ භික්ෂුසඞ්ඝයාට **මහත් දනය** පිළියෙළ කොට ශාස්තෘන් වහන්සේ ද භික්ෂුසඞ්ඝය ද ආරාධනා කොට ප්‍රණීත වූ කෑ යුතු දේ හා බුදිය යුතු දේ වලඳවා භාග්‍යවතුන් වහන්සේට... ඒ සිද්ධිය ගැන දැනුම් දුන්හ." (පෙ.ව.අ.199)

- තතියං නිදස්සනං -

[විභාතාය රත්තියා අනන්තරං භොජනං භුඤ්ජිතුං පකතිචාරිත්තභාවො:]

- තෙවැනි නිදර්ශනය -

[රාත්‍රිය එළි වුණාට පසු භෝජනය පිළිගන්වන්ට හා අනුභව කරන්ට ස්වාභාවික සිරිතක් ඇති බව:]

"රාජා **විභාතාය රත්තියා** චතුසට්ඨිමත්තෙ බ්‍රාහ්මණපාමොක්ඛෙ පක්කොසාපෙත්වා ...නිසින්නානං බ්‍රාහ්මණානං සප්පිමධුසක්ඛරාභිසංඛතස්ස වරපායාසස්ස...අදාසි."

"රජ තෙමේ **රාත්‍රිය එළි වූ කල්හි** *(විභාතාය රත්තියා)* හැට හතරක් පමණ බ්‍රාහ්මණ නායකයන් කැඳවා ගෙන... වැඩ හුන්නාවූ බ්‍රාහ්මණයන්ට ගිතෙල්, මීපැණි හා උක් හකුරුවලින් පිළියෙල කළ උතුම් **කිරිබත්** දුන්නේය." (දී.නි.අ.288)

**2. කාලස්සෙව යාගු ආදිං භොජනං භුඤ්ජිතුං භබ්බභාවො**

**2. 'කාලස්සෙව' (ඉර උදවට කලින්ම) යන මේ කාලපරිච්ඡේදයෙදී කැඳ ආදී භෝජන අනුභව කරන්ට හැකි බව**

- නිදස්සනං -

"සද්ධිවිහාරිකෙන, භික්ඛවෙ, උපජ්ඣායම්හි සම්මා වත්තිතබ්බං. තත්‍රායං සම්මාවත්තනා: **කාලස්සෙව වුට්ඨාය**...දන්තකට්ඨං දාතබ්බං. මුඛොදකං දාතබ්බං. ආසනං පඤ්ඤපෙතබ්බං. සචෙ යාගු හොති භාජනං ධොවිත්වා යාගු

- නිදර්ශනය -

"මහණෙනි, සද්ධිවිහාරිකයා විසින් උපාධ්‍යායයන් කෙරෙහි මනාව පැවතියයුතු. මේ ඒ මනා පැවැත්ම යැ: '**ඉර උදවට කලින් ම**' *(කාලස්සෙව)* නැගී සිට... උපාධ්‍යායයාට දැහැටි දියයුතු. මුව දෝනා පැන් **(මුඛොදකං)**

උපනාමෙතබ්බා. **යාගුං පීතස්ස** උදකං දත්වා භාජනං පටිග්ගහෙත්වා... ධොවිත්වා පටිසා-මෙතබ්බං."

දියයුතු. අඳුන් පැනවියයුතු. **කැඳ** ඇත්නම් බඳුන සෝද **කැඳ** එළවියයුතු. **කැඳ පුවාහට** පැන් දී බඳුන පිළිගෙන... සෝද තැන්පත් කළයුතු." (ම.ව.i.96 ; චූ.ව.ii.376)

තත්ථ 'කාලස්සෙවා'ති අයං කාලපරිච්ඡෙදෙ,
(i) අරුණුග්ගමනානන්තරං, අථවා
(ii) විභාතාය රත්තියා අනන්තරං ච
(iii) සූරියුග්ගමනතො පුබ්බෙ වා'ති
එත්ථන්තරෙ හොති. උදහරණවසෙන ඉධ තීණි නිදස්සනානි දස්සීයන්ති:

එහි **'කාලස්සෙව'** යන මේ කාලපරිච්ඡේදය,
(i) අරුණෝද්ගමනයට පසු, නැතහොත්
(ii) රාත්‍රිය එළි වුණාට පසු, හා
(iii) ඉර උදවට පෙර
යන මේ අතරතුර සිදු වේ. උදහරණ වශයෙන් මෙහි නිදර්ශන තුනක් දක්වනු ලැබේ:

**(i) 'කාලස්සෙව' අරුණුග්ගමනාන්තරං සිද්ධභාවො**

- නිදස්සනං -

"තස්මිං කන්තාරෙ සුඛුමවාලිකා... සූරියුග්ගමණතො පට්ඨාය අඞ්ගාරරාසි විය උණ්හා හොති, නසක්කා අක්කමිතුං. තස්මා තං පටිපජ්ජන්තා... රත්තිමෙව ගන්ත්වා **අරුණුග්ගමණෙ** සකටානි පරිවත්තං කත්වා, මත්ථකෙ මණ්ඩපං කාරෙත්වා, **කාලස්සෙව ආහාරකිච්චං නිට්ඨාපෙත්වා** ඡායාය නිසින්නා... අත්ථංගතෙ සූරියෙ... භූමියා සීතලාය ජාතාය... ගච්ඡන්ති."

**(i) 'කාලස්සෙව' අරුණෝද්ගමනයට පසු සිදුවන බව**

- නිදස්සනං -

"ඒ කාන්තාරයෙහි සියුම් වැලි... ඉර උදාව පටන් අඟුරු රාශියක් මෙන් රත් වූයේ වේ. පාගන්ට නො හැකි වේ. එබැවින් ඒ කාන්තාරයෙහි ගමන් කරන්නෝ... රාත්‍රියේම පිටත්ව **අරුණෝද්ගමනයෙහිදී** (අරුණුග්ගමණෙ) ගැල් වටය කොට තබා උඩ මණ්ඩප්පය කරවා **'ඉර උදවට කලින්ම'** (කාලස්සෙව) **ආහාර කිස ඉවර** කොට සෙවනැල්ලේ හුන්නාහු... ඉර බැස ගිය කල්හි... බිම සිසිල් වූ කල්හි... පිටත් වෙති."
(ජා.අ.i.100)

**(ii) 'කාලස්සෙව' විභාතාය රත්තියා අනන්තරං සිද්ධභවො**

- නිදස්සනං -

"තයො ඛීණාසවත්ථෙරා... අන්තරා මග්ගෙ **සායං**... උච්ඡුක්ඛෙත්තසමීපං ගන්ත්වා... තත්ථ වසිංසු. අථ [උච්ඡුපාලො] **විභාතාය රත්තියා**, **කාලස්සෙව** භත්තං පචිත්වා දන්තකට්ඨඤ්ච මුඛොදකඤ්ච දත්වා සහ උච්ඡුරසෙන භත්තං අදසි. තෙසං භුඤ්ජිත්වා අනුමොදනං කත්වා ගච්ඡන්තානං එකෙකං උච්ඡුං අදසි."

**(ii) 'කාලස්සෙව' රාත්‍රිය එළි වුණාට පසු සිදු වන බව**

- නිදර්ශනය -

"රහතුන් වහන්සේලා තුන් නමක්... අතර මගදී **සවස් කාලයේ**... උක් කුඹුර සමීපයට ගොස්... එහි විසූහ. ඉක්බිති [ඉක්ෂු පාලකයා] **රාත්‍රිය එළි වූ කල්හි** (*විභාතාය රත්තියා*), **'ඉර උදවට කලින්ම'** (කාලස්සෙව) බත් උයා දැහැටි ද මුව දෝනා පැන් ද (*මුඛොදකං*) දී උක් යුෂය සමග බත් දුන්නේය. එය අනුභව කොට, අනුමෝදන් කොට වඩින්නාවූ උන්වහන්සේලාට එක් එක් උක් ගසක් දුන්නේය."
(වි.ව.අ.206)

**(iii) 'කාලස්සෙව' සුරියුග්ගමනතො පුබ්බෙ සිද්ධභාවො**

- නිදස්සනං -

"බ්‍රාහ්මණා...සාවකං එවං සමාදපෙන්ති: 'එහි ත්වං, අම්භො පුරිස, **කාලස්සෙව උට්ඨායන්තො**'ව සයතම්හා පඨවිං ආමසෙය්‍යාසි. නො චෙ පඨවිං ආමසෙය්‍යාසි, අල්ලානි ගොමයානි ආමසෙය්‍යාසි. නොචෙ අල්ලානි ගොමයානි ආමසෙය්‍යාසි... අග්ගිං පරිචරෙය්‍යාසි. නො චෙ අග්ගිං පරිචරෙය්‍යාසි පඤ්ජලිකො **ආදිච්චං නමස්සෙය්‍යාසි.**"

**(iii) 'කාලස්සෙව' ඉර උදවට පෙර සිදු වන බව**

- නිදර්ශනය -

"බ්‍රාහ්මණයෝ...ශ්‍රාවකයන් මෙසේ සමාදන් කරවත්: 'එම්බා පුරුෂය, එව. තෝ '**කාලස්සෙව' ඇඳෙන් නැගිටුනේ** පොළොව පිරිමදනෙහි. ඉදින් පොළොව නො පිරිමදනෙහි නම් අමු ගොම පිරිමදනෙහි. ඉදින් අමු ගොම නො පිරිමදනෙහි නම්...අග්නිපරිචරණය කරනෙහි. ඉදින් අග්නිපරිචරණය නො කරනෙහි නම් බදැඳිළිව **සූර්ය නමස්කාරය කරනෙහි** (*ආදිච්චං නමස්සෙය්‍යාසි*)." (අං.නි. vi. 482)

තත්ථ 'ආදිච්ච-(සුරිය-) **නමක්කාරො** නාම සුරියුග්ගමනෙ කාලෙ යෙව පවත්තති. වුත්තඤ්හෙතං:

"සො...පුන දිවසෙ **පාතො**'ව...සුරියං නමස්සන්තො අට්ඨාසි."

එහි '**සූර්ය නමස්කාරය**' නම් සූර්යයා උදවන වේලාවේම පවතී. මෙය මෙසේ කියන ලදි:

"හේ...ඊළඟ දවසේ **උදෑසනම** (පාතොව)... සූර්යයා නමස්කාර කරමින් සිටියේය." (ජා.අ. vi. 262)

තත්ථ, "**පාතො**'ති: පගෙව, සුරියුග්ගමනකාලෙ"

ධම්මපදත්ථකථායඤ්ච:

"**පාතො** උදයන්තෙ සුරියෙ."ති වුත්තං.

එහි, "**පාතො** (උදෑසන) යනු: උදය කාලය (*පගෙව*), සූර්යයා උදවන කාලයෙහි (*සුරියුග්ගමනකාලෙ*)." යනුයි. (අං.නි.අ.638)

"**පාතො** (උදෑසන්හි) සූර්යය උදවන කල්හි (*උදයන්තෙ සුරියෙ*)" යනු ධම්මපද අටුවාවෙහි ද කියන ලදි. (ධ.අ. 21)

ඉහත තොරතුරු සටහනකින් මෙසේ දැක්විය හැක:

සටහන 15



**3. 'කාලස්සෙවා'ති ඉමස්මිං කාලපරිච්ඡෙදෙ'පි රූපානං දිස්සමානභාවො**

- නිදස්සනං -

"අථ ඛො සො සත්ථො තස්ස අග්ගිකස්ස ජටිලස්ස[1] අස්සමස්ස සාමන්තා එකරත්තිං වසිත්වා පක්කාමි. ... අථ ඛො සො අග්ගිකො ජටිලො **කාලස්සෙව වුට්ඨාය** යෙන සො සත්ථවාසො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා **අද්දස** තස්මිං සත්ථවාසෙ දහරං කුමාරං මන්දං උත්තානසෙය්‍යකං ඡඩ්ඩිතං. **දිස්වානස්ස** එතදහොසිඃ 'න ඛො මෙතං පතිරූපං, යම්මෙ **පෙක්ඛමානස්ස** මනුස්සභූතො කාලංකරෙය්‍ය. ...'ති. අථ ඛො ... තං දරකං අස්සමං නෙත්වා ආපාදෙසි."

**3. 'කාලස්සෙව' යන මේ කාලපරිච්ඡේදයේදීත් රූප පෙනෙන බව**

- නිදර්ශනය -

"ඉක්බිති ඒ වෙළෙඳ මුළුව ඒ අග්නි පුදන ජටිලයාගේ ආශ්‍රම සමීපයෙහි එක් රාත්‍රියක් වැස නික්ම ගියේය. ...ඉක්බිති ඒ අග්නි පුදන ජටිලයා[1] **ඉර උදවට කලින්ම** (කාලස්සෙව) **නැඟී සිට** ඒ වෙළෙඳ මළුව රැඳී සිටි තැනට එළඹියේය. එළඹ, ඒ වෙළෙඳ මළුව වුසූ තැන හැර දමා පියන ලද උඩුකුරුව හෝනා ඉතා කුඩා ළදරුවකු **දුටුවේය. දැක** (දිස්වා) ඔහුට '**මා දැක්කදී** මිනිස් වූයෙක් කලුරිය කරන්නේය යන යමෙක් ඇද්ද, එය මට නොසුදුසු ... යැ'යි මේ සිත විය. ඉක්බිති ...ඒ දරුවා ආශ්‍රමයට ගෙන ගොස් ඇති දැඩි කළේය."

(දී.නි. ii. 540)

**4. 'කාලස්සෙවා'ති ඉමස්මිං කාලපරිච්ඡෙදෙ ගමනං ච පිණ්ඩාය පටියාදනං ච පක්කමනං ච පකතියා භබ්බභාවො**

- පඨමං නිදස්සනං -

"සත්ථා ... **පභාතාය රත්තියා කාලස්සෙව** පත්තචීවරමාදාය අට්ඨාරසයොජනමග්ගං **පටිපන්නො** අන්තරාමග්ගෙ උපකං නාම ආජීවකං දිස්වා ... ඉසිපතනං අගමාසි."

**4. 'කාලස්සෙව' යන මේ කාලපරිච්ඡේදයේදී ගමන් යාමත් පිඩු පිණිස සූදනම් වීමත් හා පිටත්වීමත් ස්වාභාවික ලෙස කළ හැකි බව**

- පළමුවැනි නිදර්ශනය -

"ශාස්තෘන්වහන්සේ ... **රාත්‍රිය එළි වූ කල්හි** (පභාතාය රත්තියා) **ඉර උදවට කලින්ම** (කාලස්සෙව) පාසිවුරු ගෙන අටළොස් යොදුන් ඇති මාර්ගයෙහි **ගමන් කරන සේක්** අතරමගදී උපක නමැති ආජීවකයා දැක ... ඉසිපතනයට වැඩි සේක."

(ජා.අ. 77-8)

- දුතියං නිදස්සනං -

"ආරඤ්ඤිකෙන, භික්ඛවෙ, භික්ඛුනා **කාලස්සෙව උට්ඨාය**, පත්තං ථවිකාය පක්ඛිපිත්වා, අංසෙ ආලග්ගෙත්වා, චීවරං ඛන්ධෙ කරිත්වා, උපාහනා ආරොහිත්වා දරුභණ්ඩං, මත්තිකාභණ්ඩං පටිසාමෙත්වා, ද්වාරවාතපානං ථකෙත්වා, සෙනාසනා ඔතරිතබ්බං. 'ඉදානි

- දෙවැනි නිදර්ශනය -

"මහණෙනි, ආරණ්‍යක භික්ෂුව විසින් **ඉර උදවට කලින්ම** (කාලස්සෙව) **නැඟී සිට**, පාත්‍රය ථවිකයෙහි බහා, දසරුවෙහි එල්ලා ගෙන, සිවුර කරෙහි දමා ගෙන, පාවහන් නැග, දැව බඩු ද මැටි බඩු ද තැන්පත් කොට තබා, දොර ජනෙල් වසා සෙනස්නෙන්

---

1. ආශ්‍රමයෙහිම අග්නි රැකීම් හා හෝත්‍රය කිරීම් මිස, මේ වාගේ ජටිලයෝ කවදාවත් ඒ අග්නිය තමා හා ගෙන නො යති.

**ගාමං** පිවිසිස්සාමී'ති .... ධොවිත්වා පත්තං **ගහෙත්වා** සාධුකං අතරමානෙන ගාමො **පවිසිතබ්බො.**"

බැස්ස යුතුයි. 'දැන් ගමට පිවිසෙන්නෙමි' යනුවෙන් සලකා ... පාත්‍රය සෝද ගෙන මො-නොවට යුහුසුලු නොව ගමට පිවිසිය යුතු." (වු.ව. iii. 360)

**5. 'පාතො'ති ඉමස්මිං කාලපරිච්ඡෙදෙ පකතිචාරිත්තවසෙන ගාමං පිණ්ඩාය පවිසිත්වා චරණභාවො ච පාතරාසං ආහරනභාවො ච**

5. **'පාතො' (උදෑසන) යන මේ කාල-පරිච්ඡේදයේදී සාමාන්‍ය සිරිත් ලෙස ගමට පිඬු පිණිස පිවිස හැසිරෙන බව හා උදේ දනය ගන්නා බව**

- පඨමං නිදස්සනං -

"**සමණා ... පාතො**'ව පිණ්ඩාය චරන්ති කාලෙ ; **විකාලචරියා** විරතා. ..."

- පළමුවැනි නිදර්ශනය -

"ශ්‍රමණයෝ ... **උදෑසනම** (පාතො'ව) පිඬු පිණිස හැසිරෙති, කාලයෙහි ; විකාලයෙහි හැසිරීමෙන් වැළකී සිටින්නාහු ... (ජා.අ. v. 48)

- දුතියං නිදස්සනං -

"ථෙරො **පාතොයෙව** ගාමං පවිසිත්වා, **පිණ්ඩපාතං** ආදය විහාරං ආගන්ත්වා **භොජනසාලාය** පත්තං ඨපෙත්වා. ..."

- දෙවැනි නිදර්ශනය -

"තෙරුන්වහන්සේ **උදෑසනම** (පාතොයෙව) ගමට පිවිස, **පිණ්ඩපාතය** ගෙන විහාරයට අවුත් බොජුන් හල්හි පාත්‍රය තබා ...". (ම.නි.අ. i. 111)

- තතියං නිදස්සනං -

"තෙ සත්තා ... තං [සාලිං] **පාතො** පාතරාසාය ආහරන්ති."

- තෙවැනි නිදර්ශනය -

"ඒ සත්වයෝ ... ඒ [සහල්] **උදෑසන්හි** (පාතො) උදේ කෑමට කති." (දී.නි. iii. 150)

6. **'පුබ්බණ්හසමයන්'ති ඉමස්මිං කාලපරිච්ඡෙදෙ'පි පකතිචාරිත්තවසෙන ගාමං පිණ්ඩාය පවිසිත්වා චරණභාවො ච භොජනං භුඤ්ජනභාවො ච**

6. **'පුබ්බණ්හසමයං' (පෙරවරු කාලය) යන මේ කාලපරිච්ඡේදයේදීත් සාමාන්‍ය සිරිත් ලෙස ගමට පිඬු පිණිස පිවිස හැසිරෙන බව හා භෝජනය අනුභව කරන බව**

- පඨමං නිදස්සනං -

"අථ භගවා මජ්ඣිමයාමෙ[1] ... බුද්ධචක්ඛුනා ලොකං ඔලොකෙන්තො සුනීතස්ස ... අරහත්-තුපනිස්සයං දිස්වා **විභාතාය රත්තියා, පුබ්බණ්හසමයං** නිවාසෙත්වා පත්තචීවරං ආදය භික්ඛුසංඝපරිවුතො රාජගහං පිණ්ඩාය

- පළමුවැනි නිදර්ශනය -

"ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ රාත්‍රියේ මධ්‍යම යාමයේ[1]... බුදු ඇසින් ලොව බලන සේක්, සුනීතගේ ... රහත් බවට උපනිශ්‍රය දැක **රාත්‍රිය එළි වූ කල්හි** (විභාතාය රත්තියා), **පෙරවරු කාලයෙහි** (පුබ්බණ්හසමයං) හැඳ පෙරෙව

1. 'පච්ඡිමයාමෙ' යන මරම්ම ඡට්ඨ සඞ්ගීති මුද්‍රණ පොත්වල දක්න ලැබේ. කරුණාකර 58 පිට (ධ.අ. 13-14) හා (ජා.අ.v. 186) බලා සංසන්දනය කරන්න.

පවිට්ඨො... වීථිං පිටිපජ්ජි. සුනීතො'පි ... භික්ඛු-සංඝපරිවුතං සත්ථාරං ආගච්ඡන්තං දිස්වා. ..."

පාසිවුරු ගෙන භික්ෂු සඞ්ඝයා පිරිවරා රජගහ නුවරට පිඬු පිණිස පිවිසි ... වීථියට බැස්සා සේක. සුනීතය ද ... භික්ෂු සංඝයා විසින් පිරි-වැරූ වඩින්නාවූ ශාස්තෲන් වහන්සේ දැක..."

(ථෙර.අ.540)

තත්ථ, "**පුබ්බණ්හසමයන්**'ති: දිවසස්ස පුබ්බභාගසමයං."

එහි, "**පෙරවරු කාලයෙහි** (පුබ්බණ්හසමයං) යනු: දවසේ පූර්වභාග කාලයෙහි ය."

(විභ.අ.118)

- දුතියං නිදස්සනං -

"අථ බො වෙරඤ්ජො බ්‍රාහ්මණො **තස්ස රත්තියා අච්චයෙන** සකෙ නිවෙසනෙ පණීතං ඛාදනියං, භොජනියං පටියාදපෙත්වා භගවතො කාලං ආරොචෙසි: '**කාලො**, භො ගොතම, නිට්ඨිතං භත්තන්'ති. අථ බො භගවා **පුබ්බණ්හසමයං** නිවාසෙත්වා පත්ත-චීවරමාදය යෙන වෙරඤ්ජස්ස බ්‍රාහ්මණස්ස නිවෙසනං ... උපසඞ්කමිත්වා ... අථ බො වෙරඤ්ජ බ්‍රාහ්මණො ... භගවන්තං භුත්තාවිං ... තිචීවරෙන අච්ඡාදෙසි."

- දෙවැනි නිදර්ශනය -

"ඉක්බිති වෙරඤ්ජ බ්‍රහ්මණ තෙමේ **ඒ රාත්‍රිය ඇවෑමෙන්** සිය නිවෙසෙහි ප්‍රණීත වූ කෑ යුතු දේ ද බුදිය යුතු දේ ද පිළියෙල කරවා, 'භවත් ගෞතමයන් වහන්ස, **කල්** (කාලො) වෙයි. බත නිමියේ යැ'යි භාග්‍යවතුන් වහන්සේට කල් දන්වා යැවීය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ **පෙරවරු කාලයෙහි** (පුබ්බණ්හසමයං) හැඳ පෙරෙව පාසිවුරු ගෙන වෙරඤ්ජ බාහ්මණයාගේ නිවෙසට එළඹ .... ඉක්බිති වෙරඤ්ජ බ්‍රාහ්මණ තෙමේ ... වළඳා නිමවූ ... භාග්‍යවතුන් වහන්සේ තුන්සිවුරෙන් පිදී ය."

(පාරා.24)

- තතියං නිදස්සනං -

"සිගාලකො ගහපතිපුත්තො **කාලස්සෙව වුට්ඨාය** රාජගහා නික්ඛමිත්වා ... පුථුද්දිසා නමස්සති. අථ බො භගවා **පුබ්බණ්හසමයං** නිවාසෙත්වා පත්තචීවරමාදය රාජගහං පිණ්ඩාය පවිසි. අද්දසා බො භගවා සිගලකං ගහපතිපුත්තං ... පුථුද්දිසා නමස්සන්තං."

- තුන්වැනි නිදර්ශනය -

"සිගාලක නම් ගැහැවි පුත් **ඉර උදවට කලින්ම** (කාලස්සෙව) **නැගී සිට**, රජගහ නුවරින් නික්ම ගොස්, ...බොහෝ දිසාවන් නමස්කාර කරයි. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ **පෙරවරු කාලයෙහි** (පුබ්බණ්හ-සමයං) හැඳ පෙරෙව පා සිවුරු ගෙන, රජගහ නුවරට පිඬු පිණිස පිවිසි සේක. භාග්‍යවතුන් වහන්සේ බොහෝ දිසාවන් නමස්කර කරන්නා වූ...සිගාලක ගැහැවි පුතු දුටු සේක්ම ය."

(දී.නි.iii.288)

## සවැනි පරිච්ඡේදය

# අරුණෝද්ගමනය හා රෑදවාල් භේදය

පාළි

"යතො ච බො, භික්ඛවෙ, චන්දිමසුරියා ලොකෙ උප්පජ්ජන්ති, අථ මහතො ආලොකස්ස පාතුභාවො හොති, මහතො ඔභාසස්ස. න අන්ධකාරතමං තද හොති...අථ **රත්තින්දිවා** පඤ්ඤායන්ති, මාසද්ධමාසා...උතුසංවච්ඡරා පඤ්ඤායන්ති."

තත්ථ, "**රත්තින්දිවා**"ති:තතො සුරියත්ථඞ්ගමනතො යාව අරුණුග්ගමනා රත්ති, අරුණුග්ගමනතො යාව සුරියත්ථඞ්ගමනා දිවා"ති රත්තින්දිවා පඤ්ඤායිංසු."

සිංහලානුවාදය

"මහණෙනි, යම් කලෙක සඳ සූර්යයා ලොව උපදිද්ද එකල්හි මහත් ආලෝකය, මහත් බැබළීම පහළ වේ. එකල්හි අඳුර ද කළුවර ද නැත...ඉක්බිති **රෑදවල්** (රත්තින්දිවා) පෙනේ. මස් අඩමස් පෙනේ. ඍතුසංවත්සර පෙණේ." (සං.නි.v-2. 300)

එහි, "**රෑදවල්** යනු:එතැන් සිට, ඉර බැසීමෙහි පටන් **අරුණෝද්ගමනය** වන තුරු රාත්‍රියයි, **අරුණෝද්ගමනයෙහි** පටන් ඉර බැසයන තුරු දවාලයි යන රෑදවල් පෙනුහ." (දී.නි.අ.630)

**සංලක්ෂ්‍යය** - අඳුර හා ආලෝකය අතර පවතින්නා වූ වැදගත් වෙනස පුරාණ කාලයේ සිටම මනුෂ්‍යයන්ට කාලය වෙන් කර ගැනීමේ ප්‍රධාන වෙනස් කම හැටියට උපයෝගී විය. එහෙයින් අවට පරිසරය තුළ අඳුර පවතින කාලය රාත්‍රිය ලෙසත්, ආලෝකය (එළිය)පවතින කාලය දහවල ලෙසත් ගැණින. එනම් රාත්‍රියෙහි ලක්ෂණය අඳුර වන අතර දවාලෙහි ලක්ෂණය ආලෝකයයි. දවාලෙහි පවතින්නා වූ ආලෝකයට හේතුව සූර්යයායි. එසේ හෙයින් සූර්යයාගේ ලක්ෂණයත් ආලෝකයම වෙයි.

අරුණෝද්ගමනයෙහි ලක්ෂණය නම් සූර්යයාගේ ප්‍රභා විශේෂ බව හා සිව් දිසාවන්හි ආලෝකය (එළිය) පවතින බව ඉහත පරිච්ඡේදයන්හි සඳහන් විය. තවද අරුණෝද්ගමනය සූර්යයාගේ උදවීමට පෙර නිමිත්ත වන බව මෙසේ සඳහන් විය:- "මහණෙනි, සූර්යයාගේ උදවීමට මෙය පූර්වාංගමය, මෙය පෙර නිමිත්තය, එනම් අරුණෝද්ගමනය"යි. (සං.නි.v.50) මෙලෙස සූර්යයා ඇති විට අවට පරිසරයේ සූර්යයාගේ ලක්ෂණය ආලෝකය නම් සූර්යය උදවීමට පෙර නිමිත්ත වන අරුණෝද්ගමනයෙහි ලක්ෂණය ද, අඳුර නොව, ආලෝකයම විය යුතුය. එබැවින් අවට පරිසරයෙහි (i) ඉර බැසයාමේ පටන් අරුණෝද්ගමනය (ආලෝකය, එළිය) වන තුරු රාත්‍රී කාලයයි. (ii) අරුණෝද්ගමනයෙහි (ආලෝකය, එළිය) පටන් ඉර බැසයාම දක්වා දහවල් කාලයයි. මෙසේ රෑදවල් භේදය ඇතිවන අයුරු දත යුතු.

එසේ හෙයින් රෑදවල් "භේද (වෙන්) කරන රේඛාව" අරුණෝද්ගමනය යනු ඉතාම පැහැදිලිය. ඉහත ජාතක අටුවාවෙහිත් මෙය මෙසේ සඳහන් විය:- "රාත්‍රියෙහි කෙළවර, රාත්‍රියෙහි අවසානයෙහිදී අරුණෝද්ගමනය සිදුවේ." (ජා.අ.vi.300) එමෙන්ම විමතිවිනොදනී ටීකාවෙහිත්:- "අරුණෝද්ගමනය නම් දවසේ ආරම්භය යි" සඳහන් විය (විම.වි.ටී.258). මේ අයුරින් රෑදවල් භේදයෙහි අරුණෝද්ගමනයේ වැදගත් කම හා වටිනාකම පැහැදිලිවම දක්නට ලැබේ.

පසුව වනාහි, මනුශ්‍යයන්ට නොයෙක් ප්‍රායෝගික හේතූන් නිසා රෑදවල් දෙක කොටස් කීපයකට බෙදන ලදි. එනම්:
රාත්‍රියේ ප්‍රථම යාමය *(පඨමයාමො)*, මධ්‍යම යාමය *(මජ්ඣිමයාමො)*, පශ්චිම යාමය *(පච්ඡිමයාමො)* යනු රාත්‍රි කොටස් තුනක් ද, එසේම පෙරවරු කාලය *(පුබ්බණ්හසමයො)*, මධ්‍යාහ්න කාලය *(මජ්ඣන්තිකසමයො)*, සවස් කාලය *(සායණ්හසමයො)* යනු දවල් කොටස් තුනක් ද, නොහොත් පෙරබත් කාලය *(පුරෙභත්තං)*, පසුබත් කාලය *(පච්ඡාභත්තං)* යනු දවල් කොටස් දෙක ද ත්‍රිපිටකයේ නොයෙක් තැන්වල සඳහන් වේ.[1] කල් යන විට රෑදවල් දෙක තව දුරටත් කොටස් කීපයකට බෙදන ලදි.

මේ පොතේ ප්‍රකාශයට පැමිණි රෑදවල් පිළිබඳ සියලු කොටස් හා පාළි අධිවචන, සටහනකින් මෙසේ දැක්විය හැක: (කරුණාකර ඊළඟ පිටුව බලන්න.)

1. උදහරණ අං.නි.i. 218; චු.ව.ii. 424; පාචි. ii. 170 යනුයි.

## අරුණෝද්ගමනය හා රෑදවල් භේදය

සටහන 16




අරුණුග්ගමනං
අරුණුග්ගං
අරුණුග්ගතසමයං
අරුණුග්ගමනකාලො
අරුණුග්ගමනවෙලායං
අරුණුට්ඨානං
අරුණොදයෙ ජාතෙ
උග්ගතෙ අරුණෙ
උට්ඨිතෙ අරුණෙ
උද්ධස්තෙ අරුණෙ
වුට්ඨිතෙ අරුණෙ

**ලක්ෂණ දක්වන අධිවචන**

ආලොකෙ සඤ්ජාතෙ
පභාතාය රත්තියා
රත්ති විභායති
විභාතාය රත්තියා
විභාතමානාය රත්තියා
සුරියස්ස උදයතො පුබ්බඞ්ගමං, පුබ්බනිමිත්තං

**උපමා අලංකාර දක්වන අධිවචන**

උග්ගතෙ අරුණසීසෙ
ඔදතදිසාමුඛී රත්ති
තුට්ඨිමුඛී රත්ති
නන්දිමුඛී රත්ති
පසන්නදිසාමුඛී රත්ති

**කාලය දක්වන අධිවචන**

ජිසඤ්ඤරත්ති
පච්ඡිමරත්ති
රත්තිපරියොසානෙ
පුන දිවසෙ

එහි '**රත්ති විභායති**' හා '**නන්දිමුඛී රත්ති**' යන මේ වැදගත් අධිවචන දෙක බුදුරජාණන්වහන්සේ විසින් ද භාවික කළ බව මෙහි සඳහන් කරන්ට වවී. ඒ මෙසේයි:

### (1) '**රත්ති විභායති**'

පාළි

"ඉධ පන, භික්ඛවෙ,...ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො: 'සුණාතු මෙ, භන්තෙ, සඞ්ඝො. මනුස්සෙහි දනං දෙන්තෙහි **යෙභුය්‍යෙන රත්ති ඛෙපිතා**. සචෙ සඞ්ඝො තෙවාචිකං පවාරෙස්සති අපවාරිතො'ව සඞ්ඝො භවිස්සති. අථායං **රත්ති විභායිස්සති**. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො දෙවාචිකං, එකවාචිකං, සමානවස්සිකං පවාරෙය්‍යා'ති."

සිංහලානුවාදය

"මහණෙනි, මෙහි ...ව්‍යක්ත වූ ප්‍රතිබල භික්ෂු නමක් විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුතුය: 'ස්වාමිනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. දන් දෙන්නා වූ මිනිසුන් විසින් **බොහෝ සෙයින් රාත්‍රිය ගෙවන ලදි**. ඉදින් සඞ්ඝ තෙමේ පවරන්නේ නම්, සඞ්ඝ තෙමේ නො පැවරුයේම වන්නේය. දැන් **මේ රාත්‍රිය එළි වන්නේය** (*රත්ති විභායිස්සති*). ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම් සඞ්ඝ තෙමේ දෙවරක් කීමෙන්, එක්වරක් කීමෙන්, සමාන වස් ඇත්තන් එකතුව කීමෙන් පවරන්නේය." (ම.ව.i.448)

**සංලක්ෂ්‍යය** - මෙහි, රාත්‍රිය එළි වන්නේ නම් (*රත්ති විභායිස්සති*), අරුණ නැගී ඊළඟ දවස (පුන දිවසො) පටන්ගනී. මෙසේ සඞ්ඝ තෙමේ පවාරණ දිනයේ දී නො පැවරුයේම වන්නේය. එනම්, දුකට ඇවතට පත් වන්නේය. එබැවින්, සඞ්ඝ තෙමේ රාත්‍රිය එළි වන්ට පෙර ඉක්මනින් පවරන්නේයැ'යි යන අර්ථයයි.

### (2) '**නන්දිමුඛී රත්ති**'

"අථ ඛො, භික්ඛවෙ,...නික්ඛන්තෙ පච්ඡිමෙ යාමෙ, **උද්ධස්තෙ අරුණෙ, නන්දිමුඛියා රත්තියා** සීතං මං අහොසි. චතුත්ථාහං චීවරං පාරුපිං."

"මහණෙනි, ඉක්බිති ...පශ්චිම යාමය නික්ම ගිය කල්හි, **අරුණ නැගි කල්හි** (*උද්ධස්තෙ අරුණෙ*), **රාත්‍රිය සතුටුදයක පෙනුමක් ඇති වූ කල්හි** (*නන්දිමුඛියා රත්තියා*) මට සීත විය. මම සිවුවැනි සිවුරක් පෙරවීමි." (ම.ව.ii.710)

"**නන්දිමුඛියා රත්තියා**'ති: පසන්නදිසා-මුඛියා'ති අත්ථො."

මේ පෙළ පාඨයෙහි අර්ථ වර්ණනාවේ:-

"**රාත්‍රිය සතුටුදයක පෙනුමක් ඇති වූ කල්හි** (*නන්දිමුඛියා*) යනු: දිසාවන් පහන් (*පසන්න*) වූ පෙනුමක් ඇති වූ කල්හි යන අර්ථයයි." - සඳහන් වේ. (විම.වි.ටී.438)

සත්වැනි පරිච්ඡේදය

# විද්‍යාත්මක විස්තර

මතු සඳහන් වන විද්‍යාත්මක විස්තර මේ පොතේ අතිරේක වශයෙන් එකතු කර තිබෙන්නේ:

(i) අරුණ නියාමය පහද දෙන්ට

(ii) පළමුවැනි හා දෙවැනි පරිච්ඡේදයේ ප්‍රත්‍යක්ෂමූලික නිරීක්ෂණයන් තහවුරු කරන්ට හා

(iii) උදේ හිමිදිරි කාලය තුළ අරුණෝද්ගමනය නිශ්චිත කරන්ට යන අර්ථ සඳහායි.

මෙහි ආශ්‍රිත වූ ඉංග්‍රීසි විද්‍යාත්මක පොත් සියල්ල අධෝලිපිවල සටහන් වේ.

- ඉංග්‍රීසි -

## I. MORNING TWILIGHT

"When the sun arises from below the rational horizon, its light is not suddenly fully obvious to the observer. Although direct sunlight cannot reach the observer, the upper atmosphere will still be sunlit. Reflection and scattering of the sun's light by the upper atmosphere allows thus some light to reach the observer by indirect means. The amount of this light reaching the observer will increase as the sun's rising from below the horizon increases. The interval between, when the sun approaches close enough to the eastern horizon to allow light to reach the observer and of sunrise is called morning twilight'" [1]

- සිංහලානුවාදය -

## I. උදේ හිමිදිරිය

"භාවිත ක්ෂිතිජය යටින් සූර්යයා මතු වන විට බලාසිටින අයෙකුට සූර්යාලෝකය එක්වරටම සම්පූර්ණ ලෙස ප්‍රකට නොවේ. බලාසිටින අයෙකුට සූර්යාලෝකය කෙළින්ම ලැබා නො වෙන්නේ නමුත් ඉහල අහසේ වායුගෝලය එයින් ආලෝකමත් වනු දැකිය හැක. [ඊළඟ සටහන 17 බලනු]. මෙසේ ඉහල වායුගෝලයේ පරාවර්තනය වී පැතිරෙන සූර්යාලෝකය බලාසිටින අයෙකු වෙත අනියම් ලෙස ආලෝකය ටිකක් ලං වෙන්නට ඉඩ දෙයි. ක්ෂිතිජය යටින් සූර්යයා ක්‍රමයෙන් මතුවන පරිදි, ඒ අනුව බලාසිටින අය වෙත ලැබාවන ඒ ආලෝකය ද වැඩිවෙයි. මෙලෙස, සූර්යයා නැගෙනහිර ක්ෂිතිජයට ප්‍රමාණවත් තරමකට ලංවූ අවස්ථාවක, බලාසිටින අයෙකු වෙත ආලෝකය ටිකක් ලැබාවන්නේ ද, එම අවස්ථාවේ පටන් සූර්යයා උදවන තුරු යන මේ අතර කාලය '**උදේ හිමිදිරිය**' යැයි කියනු ලැබේ."[1]

1. Navigation Principles and Practices, A.Frost, Glasgow, Brown, Son & Ferguson, LTD, 1978

සටහන 17

උදේ හිමිදිරි එළිය පටන්ගැනීම




**සංලක්ෂ්‍යය** - යට කී විස්තර පරිදි මේ පොතේ පළමුවැනි පරිච්ඡේදයේ 5 වැනි සටහනේ, වේලාව 5:05 පටන් සූර්යයා උදවන වේලාව වන 6:20 තුරු යනු පැය 1:15 මේ අතර කාලය 'උදේ හිමිදිරිය යැ'යි කියනු ලබන බව කරුණාකර සංසන්දනය කොට බලන්න.

**II. THREE DEGREES OF MORNING TWILIGHT**

"Three degrees of [morning] twilight are conventionally distinguished: astronomical, nautical and civil twilight."[1]

**II. උදේ හිමිදිරි අවස්ථා තුනකි.**

"ව්‍යවහාර වශයෙන් උදේ හිමිදිරි අවස්ථා තුනක් වෙන් කර දක්වා ඇත:

[1] නක්ෂත්‍ර හිමිදිරිය
[2] නාවික හිමිදිරිය හා
[3] පොදුජන (සිවිල්) හිමිරිදිය යනුයි."[1]

**1. Astronomical Twilight**

"It begins when the sun is about 18° below the horizon. Therefore arbitrarily morning twilight is considered to begin when the centre of the sun rises to within 18° of the eastern horizon."[2]

**1. නක්ෂත්‍ර හිමිදිරිය**

"මෙය පටන් ගැනෙන්නේ සූර්යයා 18° ක් පමණ ක්ෂිතිජය යටින් පැමිණි අවස්ථාවේදීය. එහෙයින් සාමාන්‍ය පිළිගැනීමක් ලෙස නැගෙනහිර ක්ෂතිජයේ 18° ක් තුළ සූර්ය-කේන්ද්‍රය පැමිණි අවස්ථාවේදී උදේ හිමිදිරිය පටන්ගැනීම ලෙස සලකනු ලැබේ."[2]

1. McGraw-Hill Dictionary of Scientific and Technical Terms, 5th ed., McGraw-Hill Inc., USA, 1994
2. Navigation Principles and Practices, A.Frost, Glasgow, Brown, Son & Ferguson, LTD, 1978

"No light from the sun can then reach the observer. This marks theoretical perfect darkness."[1] "Even the faintest stars over-head can be seen."[2] "Before this time there is complete absence of sunlight."[3]

"මේ අවස්ථාවේදී බලාසිටින අයෙකු වෙත සූර්යාලෝකය ලඟා නොවේ. මූලධර්මානුකූලව මෙය පැහැදිලිවම පූර්ණ අඳුරයි."[1] "දීප්තියෙන් ඉතා හීන වූ තරු පවා අහසේ දැකිය හැක."[2] "මේ අවස්ථාවට කලින් සූර්යයාලෝකය සම්පූර්ණයෙන්ම නැත."[3] [ඊළඟ සටහන 18 බලනු]

සංලක්ෂ්‍යය - කරුණාකර මේ පොතේ පළමුවැනි පරිච්ඡේදයේ 4 වැනි හා 5 වැනි සටහන සංසන්දනය කොට බලන්න.

## 2. Nautical Twilight

"It begins when the centre of the sun rises to within 12° of the eastern horizon"[4]. "At this time both the horizon and the brighter stars are visible."[5] "The light [however] is too dim for the user of a sextant[6] to see a sharp horizon."[7]

## 2. නාවික හිම්දිරිය

"මෙය පටන් ගැනෙන්නේ නැගෙනහිර ක්ෂිතිජයේ 12° ක් තුළ සූර්යකේන්ද්‍රය පැමිණි අවස්ථාවේදීය."[4] "මේ අවස්ථාවේදී ක්ෂිතිජයත්, වඩා දීප්තිමත් වූ තරුත් දැකිය හැක."[5] "[ඒ කෙසේ වුවත්] ෂඩ්භාග යන්ත්‍රයක[6] ආධාරයෙන් පැහැදිලිව ක්ෂිතිජය දැකීමට නිරීක්ෂණය කරන [නාවිකයෙකු]හට මේ සූර්යාලෝකය ප්‍රමාණවත් නොවේ."[7]

සංලක්ෂ්‍යය - කරුණාකර මේ පොතේ පළමුවැනි පරිච්ඡේදයේ 9 වැනි සටහන සංසන්දනය කොට බලන්න.

## 3. Civil Twilight

"It begins when the centre of the sun rises to within 6° of the eastern horizon."[8] "If the sky is clear it is usually practicable to carry on ordinary outdoor occupations without artificial light."[9]

## 3. පොදුජන (සිවිල්) හිම්දිරිය

"මෙය පටන් ගැනෙන්නේ නැගෙනහිර ක්ෂිතිජයේ 6°ක් තුළ සූර්යකේන්ද්‍රය පැමිණි අවස්ථාවේදීය."[8] "අහස පැහැදිලි නම් මෙවිට කෘතිම එළියක් නැතිව එළිමහනේ සාමාන්‍ය වැඩ කටයුතුවල යෙදිය හැකිය."[9]

---

1. McGraw-Hill Encyclopedia of Science and Technology, McGraw-Hill Inc., USA, 1997
2. The Columbia Encyclopaedia, 5th ed., Colombia University Press, USA, 1993
3. McGraw-Hill Encyclopedia of Science and Technology, McGraw-Hill Inc., USA, 1997
4. Navigation Principles and Practices, A. Frost, Glasgow, Brown, Son. & Ferguson, LTD, 1978
5. McGraw-Hill Encyclopedia of Science and Technology,....
6. කුඩා දුරදර්ශක යන්ත්‍රයක් (a small telescope) යනුයි Encyclopaedia Britannica
7. The Columbia Encyclopaedia, ....
8. Navigation Principles and Practices, ...
9. McGraw-Hill Encyclopaedia of Science and Technology, ...

"Natural illumination is sufficient for conducting ordinary outdoor activities."[1]

"Accordingly, astronomical twilight begins at the edge of total darkness, whereas during civil twilight there is sufficient light for many ordinary activities."[2]

"එළිමහනේ සාමාන්‍ය වැඩ කටයුතු කිරීම සඳහා ස්වාභාවික ආලෝකය දැන් සෑහේ."[1]

"ඒ අනුව, නක්ෂත්‍ර හිමිදිරිය මුළු අඳුර අයිනේ පටන්ගන්නා අතර, පොදුජන හිමිදිරිය පවතින කාලය තුළ නොයෙකුත් සාමාන්‍ය වැඩ කටයුතු කරගෙන යෑමට අවශ්‍ය තරම් සෑහෙන ආලෝකයක් පවතී."[2]

සටහන 18




1 Encyclopaedia Britannica, Hazel & Viney Limited, England, 1967
2. The Encyclopaedia Americana, International ed., Grolier Inc., USA, 1995

### III. PURPLE LIGHT AT MORNING TWILIGHT

"The purple light is the faint purple glow observed on clear days over a large region of the eastern sky before sunrise"[1] " ... is a mixture of red light."[2] "The purple light is a highly variable phenomenon, but usually it rapidly broadens... and seems to intensify, .... When the sun is about 6° below the horizon it has... brightened the horizontal bands... and it lasts about half an hour, ..."[3]

### III. උදේ හිමිදිරියේදී ඇතිවන දම්පාට එළිය

"දම්පාට එළිය නම් පැහැදිලි අහසක් ඇති දිනවල, ඉර උදවට පෙර නැගෙනහිර අහසේ විශාල ප්‍රදේශයක පැතිරී ඇති මඳක් දම්පැහැ ගති දිලිසීමකි."[1] "එය රතුපාට එළියේ සම්මිශ්‍රණයකි"[2] "මේ දම්පාට එළිය ඉතා අස්ථිර වූ සිද්ධියකි. එහෙත් එය සාමාන්‍ය-යෙන් වේගයෙන් පැතිරේ...[දම්/රතු] පාට ගැන්වීම ද වැඩිවේ...සූර්යයා ක්ෂිතිජයට 6° පමණ යටින් පවතිද්දී මෙය ක්ෂිතිජ තීරයන් ආලෝක කරමින් පැය භාගයක් පමණ පවතී."[3]

**සංලක්ෂ්‍යය** - කරුණාකර මේ පොතේ පළමුවැනි පරිච්ඡේදයේ 7-10 වැනි සටහන සංසන්දනය කොට බලන්න.

### IV. ශ්‍රී ලඞ්කාවේ පොදුජන (සිවිල්) හිමිදිරිය

පොදුජන හිමිදිරිය වනාහි පෙළ අටුවා ටීකාවෙහි සඳහන් වන අරුණෝද්ගමනය සම්බන්ධ විස්තර සමඟ වැඩි දුරට ගැලපෙන බැවින්, මෙම හිමිදිරිය ශ්‍රී ලංකාවේ පටන් ගැනෙන්නේ කීයට දැයි විමසන විට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ පයෝෂණය හා පරිගණක දත්තයන් පරිදි ඒ මෙසේයි :

1. Mc Graw-Hill Dictionary of Scientific and Technical Terms, 5th ed., McGraw-Hill Inc., USA, 1994
2. Encyclopedia Americana, International ed., Grolier Inc., USA, 1995
3. Encyclopedia Britannica, Hazel & Viney Limited, England, 1967.

# ශ්‍රී ලංකාවේ පොදුජන හිමිදිරිය

## පටන්ගන්න වේලාව, පවත්න කාලය හා ඉර උදවීම

| පොදුජන හිමිදිරිය | | | |
|---|---|---|---|
| දිනය | පටන්ගන්න වේලාව | පවත්න කාලය | ඉර උදවීම |
| **ජනවාරි** | | | |
| 1 | 5:59 | 0:23 | 6:22 |
| 3 | 6:00 | 0:23 | 6:23 |
| 6 | 6:02 | 0:22 | 6:24 |
| 8 | 6:03 | 0:22 | 6:25 |
| 11 | 6:04 | 0:22 | 6:26 |
| 15 | 6:05 | 0:22 | 6:27 |
| 19 | 6:06 | 0:22 | 6:28 |
| 24 | 6:07 * | 0:22 | 6:29 |
| **පෙබරවාරි** | | | |
| 10 | 6:07 | 0:21 | 6:28 |
| 16 | 6:06 | 0:21 | 6:27 |
| 20 | 6:05 | 0:21 | 6:26 |
| 24 | 6:04 | 0:21 | 6:25 |
| 27 | 6:03 | 0:21 | 6:24 |
| **මාර්තු** | | | |
| 1 | 6:02 | 0:21 | 6:23 |
| 3 | 6:01 | 0:21 | 6:22 |
| 6 | 6:00 | 0:21 | 6:21 |
| 8 | 5:59 | 0:21 | 6:20 |
| 10 | 5:58 | 0:21 | 6:19 |
| 13 | 5:57 | 0:21 | 6:18 |
| 15 | 5:56 | 0:21 | 6:17 |
| 17 | 5:55 | 0:21 | 6:16 |
| 19 | 5:54 | 0:21 | 6:15 |
| 21 | 5:53 | 0:21 | 6:14 |
| 23 | 5:52 | 0:21 | 6:13 |
| 25 | 5:51 | 0:21 | 6:12 |
| 27 | 5:50 | 0:21 | 6:11 |
| 29 | 5:49 | 0:21 | 6:10 |
| 31 | 5:48 | 0:21 | 6:09 |
| **අප්‍රේල්** | | | |
| 2 | 5:47 | 0:21 | 6:08 |
| 4 | 5:46 | 0:21 | 6:07 |
| 6 | 5:45 | 0:21 | 6:06 |

| පොදුජන හිමිදිරිය | | | |
|---|---|---|---|
| දිනය | පටන්ගන්න වේලාව | පවත්න කාලය | ඉර උදවීම |
| **අප්‍රේල් ඉතිරි කොටස** | | | |
| 8 | 5:44 | 0:21 | 6:05 |
| 11 | 5:43 | 0:21 | 6:04 |
| 13 | 5:42 | 0:21 | 6:03 |
| 15 | 5:41 | 0:21 | 6:02 |
| 18 | 5:40 | 0:21 | 6:01 |
| 20 | 5:39 | 0:21 | 6:00 |
| 23 | 5:38 | 0:21 | 5:59 |
| 25 | 5:37 | 0:21 | 5:58 |
| 29 | 5:36 | 0:21 | 5:57 |
| **මැයි** | | | |
| 2 | 5:34 | 0:22 | 5:56 |
| 6 | 5:33 | 0:22 | 5:55 |
| 11 | 5:32 | 0:22 | 5:54 |
| 18 | 5:31 ● | 0:22 | 5:53 |
| **ජූනි** | | | |
| 3 | 5:32 | 0:22 | 5:54 |
| 11 | 5:32 | 0:23 | 5:55 |
| 17 | 5:33 | 0:23 | 5:56 |
| 22 | 5:34 | 0:23 | 5:57 |
| 26 | 5:35 | 0:23 | 5:58 |
| 30 | 5:36 | 0:23 | 5:59 |
| **ජූලි** | | | |
| 4 | 5:38 | 0:22 | 6:00 |
| 9 | 5:39 | 0:22 | 6:01 |
| 14 | 5:40 | 0:22 | 6:02 |
| 19 | 5:41 | 0:22 | 6:03 |
| 25 | 5:42 | 0:22 | 6:04 |
| **අගෝස්තු** | | | |
| 5 | 5:43 | 0:22 | 6:05 |
| 18 | 5:43 | 0:21 | 6:04 |
| 29 | 5:42 | 0:21 | 6:03 |

| පොදුජන හිමිදිරිය | | | |
|---|---|---|---|
| දිනය | පටන්ගන්න වේලාව | පවත්න කාලය | ඉර උදවීම |
| **සැප්තැම්බර්** | | | |
| 6 | 5:41 | 0:21 | 6:02 |
| 12 | 5:40 | 0:21 | 6:01 |
| 18 | 5:39 | 0:21 | 6:00 |
| 24 | 5:38 | 0:21 | 5:59 |
| **ඔක්තෝම්බර්** | | | |
| 1 | 5:37 | 0:21 | 5:58 |
| 9 | 5:36 | 0:21 | 5:57 |
| 30 | 5:37 | 0.21 | 5:58 |
| **නොවැම්බර්** | | | |
| 6 | 5:37 | 0:22 | 5:59 |
| 11 | 5:38 | 0:22 | 6:00 |
| 14 | 5:39 | 0:22 | 6:01 |
| 18 | 5:40 | 0:22 | 6:02 |
| 21 | 5:41 | 0:22 | 6:03 |
| 23 | 5:42 | 0:22 | 6:04 |
| 26 | 5:43 | 0:22 | 6:05 |
| 28 | 5:44 | 0:22 | 6:06 |
| 30 | 5:45 | 0:22 | 6:07 |
| **දෙසැම්බර්** | | | |
| 3 | 5:46 | 0:22 | 6:08 |
| 5 | 5:47 | 0:22 | 6:09 |
| 7 | 5:48 | 0:22 | 6:10 |
| 9 | 5:49 | 0:22 | 6:11 |
| 11 | 5:49 | 0:23 | 6:12 |
| 13 | 5:50 | 0:23 | 6:13 |
| 15 | 5:51 | 0:23 | 6:14 |
| 17 | 5:52 | 0:23 | 6:15 |
| 19 | 5:53 | 0:23 | 6:16 |
| 21 | 5:54 | 0:23 | 6:17 |
| 23 | 5:55 | 0:23 | 6:18 |
| 25 | 5:56 | 0:23 | 6:19 |
| 27 | 5:57 | 0:23 | 6:20 |
| 29 | 5:58 | 0:23 | 6:21 |
| 31 | 5:59 | 0:23 | 6:22 |

Times are in Sri Lanka Standard Time. Department of Meteorology, Colombo 7. -15.05.00

මෙම සංඛ්‍යා ලේඛන අනුව, පොදුජන හිමිදිරිය වර්ෂයක් තුළ

* වැඩි තරමින් පටන්ගන්න වේලාව: ජනවාරි 24, 6:07 යි.

● අඩු තරමින් පටන්ගන්න වේලාව: මැයි 18, 5:31 යි.

මෙසේ ඉර උදවට වැඩි තරමින් විනාඩි 0:23 ක් කලින් හා අඩු තරමින් විනාඩි 0:21 ක් කලින් පටන්ගනී.

## V. VARIATION OF MORNING TWILIGHT

## V. උදේ හිමිදිරිය වෙනස්වීම

ප්‍රදේශයෙන් ප්‍රදේශයට, රටින් රටට, කාලයෙන් කාලයට ඉර උදාවීම වෙනස් වන්නාක් මෙන්, උදේ හිමිදිරියත් වෙනස් වේමය. ඒ මෙසේයි :

"The duration of [morning] twilight considerably varies geometrically with latitude, longitude and calendar date."[1]

"ජ්‍යාමිතිකාකාරයෙන් ගනු ලබන අක්ෂාංශය වශයෙනුත් රේඛාංශය වශයෙනුත් ලිත් දිනය වශයෙනුත් උදේ හිමිදිරිය පවත්න කාලසීමාව [ලොවෙහි තැනින් තැන] සැලකිය යුතු ලෙස වෙනස් වේ."[1]

"[Morning] Twilight typically has the shortest duration at the equator and increases in duration as one approaches the North or South Poles."[2]

"ඉතාම කෙටි උදේ හිමිදිරි කාලසීමාව නිරක්ෂය ආසන්නයේ පවතී. [එතැන් සිට] උත්තර ධ්‍රැවයට හෝ දක්ෂිණ ධ්‍රැවයට විහිදෙන දුර ප්‍රමාණයට අනුව උදේ හිමිදිරිය පවත්න කාලසීමාව ද [දුර අනුව] වැඩිවේ."[2] මෙය සටහනකින් මෙසේ දැක්විය හැක :

සටහන 19




1. Van Nostrand Scientific Encyclopaedia, ....
2. The Encyclopedia Americana, ....

උදාහරණය -

උදේ හිමිදිරිය හා ඉර උදාවීම රටින් රටට වෙනස්වන බවට උදාහරණයක් වශයෙන් ශ්‍රී ලංකාවේ කොළඹ හා දඹදිවේ නවදිල්ලිය යන අගනුවරවල් දෙක සංසන්දනය කොට මෙසේ දැක්විය හැක:




| | නක්ෂත්‍ර හිමිදිරිය | | පොදුජන හිමිදිරිය | | ඉර උදාවීම | |
|---|---|---|---|---|---|---|
| | වැඩි තරමින් | අඩු තරමින් | වැඩි තරමින් | අඩු තරමින් | වැඩි තරමින් | අඩු තරමින් |
| | ජනවාරි 29 | ජුනි 1 | ජනවාරි 24 | ජුනි 1 | ජනවාරි 24 | ජුනි 1 |
| නවදිල්ලිය[1] | 5:44 | 3:33 | 6:41 | 4:42 | 7.08 | 5:09 |
| කොළඹ | 5:17 | 4:38 | 6:07 | 5:31 | 6:29 | 5:53 |

මෙම සංඛ්‍යා ලේඛන අනුව,

**නවදිල්ලිය** නක්ෂත්‍ර හිමිදිරිය පටන්ගන්න වේලාව අඩු තරමින් ඉර උදාවට පැ.1:24 ක් කලින්ය.
නවදිල්ලිය නක්ෂත්‍ර හිමිදිරිය පටන්ගන්න වේලාව වැඩි තරමින් ඉර උදාවට පැ.1:36 ක් කලින්ය.
නවදිල්ලිය පොදුජන හිමිදිරිය පටන්ගන්න වේලාව අඩු තරමින් ඉර උදාවට වි.0:27 ක් කලින්ය.
නවදිල්ලිය පොදුජන හිමිදිරිය පටන්ගන්න වේලාව වැඩි තරමින් ඉර උදාවට වි.0:27 ක් කලින්ය.

**කොළඹ** නක්ෂත්‍ර හිමිදිරිය පටන්ගන්න වේලාව අඩු තරමින් ඉර උදාවට පැ.1:12 ක් කලින්ය.
කොළඹ නක්ෂත්‍ර හිමිදිරිය පටන්ගන්න වේලාව වැඩි තරමින් ඉර උදාවට පැ.1:15 ක් කලින්ය.
කොළඹ පොදුජන හිමිදිරිය පටන්ගන්න වේලාව අඩු තරමින් ඉර උදාවට වි.0:21 ක් කලින්ය.
කොළඹ පොදුජන හිමිදිරිය පටන්ගන්න වේලාව වැඩි තරමින් ඉර උදාවට වි.0:23 ක් කලින්ය.[2]

**සංලක්ෂ්‍යය** - ඉහත දැක්වූ වේලාවන් පරිදි, නවදිල්ලියේ නක්ෂත්‍ර හිමිදිරිය පටන්ගන්න වේලාව වැඩි තරමින් ජුනි මාසයේ ඉර උදාවට පැ.1:36 ක් කලින්ය. එනම් සිංහල පැය 4 ක් කලින් යන අර්ථයයි. "ලංකාවේ අරුණෝදය ඉර උදාවට පැ.1:36 ක් කලින් සිදුවේ යැ"යි යන මේ ගණන් ක්‍රමය කලින් පිළිගෙන තිබුනත් ඉහත සඳහන් වේලාවන් අනුව එය නවදිල්ලිය නක්ෂත්‍ර හිමිදිරිය බව පැහැදිලිය. නක්ෂත්‍ර හිමිදිරි අවස්ථාවේ අරුණෝදයේ තිබිය යුතු ලක්ෂණ කිසිවක් නොමැති බැවින් මේ ගණන් ක්‍රමය ශ්‍රී ලංකාව, දඹදිව යන දෙරටේම අරුණෝදයට හා පොදුජන හිමිදිරියට නොගැලපේ.

1. නවදිල්ලිය සම්බන්ධ තොරතුරු The Astronomical Almanac, Washington: U.S.Govt. Printing Office, London:HMSO, 1996 යන පොතෙහි Astronomical Twilight, Civil Twilight, Sunrise Lat. +30° යනු තොරතුරු කරුණාකර බලන්න. නවදිල්ලිය රේඛාංශය +77°.17 සඳහා මෙහි විනාඩි 11ක් තිසි පරිදි යොදවා ඇත.
2. කරුණාකර 79 වැනි පිට බලන්න.

## VI. ශ්‍රී ලංකාවේ පොදුජන හිමිදිරිය හා අරුණෝද්ගමනය

පොදුජන හිමිදිරියේදී අහස පැහැදිලි නම් කෘතිම එළියෙන් නොව, ස්වාභාවික එළියෙන්ම එළිමහනේ නොයෙක් සාමාන්‍ය වැඩ කටයුතුවල යෙදිය හැකි බව හා ශ්‍රී ලංකාවේ පොදුජන හිමිදිරිය ඉර උදාවට විනාඩි 21 ක්-23 ක් හෝ කලින් සිදු වන බව ඉහත සඳහන් විය. එහෙත් අහස පැහැදිලි නම් ලොකු ගස්, ගල්, කඳු ආදී ආවරණ තොර වූ විවෘත තැන්වලදී ඉර උදාවට විනාඩි **30 ක්-35 ක්** හෝ කලින් පාර දකින්ට, මිනිස්සුන් දකින්ට, පොඩි දරුවන් දකින්ට, සර්පයන් ආදී සතුන් දකින්ට, බඩු දකින්ට, උපකරණ දකින්ට, නිල් රතු කහ සුදු කොළ යනාදි පාටත් දකින්ට ද ගමන් කරන්ට ද අවශ්‍ය තරම් සෑහෙන ස්වාභාවික ආලෝකයක් පවතී. මෙම වේලාව ඉහත ධම්මපද අටුවාවෙහි සඳහන් කළ බාණු කොණ්ඩඤ්ඤ තෙරුන්ගේ කථාව අනුවත්, සෝසක සිටුගේ උපත කථාව අනුවත්, වෙන පෙළ අටුවා ටීකාවෙහි සඳහන් කළ කථාවන් හා විස්තර අනුවත් අරුණෝද්ගමන වේලාවට ගැලපේ.

ඇත්තෙන්ම **පොදුජන හිමිදිරියේදී** එළිමහනේ සාමාන්‍ය වැඩ කටයුතු කරගෙන යෑමට **සියුම් ලෙස** අරමුණු දකින්ට ද උපකරණ පරිහරණය කරන්ට ද අවශ්‍ය තරම් සෑහෙන ආලෝකයක් පවතී. එහෙත් **අරුණෝද්ගමනයේදී** (ඉර උදාවට වි. 30ක්-35ක් හෝ කලින්) එළිමහනේ **සාමාන්‍ය ලෙස** අරමුණු දකින්ට ද හා ගමන් කරන්ට දැන් අවශ්‍ය තරම් සෑහෙන ආලෝකයක් පවතී. මෙම වේලාවේ සූර්යාලෝකය පැතිරී ගිය හෙයින් සිව් දිසාවන්හි සුදු පැහැයක් පෙනේ. මුළු රාත්‍රිය ගෙවී එළිවේ යන අර්ථයයි.[1]

මෙසේ පාළි පාඨ අනුකූලව ශ්‍රී ලංකාවේ අරුණෝද්ගමනයේ අවශ්‍ය ලකුණු හා නිමිති ඉර උදාවට විනාඩි 30ක්-35ක් හෝ කලින් පහළ වේ. මෙහි විනාඩි **35** ක් කලින් යනු දෙසැම්බර්, ජනවාරි, පෙබරවාරි යන මේ මාස තුනකදී මෙසේ පහළ වේ. ඉතිරි කාලයේ සාමාන්‍යයෙන් ඉර උදාවට විනාඩි 30 ක්, 31 ක්, 32 ක්, 33 ක්, 34 ක් හෝ කලින් ඒ ලකුණ හා නිමිති පහළ වේ.

එහෙයින් ශ්‍රී ලංකාවේ මුළු වර්ෂයක් තුළ **සාධාරන වේලාව වශයෙන්** අරුණෝද්ගමනය ඉර උදාවට විනාඩි 30 ක් කලින් තිබිය යුතු යැයි සංස්කාරකගේ යෝජනාවකි.

ඊළඟ පිටෙහි සංඛ්‍යා ලේඛනය ශ්‍රී ලංකාවේ වර්ෂයක් තුළ සාධාරන අරුණෝද්ගමන වේලාව (ඉර උදාවට වි.30 ක් කලින්), නියම ඉර උදාවන වේලාව හා නියම මධ්‍යහ්න වේලාව පෙන්වයි. ඒ මෙසේයි:

1. පොදුජන හිමිදිරියේදී ත් අරුණෝද්ගමනයේදී ත් **සමහර දවස්වල** අහස පැහැදිලි නැත්නම් විනාඩි **5** කට පසු ඒ ආලෝකයක් පවතී.

# ශ්‍රී ලඞ්කාවේ අරුණෝද්ගමනය,
## ඉර උදාවීම හා මධ්‍යාහ්නය

| දිනය | අරුණෝද්ගමනය | ඉර උදාවීම | මධ්‍යාහ්නය |
|---|---|---|---|
| **ජනවාරි** | | | |
| 1 | 5:52 | 6:22 | 12:14 |
| 3 | 5:53 | 6:23 | 12:15 |
| 6 | 5:54 | 6:24 | 12:16 |
| 8 | 5:55 | 6:25 | 12:17 |
| 10 | 5:56 | 6:26 | 12:18 |
| 14 | 5:57 | 6:27 | 12:19 |
| 18 | 5:58 | 6:28 | 12:21 |
| 24 | 5:59 | 6:29 | 12:22 |
| **පෙබරවාරි** | | | |
| 10 | 5:58 | 6:28 | 12:24 |
| 16 | 5:57 | 6:27 | 12:25 |
| 20 | 5:56 | 6:26 | 12:24 |
| 23 | 5:55 | 6:25 | 12:24 |
| 27 | 5:54 | 6:24 | 12:23 |
| **මාර්තු** | | | |
| 1 | 5:53 | 6:23 | 12:23 |
| 4 | 5:52 | 6:22 | 12:22 |
| 6 | 5:51 | 6:21 | 12:22 |
| 9 | 5:50 | 6:20 | 12:21 |
| 11 | 5:49 | 6:19 | 12:21 |
| 13 | 5:48 | 6:18 | 12:20 |
| 15 | 5:47 | 6:17 | 12:20 |
| 18 | 5:46 | 6:16 | 12:19 |
| 20 | 5:45 | 6:15 | 12:18 |
| 22 | 5:44 | 6:14 | 12:18 |
| 24 | 5:43 | 6:13 | 12:17 |
| 26 | 5:42 | 6:12 | 12:16 |
| 28 | 5:41 | 6:11 | 12:16 |
| 30 | 5:40 | 6:10 | 12:15 |
| **අප්‍රේල්** | | | |
| 1 | 5:39 | 6:09 | 12:15 |
| 3 | 5:38 | 6:08 | 12:14 |
| 5 | 5:37 | 6:07 | 12:13 |
| 7 | 5:36 | 6:06 | 12:13 |

| දිනය | අරුණෝද්ගමනය | ඉර උදාවීම | මධ්‍යාහ්නය |
|---|---|---|---|
| **අප්‍රේල් ඉතිරි කොටස** | | | |
| 9 | 5:35 | 6:05 | 12:12 |
| 11 | 5:34 | 6:04 | 12:12 |
| 14 | 5:33 | 6:03 | 12:11 |
| 16 | 5:32 | 6:02 | 12:10 |
| 18 | 5:31 | 6:01 | 12:10 |
| 21 | 5:30 | 6:00 | 12:09 |
| 23 | 5:29 | 5:59 | 12:09 |
| 26 | 5:28 | 5:58 | 12:08 |
| 29 | 5:27 | 5:57 | 12:08 |
| **මැයි** | | | |
| 3 | 5:26 | 5:56 | 12:07 |
| 7 | 5:25 | 5:55 | 12:07 |
| 11 | 5:24 | 5:54 | 12:07 |
| 19 | 5:23 | 5:53 | 12:07 |
| 31 | 5:23 | 5:53 | 12:08 |
| **ජූනි** | | | |
| 4 | 5:24 | 5:54 | 12:09 |
| 12 | 5:25 | 5:55 | 12:10 |
| 17 | 5:26 | 5:56 | 12:11 |
| 22 | 5:27 | 5:57 | 12:12 |
| 27 | 5:28 | 5:58 | 12:13 |
| **ජූලි** | | | |
| 1 | 5:29 | 5:59 | 12:14 |
| 5 | 5:30 | 6:00 | 12:15 |
| 10 | 5:31 | 6:01 | 12:16 |
| 14 | 5:32 | 6:02 | 12:16 |
| 20 | 5:33 | 6:03 | 12:17 |
| 26 | 5:34 | 6:04 | 12:17 |
| **අගෝස්තු** | | | |
| 6 | 5:35 | 6:05 | 12:16 |
| 19 | 5:34 | 6:04 | 12:14 |
| 30 | 5:33 | 6:03 | 12:11 |

| දිනය | අරුණෝද්ගමනය | ඉර උදාවීම | මධ්‍යාහ්නය |
|---|---|---|---|
| **සැප්තැම්බර්** | | | |
| 7 | 5:32 | 6:02 | 12:09 |
| 13 | 5:31 | 6:01 | 12:07 |
| 19 | 5:30 | 6:00 | 12:05 |
| 25 | 5:29 | 5:59 | 12:02 |
| **ඔක්තෝම්බර්** | | | |
| 2 | 5:28 | 5:58 | 12:00 |
| 10 | 5:27 | 5:57 | 11:58 |
| 31 | 5:28 | 5:58 | 11:54 |
| **නොවැම්බර්** | | | |
| 7 | 5:29 | 5:59 | 11:54 |
| 11 | 5:30 | 6:00 | 11:55 |
| 15 | 5:31 | 6:01 | 11:55 |
| 18 | 5:32 | 6:02 | 11:56 |
| 21 | 5:33 | 6:03 | 11:56 |
| 24 | 5:34 | 6:04 | 11:57 |
| 27 | 5:35 | 6:05 | 11:58 |
| 29 | 5:36 | 6:06 | 11:59 |
| **දෙසැම්බර්** | | | |
| 1 | 5:37 | 6:07 | 12:00 |
| 3 | 5:38 | 6:08 | 12:01 |
| 5 | 5:39 | 6:09 | 12:02 |
| 8 | 5:40 | 6:10 | 12:03 |
| 10 | 5:41 | 6:11 | 12:04 |
| 12 | 5:42 | 6:12 | 12:05 |
| 14 | 5:43 | 6:13 | 12:06 |
| 16 | 5:44 | 6:14 | 12:07 |
| 17 | 5:45 | 6:15 | 12:07 |
| 19 | 5:46 | 6:16 | 12:08 |
| 21 | 5:47 | 6:17 | 12:09 |
| 23 | 5:48 | 6:18 | 12:10 |
| 25 | 5:49 | 6:19 | 12:11 |
| 28 | 5:50 | 6:20 | 12:12 |
| 30 | 5:51 | 6:21 | 12:13 |
| 31 | 5:51 | 6:21 | 12:13 |

වර්ෂයක් තුළ අරුණෝද්ගමනය සාමාන්‍ය වශයෙන් දැක්වෙන සටහන




අරුණෝද්ගමනයේදී නැගෙනහිර දිසාවේ ක්ෂිතිජයේ තද රත් පැහැයක් ද, සූර්යාලෝකය පැතිරී ගිය හෙයින් ඉතිරි දිසාවන්හි සුදු පැහැයක් ද පෙනෙයි. එම වේලාවේම රෑ එළි වෙයි. අවට පරිසරයේ මිනිස්සු, පාර, ගස් කොලන් ආදී අරමුණු විදුලි පන්දම් ආදී කෘතිම එළි නොමැතිව දෘශ්‍යමාන වේ. මෙය ශ්‍රී ලංකාවේ සාමාන්‍යයෙන් ඉර උදවට විනාඩි 30ක් කලින් සිදුවේ.

*පෙළ අටුවා ටීකා හා විද්‍යාත්මක පර්යේෂණය අනුවයි.*

## අටවැනි පරිච්ඡේදය

# නිගමනය

මෙම ග්‍රන්ථයෙහි මෙතෙක් ප්‍රකාශයට පත්කරණ ලද විශේෂ කරුණු මේ අයුරින් සංග්‍රහ කොට දැක්විය හැක:

- දිවිහිමියෙන් සසුන්ගත කුලපුත්‍රයාගේ විනය ප්‍රතිපත්තිය "තමාගේ මතය" (අත්තනො මති) අනුව සැදුම් ලද්දක් නොව, පෙළ අටුවා ටීකා නැතහොත් සූත්‍ර-සූත්‍රානුලෝමය-අටුවාචර්යවාදයන් මුලික කරගෙන ඒවාට අනුකූලව සකස් කරණ ලද්දකි. පෙළ අටුවා හා ටීකා මගින් අරුණ හා අරුණෝද්ගමනය සම්බන්ධව පැහැදිලිකරණ කරුණු හා එම කරුණු නිරීක්ෂණය කිරීම තුළින් පැහැදිලිවම සත්‍ය බව සනාථ කරණ දත්තයන්ගේ සංක්ෂිප්ත විස්තරය මෙසේය:

- විනය පිටකයෙහි ඇතුලත් වන්නාවූ බොහෝ ශික්ෂාපදයන්ගේ ඇවැත් විනිශ්චය සඳහා භාවිත කරුණු ලබන්නාවූ ප්‍රධානතම මිම්ම අරුණ නොව අරුණෝද්ගමනයයි. පෙළ අටුවා හා ටීකාවන්හි සඳහන්වන පරිදි අරුණ හා අරුණෝද්ගමනය හඳුනා ගැනීමේ විශේෂ ලකුණු හා නිමිති පරීක්ෂා කරණ විට මෙලෙස පෙනෙයි:

- **අරුණ** නම් නැගෙනහිර දිශාවේ ක්ෂිතිජයේ කොටසක් පමණක් ඉර උදවට පෙර පහළ වන සූර්යයාගේ මඳ රතුපාට ප්‍රභාවයි (ආලෝකයයි).

  මේ අරුණ අවස්ථාවේ හාත්පස තවම අන්ධකාරයක් පවතී. සිව් දිග හා අවට පරිසරයෙහි එකම පැහැයක් පවතී, එනම් කලු පාටයි. රෑ දහවල් දෙකෙහි පිරිසිඳීමක් (වෙන්වීමක්) මේ අවස්ථාවේ දක්නට නැත. පහන්, විදුලි පන්දම් ආදී කෘතිම ආලෝකයක් නොමැතිව වස්තූන්, රූප ආදිය නොපෙනෙයි. ගමන් බිමන් යාමත් කෘතිම ආලෝකයක් නොමැතිව මධ්‍යම රාත්‍රියේදී මෙන් ඉතාම අසීරු තත්වයක පවතී.

- **අරුණෝද්ගමනය** නම් අරුණ අවස්ථාවේදී පහළ වන්නාවූ ඒ මඳ රතුපාට ආලෝකය ක්‍රම ක්‍රමයෙන් තද රතුපාට වී උඩට නැගීමය (උද්ගමනය වීමය).

  • මේ අවස්ථාවේදී වැඩීගෙන එන්නාවූ තද රතුපාට ආලෝකය පළල් අතට මුළු නැගෙනහිර දිශාවේ පහළ කොටසේ පැතිරී යයි. උස් අතට මේ අවස්ථාවේ පටන් ඊට වඩා උඩට නොයයි. ශීර්ෂයට නැතහොත් මුදුනට පැමිණේ. 'අරුණ ශීර්ෂය', 'රතුපාට ශීර්ෂය' පහළ වේ යන අර්ථයයි.

  • මේ අවස්ථාව වනවිට සූර්යයාගේ ආලෝකය සිව් දිග පැතිරී පවතියි. අහස සෑම දිසාවන්හිම සුදුපාට බවකින් ප්‍රසන්න (පහන්) බවකින් ද දක්නට ලැබෙයි.

  • මේ මොහොත වනවිට රාත්‍රියෙන් කොටසක් නොව මුළු රාත්‍රියම ගෙවී, අවසන් වී, අඳුරත් නැති වී එළි වෙයි. රාත්‍රිය ප්‍රසන්න වූ ද සතුටුදායක වූ ද පෙනුමක් ඇති වී පෙනෙයි.

  • නව දිනයක් ආරම්භ වෙයි. රෑ දහවල් අතර පිරිසිඳීමක් (වෙන්වීමක්) දක්නට ලැබෙයි.

- අවට පරිසරයේ පෙනීමට ප්‍රමාණවත් ස්වාභාවික ආලෝකයක් පවතී. ගිනිහුළු, පහන්, විදුලි පහන්, විදුලි පන්දම් ආදී කෘතිම එළි අවශ්‍ය නැත.

- පෙර (රාත්‍රී කාලයේදී) නොපෙනුන රූප මේ වනවිට දක්නට ලැබෙයි. මිනිසුන්, පොඩි දරුවන්, බඩුබාහිරාදිය, පාරවල්, පොකුණු, නෙළුම් මල්, මල්, ගස්කොළන් මෙන්ම නිල්, රතු, කහ, සුදු ආදී වර්ණයන් ද කෘතිම එළි නොමැතිව දැකීමට හැකිවෙයි.

- සිරුරු පිළිදැගුම්, මූණකට සේදීම්, කැඳ ආදී භෝජනයන් පිළිගැනීම්, අනුභව කිරීම් හා ගමන් බිමන් යාම ද කෘතිම ආලෝක නොමැතිව ස්වාභාවික ආලෝකයෙන්ම කරගත හැක.

- මෙම අරුණෝද්ගමනය වේලාවේ පටන් ක්‍රම ක්‍රමයෙන් එළිවීම වැඩිවේ.

\- **ඉර උදව** නම් ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වශයෙන් අරුණෝද්ගමනයට විනාඩි තිහකට (30ට) පමණ පසුව සිදුවෙයි. මේ අයුරින් සලකා බලන විට අරුණෝද්ගමනය ඉර උදවට පැය බාගයට පමණ පෙර සිදුවන්නාවූ සංසිද්ධියකි. දඹදිව ආදී උතුරු ප්‍රදේශයේ රටවල ඉර උදවීමට විනාඩි 45කට හෝ ඊට වැඩි කාලයකට පෙර අරුණෝද්ගමනය සිදුවෙයි.

\- වර්ෂයක් තුළ, ඉර උදවන වේලාව මෙන්, මෙකී අරුණෝද්ගමන වේලාව ද රටින් රටට, ප්‍රදේශයෙන් ප්‍රදේශයට හා දවසින් දවසට වෙනස් වේ. කෙසේ හෝ වේවා, අරුණෝද්ගමන වේලාව විනිශ්චය කිරීමට අවශ්‍ය වන්නාවූ සාධක නම්ඃ *ඉර උදවට පෙර සතර දිග සුදු ආලෝකයක් පහළවීම හා අවට පරිසරය තුළ සාමාන්‍ය ඇසට පෙනීමට ප්‍රමාණවත් ස්වාභාවික ආලෝකයක් වැටීමත්* යන කරුණුය.

# උපග්‍රන්ථය

# උපග්‍රන්ථය I

## විනයාලංකාර ටීකාවෙහි අරුණේ පාට පිළිබඳ සාකච්ඡාවකි

පාළි

සිංහලානුවාදය

**පුච්ඡා:**

"කීදිසො අරුණස්ස වණ්ණො"ති?

**ප්‍රශ්නය:**

"අරුණේ පාට කෙබඳුද?

**විස්සජ්ජනා:**

එත්ථ අබ්‍යත්තරත්තවණ්ණො තස්ස වණ්ණො භවෙ. වුත්තඤ්හි අභිධානප්පදීපිකායං:- "අරුණො කිඤ්චි රත්තොථා"ති. තට්ටීකායඤ්ච:-"කිඤ්චිරත්තො අබ්‍යත්තරත්තවණ්ණො අරුණො නාම, යථා මච්ඡස්ස අක්ඛී"ති. විමතිවිනොදනියඤ්ච:-"වඩ්ඪනඝන-රත්තො පභාවිසෙසො"ති.

**පිළිතුර:**

මෙහි මඳ රතුපාට ඒ අරුණේ පාට වේ. අභිධානප්පදීපිකාවෙහි [97 ගා.] එය මෙසේ කියන ලදි:- "අරුණ නම් කිසියම් රතුපාටයි." එම ටීකාවෙහි ද:-"අරුණ නම් කිසියම් රතුපාටයි. මාලුවාගේ ඇස්වල පාට මෙනි." විමතිවිනොදනියෙහි ද [258 පි.]:- "වැඩීගෙන එන තද රතුපාට ප්‍රභා විශේෂයෙකැ"යි කියන ලදි.

තස්මා සූරියස්ස **රත්තප්පභා** යෙව අරුණො නාම. න සෙතප්පභාදයො"ති දට්ඨබ්බං.

එබැවින් සූර්‍යයාගේ **රතුප්‍රභාවම** අරුණ නමි. සුදු ප්‍රභා ආදිය යැයි නොදත යුතුය.

**පුච්ඡා:**

යදි එවං:

"තතියම්පි ඛො ආයස්මා ආනන්දො අභික්කන්තාය රත්තියා, නික්ඛන්තෙ පච්ඡිමෙ යාමෙ, උද්ධස්තෙ අරුණෙ, **නන්දිමුඛියා රත්තියා**... භගවන්තං එතදවොච:"...උද්දිසතු...භගවා පාතිතමොක්ඛන්"ති" විමතිවිනොදනියං:- "පාළියං පන '**නන්දිමුඛියා**'ති ඔදතදිසාමුඛතාය, තුට්ඨමුඛියා"ති වුත්තං. තං කථං යුජෙය්‍යා"ති?

**ප්‍රශ්නය:**

ඉදින් මෙසේ නම්:

"තෙවනුව ද ආයුෂ්මත් ආනන්ද තෙරුන් වහන්සේ රාත්‍රිය ගෙවුණු කල්හි, පශ්චිම යාමය නික්මගිය කල්හි, **අරුණ නැගි කල්හි** (*උද්ධස්තෙ අරුණෙ*), **රාත්‍රිය සතුටුදායක පෙනුමක් ඇති වූ කල්හි** (*නන්දිමුඛියා රත්තියා*)...භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ කීය:'...භාග්‍යවතුන්වහන්සේ... පාමොක් උදෙස සේක්වා"යි (චූ.ව.ii.424) යනු විමතිවිනොදනියෙහි (478 පි.):- "පෙළෙහි වනාහි '**සතුටුදායක පෙනුමක් ඇති වූ කල්හි** (*නන්දිමුඛියා*) යනු:දිසාවන් **සුදුපාටකින්** පෙනෙන බැවින්, තුටුදායක පෙනුමක් ඇති වූ කල්හියැ"යි කියන ලදි. මේ [විස්තරය] කෙසේ යෙදේද?

**විස්සජ්ජනා:**

නො න යුජ්ජෙය්‍ය. තත්ථ හි අරුණුග්ගතකාලෙ අරුණොභාසෙන ඔදතදිසාමුඛභාවො

**පිළිතුර:**

නොයෙදෙන්නේ නොවේ. එහි වනාහි අරුණ නැගි කල්හි අරුණු එළිය හෙතු කොට ගෙන

වුත්තො. න අරුණොභාසස්ස ඔදාතභාවො. වුත්තඤ්හෙතං උදානට්ඨකථායං:-"**නන්දිමුඛියා**'ති අරුණස්ස උග්ගතත්තා එව අරුණප්පභාය සූරියාලොකූපජීවිනො සත්තෙ නන්දපනමුඛියා විය රත්තියා ජාතාය; විභාතමානායා'ති අත්ථො"ති.

දිසාවන් සුදුපාටකින් පෙනෙන බව කියන ලදි. අරුණු එළියේ සුදුපාට බවක් නොකියන ලදි. එය උදාන අටුවාවෙහි ද [124 පි.]මෙසේ කියන ලදි:-

"**සතුටුදයක පෙනුමක් ඇති වූ කල්හි** (නන්දිමුඛියා) යනුඃ අරුණ නැගී බැවින්ම අරුණ ප්‍රභාවෙන් සූර්‍ය්‍යාලෝකය නිසා ජීවත්වන සත්වයන් සතුටු කරවන පෙනුමක් ඇති මෙන් හටගත් රාත්‍රියයි;[රාත්‍රිය] **එළිවූ කල්හි** (විභාතමානාය) යන අර්ථයි."

ජාතකට්ඨකථායං ච:-

'ජිසඤ්ඤරත්තිං අරුණස්මිං උහතෙ
යා දිස්සති උත්තමරූපවණ්ණිනී,
තථූපමා මං පටිභාසි, දෙවතෙ,
ආචික්ඛ මෙ තං කතමාසි අච්ඡරා'ති?"

ජාතක අටුවාවෙහි [vi.241] දඃ

"ජිසඤ්ඤරත්තිං අරුණස්මිං උහතෙ,
යා දිස්සති උත්තමරූපවණ්ණිනී,
තථූපමා මං පටිභාසි, දෙවතෙ,
ආචික්ඛ මෙ තං කතමාසි අච්ඡරා'ති?

ඉමස්සා ගාථාය අත්ථවණ්ණනායං:-"තත්ථ '**ජිසඤ්ඤරත්තින්**'ති: පච්ඡිමරත්තිං. රත්තිපරියොසානෙ'ති අත්ථො. '**උහතෙ**' ති: අරුණෙ උග්ගතෙ.'**යා**'ති: යා පුරත්ථිමා දිසා රත්තසුවණ්ණතාය උත්තමරූපධරා හුත්වා දිස්සතී'ති."

යන මේ ගාථාවෙහි අර්ථ වර්ණනාවේ :-"එහි '**ජිසඤ්ඤරත්තිං**' යනුඃ රාත්‍රියේ කෙළවර. 'රාත්‍රියෙහි අවසානයේ' යනු අර්ථයි. '**උහතෙ**' යනුඃ අරුණ නැගී කල්හි. '**යා**' යනුඃ යම් නැගෙනහිර දිසාවක් ලස්සන රතුපාට ඇති බැවින් උතුම් රූපයෙන් යුතුව පෙනේ' යනුවෙනි.

එවං අරුණුග්ගතසමයෙ පුරත්ථිමදිසාය රත්තවණ්ණතා වුත්තා. තස්මා තස්මිං සමයෙ අරුණස්ස උට්ඨිතත්තා,

(i) පුරත්ථිමාය දිසාය රත්තභාගො,
(ii) සූරියාලොකස්ස පත්ථටත්තා සෙසදිසානං ඔදාතභාවො විඤ්ඤායති.

මෙසේ අරුණ නැගී කල්හි නැගෙනහිර දිසාවේ රතුපාට බව කියන ලදි. එහෙයින් එකල්හි අරුණ නැගීසිටි බැවින්,

(i) නැගෙනහිර දිසාවේ රතුපාට කොටස ද
(ii) සූර්‍ය්‍යාලෝකය පැතුරුන බැවින් සෙසු දිසාවන්හි සුදුපාට බව ද දක්නා ලැබේ.

ඉමං පඤ්හවිස්සජ්ජනං සාධුකං මනසිකරිත්වා පණ්ඩිතෙහි '**රත්තොභාසොයෙව අරුණො**'ති පච්චෙතබ්බො, සල්ලක්ඛෙතබ්බො'ති."

මේ ප්‍රශ්න හා පිළිතුරු මනාසේ මෙනෙහි කොට පණ්ඩිතයන් විසින් '**රතු එළියම අරුණ** යැ'යි අවබෝධ කළ යුතුයි, සැළකිය යුතුයි."

(විත.අ.ටී.1.0021-23)

# උපග්‍රන්ථය II

## මහාචාර්ය රේරුකානේ චන්ද්‍රවිමල මහානායක ස්ථවිර පාදයන් වහන්සේ විසින් අරුණෝදය පිළිබඳ විස්තරය

1. "විනය ක්‍රමයේ සැටියට අරුණෝදයෙන් දිනයේ පටන් ගැනීම සලකනු ලැබේ.

**"සූරස්සොදයතො පුබ්බුට්ඨිතරංසි සියාරුණො"**

යනුවෙන් අභිධානප්පදීපිකාවෙහි උදවන සූර්‍ය්‍යයාගේ පළමු නැගී එන රශ්මිය 'අරුණය'යි දක්වා තිබේ. **අරුණ** යනු මඳ රත් පැහැයට ද නමකි. ඒ නම පළමුවෙන් උදවන හිරු-රැසට තබා ඇත්තේ, ඒ හිරු-රැසත් මඳ රත් පැහැය ඇති බැවිනි. ඒ රශ්මිය **සූර්යෝදයට පැය බාගයකට පමණ කලින්** නැගෙනහිරදිග අහසෙහි දක්නා ලැබේ. ඒ ආලෝකය අහසෙහි දෘශ්‍යමානවීමෙන් විනය ක්‍රමයේ සැටියට අතීත දිනයේ ඉක්මීමත්, වර්තමාන දිනයේ පටන් ගැනීමත් සලකනු ලැබේ." (**විනය කර්ම පොත**-වත්මානත් පිරිම ගැන දතයුතු කරුණු- ප්‍රථම මුද්‍රණය 1955...චතුර්ථ මුද්‍රණය 1992)

2. "**අරුණ** යනු මඳ රත් පැහැයට නමෙකි.... ඒ රත් පැහැය මුලින් දක්නා ලැබෙන්නේ හඳුනා ගැනීමටත් නුපුළුවන් වන තරමට ඉතා සියුම් ලෙසය. ක්‍රමයෙන් එය වර්ධනය වී පැහැදිලි වෙයි. මේ අරුණාලෝකය **සූර්යෝදයට පැය බාගයකට පමණ කලින්** නැගෙනහිර දිග අහසෙහි දැකිය හැකිය. එය බලා අරුණ උදවන කාලය සැලකිය යුතුය." (**උපසම්පද ශීලය** - සිවුරු පිළිබඳ ශික්ෂාපද, දවස හා අරුණ - ප්‍රථම මුද්‍රණය 1970)

**සංලක්ෂ්‍යය**- මේ පොත් දෙකේම (ප්‍රථම මුද්‍රණය:1955;1970) දැක්වූ පරිදි අරුණෝදය සිදු වෙන්නේ **සූර්යෝදයට පැය බාගයකට පමණ කලිනි**. එසේ නම් (i) වැඩි තරමින් ජනවාරි මාසයේ අවසානයේ **සූර්යෝදයට (6:29ට) පැය බාගයකට** පමණ කලින් **අරුණෝදය 5:59ට** සිදුවේ. (ii) අඩු තරමින් මැයි මාසයේ අවසානයේ **සූර්යෝදයට (5:53ට) පැය බාගයකට** පමණ කලින් **අරුණෝදය 5:23ට** සිදුවේ. ඉහත කී පරිදි මෙම වේලාව ප්‍රත්‍යක්ෂයෙන් ඔප්පු කළ හැකිය. එහෙත් '**ශාසනාවතරණය**' නමැති පොතේ උන්වහන්සේ අමුතු විස්තරයක් කරති. එය මෙසේයි:

3. "සාමාන්‍යයෙන් **පෙරවරු 5 ටත් 5.30 ටත් අතර කාලයේ අරුණ නැඟුණු වෙලාවේ පටන්** පැවිද්දන්ටත්, අටසිල් රක්නා උපාසකෝපාසිකාවන්ටත් ආහාර වැළඳීම සුදුසු ය. අරුණ නැඟීමට කලින් වැළඳුව හොත් සිකපදය බිඳේ. අලුයම් කාලයේ අහස දෙස බලා අරුණ සොයා ගත යුතුය." (**ශාසනාවතරණය** - විකාල භෝජන වේරමණී - ප්‍රථම මුද්‍රණය 1960)

**සංලක්ෂ්‍යය**- ශාසනාවතරණයෙහි (ප්‍රථම මුද්‍රණය:1960) දැක්වූ වේලාව (5-5:30) අනිත් පොත් දෙක සමඟ නොම ගැළපේ. එසේම, මැයි හා ජුනි යන මේ මාස දෙක හැර මේ වේලාව ප්‍රත්‍යක්ෂයෙන් ඔප්පු කළ නොහැකිය. අහස දෙස බැලුව හොත් එකම පාටයි පෙනෙන්නේ, එනම් කළුපාටයි. එම නිසා, ශාසනාවරතරණයෙහි මෙය ප්‍රමාද දෝෂයකැයි සැලකිය යුතුයි.

# උපග්‍රන්ථය III

## පබ්බජ්ජා විනිශ්චය

මේ කාලයෙහි ඇතැම් සඞ්ඝයා වහන්සේලා අතර අරුණ, පැවිද්ද (සාමණේර භූමිය) හා උපසම්පද සම්බන්ධව මෙවැනි මතයක් පවතී. එනම්:

"සාමණේර ශික්ෂාපද දහයෙන් එකකුදු කඩ කළ හොත් සාමණේර භූමිය (භාවය) බිඳේ. උපසම්පදව ලැබුණාත් උපසම්පද භූමියෙහි ද නොම පිහිටයි. මේ ලෙස නියම **අරුණ** නොදැනීම නිසා **විකාල භෝජන ශික්ෂාපදය** කඩ කළ හොත් උපසම්පද භූමියෙහි පිහිටන්නේ නැත" යනුයි.

කෙසේ වුවත් පෙළ අටුවා ටීකා ආදි පොත් බලන විට මෙම මතය එක දෙස වශයෙන් මිස සම්පූර්ණයෙන් නොගැළපේ. ඒ පොත් අනුව: (i) සාමණේර **මූල් ශික්ෂාපද පසින්** එකකුදු දැන දැන කඩ කළ හොත් සරණ ගමනයේ පටන් සාමණේර භූමිය ද සියලු සාමණේර ශීලය ද බිඳේ. (ii) විකාල භෝජනය... ජාතරූප රජත පටිග්ගහනා යන **ඉතිරි ශික්ෂාපද පසින්** එකකුදු කඩ කළ හොත් සරණ ගමනය ද සාමණේර භූමිය ද නොම බිඳේ. එහෙත් වරද කළ සාමණේරයන් ලවා දඬුවම් කරවා ආයති සංවරයෙහි පිහිටවීම පිණිස ශික්ෂාපද සමාදනයත් කරවිය යුතුයි. ඒ මුළු විනිශ්චය පිළිබඳ විස්තර මෙසේයි:

### I. සාමණේර භූමිය හා සාමණේර ශික්ෂාපද අතර වෙනස

| පාළි | සිංහලානුවාදය |
| --- | --- |
| වුත්තං හෙතං භගවතා: [i] "අනුජානාමි, භික්ඛවෙ, තීහි සරණගමනෙහි සාමණෙරපබ්බජ්ජං. එවඤ්ච පන, භික්ඛවෙ, පබ්බාජෙතබ්බො: පඨමං කෙසමස්සුං ඔහාරෙත්වා, කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා...එවං වදෙහී'ති වත්තබ්බො: 'බුද්ධං...ධම්මං...සඞ්ඝං සරණං ගච්ඡාමි. දුතියම්පි,...තතියම්පි, ...ගච්ඡාමී'ති. අනුජානාමි, භික්ඛවෙ, ඉමෙහි තීහි සරණගමනෙහි සාමණෙරපබ්බජ්ජන්'ති." | භාග්‍යවතුන් වහන්සේ විසින් වනාහි මෙය දේශනා කරන ලදි: [i] "මහණෙනි, මම තුන් සරණ ගමනයෙන් සාමණේර පැවිද්ද අනුදනිමි. මහණෙනි, මෙසේ පැවිදි කළ යුතුය: පළමු කොට කෙස් රැවුල් බැහැර කරවා, කසාවත් හඳවා...'මෙසේ කියව' යි කිය යුතුය: 'බුද්ධං...ධම්මං...සඞ්ඝං සරණං ගච්ඡාමි. දුතියම්පි,...තතියම්පි,...ගච්ඡාමි'යි. මහණෙනි, මම මේ තුන් සරණ ගමනයෙන් සාමණේර පැවිද්ද අනුදනිමි'යි." (ම.ව.i. 204) |
| සමන්තපාසාදිකවිනයට්ඨකථායඤ්ච: "පබ්බජ්ජා පන යස්මා 'අනුජානාමි, භික්ඛවෙ, ඉමෙහි තීහි සරණගමනෙහි සාමණෙරපබ්බජ්ජන්'ති, අනුඤ්ඤාතා එව, තස්මා සා එතරහිපි සරණමත්තෙනෙව රුහති. **එත්තාවතා හි සාමණෙරභූමියං පතිට්ඨිතො හොති.** | සමන්තපාසාදික නමැති විනය අටුවාවෙහි ද: "පැවිද්ද වනාහි යම්හෙයකින් 'මහණෙනි, මම මේ තුන් සරණ ගමනයෙන් සාමණේර පැවිද්ද අනුදනිමි'යි, අනුදන්නා ලද්දේමය, එහෙයින් ඒ පැවිද්ද මේ කාලයෙහි ද සරණ ගමන පමණකින්ම සිදුවේ. **මෙපමණින් වනාහි හෙතෙම සාමණේර භූමියෙහි පිහිටියේ වේ.** |

සචෙ පනෙස මතිමා හොති පණ්ඩිතජාතිකො, අථස්ස තස්මිං යෙව ඨානෙ සික්ඛාපදනි උද්දිසිතබ්බානි. කථං? යථා භගවතා උද්දිට්ඨානි. වුත්තං හෙතං:-

ඉදින් හෙතෙම නුවණැති, පණ්ඩිත ස්වභාව ඇති තැනැත්තා වේ නම්, ඉක්බිති ඔහුට එතනම ශික්ෂාපදයන් උගන්වා දියයුතුයි. කෙසේද? භාග්‍යවතුන් වහන්සේ විසින් පෙන්වා දුන් පරිදි:-

[ii] "අනුජානාමි, භික්ඛවෙ, සාමණෙරානං දසසික්ඛාපදනි, තෙසු ච සාමණෙරෙහි සික්ඛිතුං: [1] පාණාතිපාතා වෙරමණී [2] අදින්නාදනා ..., [3] අබ්‍රහ්මචරියා ... [4] මුසාවාද..., [5] සුරාමෙරයමජ්ජපමාදට්ඨානා..., [6] විකාලභොජනා..., [7] නච්චගීතවාදිතවිසූකදස්සනා..., [8] මාලාගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා...,[9] උච්චාසයනමහාසයනා...., [10] ජාතරූපරජතපටිග්ගහණා වෙරමණී" ති.

[ii] "මහණෙනි, සාමණේරයන්ට ශික්ෂාපද දසයක් ද සාමණේරයන් විසින් එහි හික්මෙන්නට ද අනුදනිමි: [1] පාණාතිපාතා වෙරමණී, [2] අදින්නාදනා...,[3] අබ්‍රහ්මචරියා..., [4] මුසාවාද..., [5] සුරාමෙරයමජ්ජපමාදට්ඨානා..., [6] විකාලභොජනා..., [7] නච්චගීතවාදිතවිසූකදස්සනා..[8] මාලාගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා.. [9] උච්චාසයනමහාසයනා... [10] ජාතරූපරජතපටිග්ගහණා වෙරමණී" යනුයි.

(ම.ව.i.208)

**පබ්බජ්ජා හි සරණගමනෙහෙව සිද්ධා. සික්ඛාපදනි පන කෙවලං සික්ඛාපරිපූරණත්ථං ජානිතබ්බානි./සාමණෙරානං හි සරණගමනං භික්ඛූනං උපසම්පදකම්මවාචාසදිසං."**

**පැවිද්ද වනාහි සරණ ගමනයෙන්ම සිදුවේ. එහෙත් ශික්ෂාපද හුදෙක් ශික්ෂාව [පුහුණුව] සම්පූර්ණ කිරීම සඳහා දතයුතුයි./සාමණේරයන්ගේ සරණ ගමනය වනාහි, භික්ෂූන්ගේ උපසම්පද කම්වාක්‍යය වැනිය."**

(වින.අ. 725/757)

## රේරුකානේ චන්ද්විමල මහානායක ස්ථවිර පාදයන් වහන්සේ විසින් කරන අනුලෝම විස්තරය

[i] "පැවිදි කිරීම යනු හිස රැවුළු කැපීම, සිවුරු හැඳවීම, සරණ සමාදනය කරවීම යන මේ තුන් කිස සිදු කිරීමය. එය සිදු කිරීමෙන් පසු ප්‍රව්‍රජ්‍යාපේක්ෂකයා සාමණේර නමක් වන්නේය." (ශාසනාවතරණය, ෂෂ්ඨ මුද්‍රණය 1992, 47 පිට)

[ii] "'පාණාතිපාතා වෙරමණී සික්ඛාපදං සමාදියාමි' යනාදි සිකපද නො කීයේ ද සරණ සමාදනයෙන්ම සාමණේර භාවයට [භූමියට] පැමිණීම සිදුවේ. සිකපද කීම මෙහි ප්‍රධාන කරුණක් නොවේ./සාමණේරයන්ගේ සරණ ගමනය භික්ෂූන්ගේ උපසම්පද කම්වාක්‍යය වැනිය." (විනය කම් පොත, චතුර්ථ මුද්‍රණය 1992, 33/35 පිට)

[iii] "ගෘහස්ථයන්ගේ සරණ ගමනය, සාමණේරයන්ගේ සරණ ගමනය යන මේ දෙක්හි මහත් වෙනසක් ඇත්තේය./සාමණේර සරණ ගමනය එක්තරා විනය කර්මයෙකි. එයින් සිදු වන්නේ සාමණේර භාවයට පැමිණීමය."

(ශාසනාවතරණය, ෂෂ්ඨ මුද්‍රණය 1992, 55/56 පිට)

## II. දස නාසනා හෙවත් දස පරිජි

වුත්තං හෙතං භගවතා:

භාග්‍යවතුන් වහන්සේ විසින් වනාහි මෙය කියන ලදි:

[iii] "අනුජානාමි, භික්ඛවෙ, දසහඞ්ගෙහි සමන්නාගතං සාමණෙරං නාසෙතුං: [1] පාණාතිපාතී හොති, [2] අදින්නාදයී..., [3] අබ්‍රහ්මචාරී..., [4] මුසාවාදී..., [5] මජ්ජපායී හොති.- [6] බුද්ධස්ස ... [7] ධම්මස්ස .... [8] සඞ්ඝස්ස අවණ්ණං භාසති. [9] මිච්ඡාදිට්ඨිකො හොති. [10] භික්ඛුනීදූසකො හොති. අනුජානාමි, භික්ඛවෙ, ඉමෙහි දසහඞ්ගෙහි සමන්නාගතං සාමණෙරං නාසෙතුන්ති."

[iii] "මහණෙනි, අංග දසයකින් යුක්ත වන සාමණේරයා නසන්නට (මහණ බැවින් මුදු හරින්නට) අනුදනිමි: [1] ප්‍රාණඝාතය කරන්නේ වේ ද, [2] අදත්තාදානය කරන්නේ වේ ද, [3] මෛථුන සේවනය කරන්නේ වේ ද, [4] බොරු කියන්නේ වේ ද, [5] මද්‍යපානය කරන්නේ වේ ද, [6] බුදුන්ගේ..., [7] දහමෙහි ..., [8] සඞ්ඝයාගේ අගුණ කියා ද, [9] මිථ්‍යාදෘෂ්ටිය ගත්තේ වේ ද, [10] භික්ෂුණීන් දූෂණය කරන්නේ වේ ද. මහණෙනි, මේ අංග දසයකින් යුක්ත වන සාමණේරයා නසන්නට අනුදනිමි'යි." (ම.ව.i.212)

සමන්තපාසාදිකවිනයට්ඨකථායඤ්ච:
**"දසසු සික්ඛාපදෙසු පුරිමානං පඤ්චන්නං අතික්කමො නාසනවත්ථු. පච්ඡිමානං අතික්කමො දණ්ඩකම්මවත්ථු."**

සමන්තපාසාදික නමැති විනය අටුවාවෙහි ද:
**"ශික්ෂාපද දසයෙන් මුල් ශික්ෂාපද පස කැඩීම නාසනායට කරුණක් වේ. අන්තිම වූ ශික්ෂාපද පස කැඩීම දඬුවම් කිරීමට කරුණක් වේ."** (වින.අ.756)

එත්ථ "**නාසනවත්ථූ**"ති:පාරාජිකට්ඨානතාය ලිඞ්ගනාසනාය කාරණං."

මෙහි "**නාසනායට කරුණක් වේ**" යනු: පාරාජිකාවට හේතු වන බැවින් ලිංග නාසනායට කරුණක් වේ."[1] (විම.වි.ටී.377)

එවං [සංවාසනාසනා, ලිඞ්ගනාසනා, දණ්ඩකම්මනාසනා] "තීසු නාසනාසු ලිඞ්ගනාසනාව [ඉධ] අධිප්පෙතා. තස්මා යො පාණාතිපාතාදිසු එකම්පි කම්මං කරොති, සො ලිඞ්ගනාසනාය නාසෙතබ්බො. යථා ච භික්ඛූනං පාණාතිපාතාදීසු නානා ආපත්තියො හොන්ති, න තථා සාමණෙරානං. [1] සාමණෙරො හි කුන්ථකිපිල්ලිකම්පි [මරණචෙතනා][1] මාරෙත්වා, මංකුණඬ්ඩකම්පි භින්දිත්වා නාසෙතබ්බතං යෙව පාපුණාති. **තාවදෙවස්ස සරණගමනානි ච, උපජ්-**

මෙසේ [සංවාස නාසනාය, ලිංග නාසනාය, දණ්ඩකම්ම නාසනාය යි] "නාසනා තුනකින් මෙහි අදහස් කරන්නේ ලිංග නාසනාවය. එබැවින් යම් සාමණේරා නමක් ප්‍රාණඝාතාදීන්හි එක් කර්‍මයක් වත් කරන්නේ නම්, හෙතෙම ලිංග නාසනායෙන් නැසිය යුතුය. භික්ෂූන්ට ප්‍රාණඝාතාදීන්හි නානාවිධ වූ ඇවැත් යම්සේ වේ ද, සාමණේරයන්ට එසේ නොවේ. [1] සාමණේරයා වනාහි කුඩා පාණුවක් හෝ කූඹියක් හෝ මරා, මකුණු බිත්තරයක් වත් බිඳ කඩා නැසිය යුතු බවට

1. ශ්‍රමණ ලිංග නැසීමට, එනම් සිවුරු (ලිංග) හරවා සාමණේර භූමියෙන් පහ කිරීමට කරුණක් වේ.

**ඣායගහණඤ්ච, සෙනාසනග්ගාහො ච පටිප්පස්සම්භති. සඞ්ඝලාභං න ලභති. ලිඞ්ගමත්තමෙව එකං අවසිට්ඨං හොති.**

ම පැමිණේ.[1] **එකෙණෙහිම ඔහුගේ සරණ ගමනය ද, උපාධ්‍යාය ග්‍රහණය ද, සෙනාසන ග්‍රහණය ද සංසිඳේත්. සඞ්ඝලාභය ද නොලැබේ. ඔහුට ඉතිරි වන්නේ ශ්‍රමණ ලිංගය පමණකි.**

සො සචෙ ආකිණ්ණදෙසො ච හොති, ආයතිං සංවරෙ න තිට්ඨති, නික්කඩ්ඪිතබ්බො. අථ සහසා විරජ්ඣිත්වා දුට්ඨු මයා කතන් ති පුන සංවරෙ ඨාතුකාමො හොති, ලිඞ්ගනාසනකිච්චං නත්ථි. යථා නිවත්ථපාරුතස්සෙව සරණානි දාතබ්බානි. උපජ්ඣායො දාතබ්බො. සික්ඛාපදානි පන සරණගමනෙනෙව ඉජ්ඣන්ති. සාමණෙරානං හි සරණගමනං භික්ඛූනං උපසම්පදකම්මවාචාසදිසං. තස්මා භික්ඛූනා විය චතුපාරිසුද්ධිසීලං, ඉමිනාපි දසසීලානි සමාදින්නානෙව හොන්ති. එවං සන්තෙපි දළ්හිකරණත්ථං, ආයතිං සංවරෙ පතිට්ඨාපනත්ථං පුන දාතබ්බානි. සචෙ පුරිමිකාය පුන සරණානි ගහිතානි, පච්ඡිමිකාය වස්සාවාසිකං ලච්ඡති. සචෙ පච්ඡිමිකාය ගහිතානි, සඞ්ඝෙන අපලොකෙත්වා ලාභො දාතබ්බො.

ඉදින් හෙතෙම බහුල දෙස් තැනැත්තා ද වේ නම්, ආයති සංවරයෙහි ද නොපිහිටේ නම් නෙරපිය යුතු. එහෙත් හදිසියෙන් වැරදී 'මා විසින් නොමනා සේ කරන ලදි යැ'යි සිතා, නැවත සංවරයෙහි පිහිටනු කැමත්තේ නම්, ලිංග නාසනාය කිරීමට අවශ්‍ය නැත. හැඳ සිටින පොරවා සිටින ආකාරයෙන්ම ඔහුට සරණය දිය යුතුය. උපාධ්‍යාය දිය යුතුය. ශික්ෂාපද වනාහි සරණ ගමනයෙන්ම සම්පූර්ණ වේ. සාමණේරයන්ගේ සරණ ගමනය වනාහි, භික්ෂූන්ගේ උපසම්පද කම්වාක්‍යය වැනිය. එබැවින් [උපසම්පද කම්වාක්‍යය කීමෙන්] භික්ෂුවගේ චතුපාරිශුඬි ශීල සමාදනය සිදුවන්නාක් මෙන්, [සරණ සමාදනයෙන්ම] සාමණේරයාගේ දසශීල සමාදනය ද සිදුවේ. එසේ වුවත් දළ්හිකරණය පිණිස හා ආයති සංවරයෙහි පිහිටවීම පිණිස දසශීලය නැවත දිය යුතුය. ඉදින් පෙරවස් එළඹෙන දිනයේදී නැවත සරණය සමාදන් ගන්නා ලදි නම්, පසුවස් කාලයේදී වස්සාවාසික සිවුරු ලබන්නේය. ඉදින් පසුවස් එළඹෙන දිනයේදී සරණය සමාදන් ගන්නා ලදි නම්, සඞ්ඝයා විසින් අපලෝකන කර්මය කොට ඔහුට ලාභය දිය යුතුය.

[2] අදින්නාදානෙ තිණසලාකමත්තෙනාපි වත්ථුනා, [3] අබ්‍රහ්මචරියෙ තීසු මග්ගෙසු යත්ථ කත්ථචි විප්පටිපත්තියා, [4] මුසාවාදෙ හස්සාධිප්පායතායපි මුසාභණිතෙ අස්සමණො හොති. නාසෙතබ්බතං ආපජ්ජති.

[2] අදත්තාදානයෙහි තණපත වස්තුවක් පමණකින්ම, [3] මෛථුන සේවනයෙහි මාර්ග තුනෙන් කවරක හෝ වැරදි පිළිපැදීමෙන් ද, [4] බොරු කීමෙහි සිනා අදහසින් පවා බොරු කීමෙන් ද අශ්‍රමණයෙක් වේ. නාසනා කළයුතු බවට පැමිණේ.

1. "සත්ත්වයකු වීම ය, සත්ත්වයකු යන හැඟීම ඇති බව ය, **මරණ චේතනාවක්** ඇති වීම ය, මරන්නට උපක්‍රමයක් කිරීම ය, ඒ උපක්‍රමයෙන් සත්ත්වයා මරණයට පත් වීම ය යන පඤ්චාංගය සම්පූර්ණ වන ප්‍රාණඝාතයෙන් මේ ශික්ෂාපදය බිඳේ." (ශාසනාවතරණය,82 පිට). මේ ආකාරයෙන්ම නැසිය යුතු බවට පැමිණේ.

[5] මජ්ජපානෙ පන භික්ඛුනො අජානිත්වා බීජතො පට්ඨාය මජ්ජං පිවන්තස්ස පාචිත්තියං. සාමණෙරො පන ජානිත්වාව පිවන්තො සීලභෙදං ආපජ්ජති, න අජානිත්වා.

[5] මද්‍යපානයෙහි වනාහි නොදැන බීජය පටන් මද්‍යය වළන්දන්නාවූ භික්ෂුවකුට පචිති ඇවැතක් වේ. එහෙත් සාමණේරයා දැනම වැළන්දුවොත් [සාමණේර] ශීල බිඳීමට පැමිණේ, නොදැන නොවේ.

**යානි පනස්ස ඉතරානි පඤ්ච සික්ඛාපදානි තෙසු භින්නෙසු න නාසෙතබ්බො. දණ්ඩකම්මං කාතබ්බං. සික්ඛාපදෙ පන පුන දින්නෙපි අදින්නෙපි වට්ටති. දණ්ඩකම්මෙන පන පීලෙත්වා ආයතිං සංවරෙ ඨපනත්ථාය දාතබ්බමෙව.**

**[විකාල භෝජනය...ජාතරූප රජත පටිග්ගහනා යන] ඉතිරි ශික්ෂාපද පස බිඳී ගිය කල්හි ඒ සාමණේරයා නො නැසිය යුතුය. ශික්ෂාපදය ඔහුට නැවත දීම ද නොදීම ද වටී. එහෙත් දඬුවමකින් ඔහු පෙළා ආයති සංවරයෙහි පිහිටවීම පිණිස ශික්ෂාපද දිය යුතු මැයි.**

අවණ්ණභාසනෙ පන රතනත්තයං නින්දන්තො ගරහන්තො ආචරියුපජ්ඣායාදීහි "මා එවං අවචා"ති අවණ්ණභාසනෙ ආදීනවං දස්සෙත්වා නිවාරෙතබ්බො. මහා අට්ඨකථායං පන "[i] "සචෙ එවං වුච්චමානො තං ලද්ධිං නිස්සජ්ජති, දණ්ඩකම්මං කාරෙත්වා අච්චයං දෙසාපෙතබ්බො. [ii] සචෙ න නිස්සජ්ජති, තථෙව ආදය පග්ගය්හ තිට්ඨති, ලිඞ්ගනාසනාය නාසෙතබ්බො"ති වුත්තං. තං යුත්තං. අයමෙව හි නාසනා ඉධාධිප්පෙතා'ති.

[බුදුන් ආදි] අගුණ කීමෙහි වනාහි රතනත්‍රය නිඳා කරමින්, ගැහී කරමින් ආචාර්යෝපාධ්‍යායාදීන් විසින් "මෙසේ නො කියව"යි අගුණ කීමෙහි ආදීනවය පෙන්වා වැළැක්විය යුතුය. මහ අටුවාවෙහි ද "[i] ඉදින් මෙසේ කියනු ලබන්නේ ඒ ලබ්දිය හරී නම්, ඔහුට දණ්ඩකම්ම නාසනාය කොට වරද (අච්චයං) ප්‍රකාශ කරවිය යුතු.[1] [ii] ඉදින් නො හරී නම්, ඒ ලෙසම දැඩි කොට ගෙන සිටී නම්, ලිඞ්ග නාසනාවෙන් නැසිය යුතු [සිවුරු හරවා බැහැර කළ යුතු] යැ"යි කියන ලදි. මෙය සුදුසු යි. මේම [ලිඞ්ග] නාසනාය වනාහි මෙහි අදහස් කරන ලදි.

මිච්ඡාදිට්ඨිකෙපි එසෙව නයො. සස්සතුච්ඡෙදනං හි අඤ්ඤතරදිට්ඨිකො සචෙ ආචරියාදීහි ඔවදියමානො නිස්සජ්ජති, දණ්ඩකම්මං කාරෙත්වා අච්චයං දෙසාපෙතබ්බො. අප්පටිනිස්සජ්ජන්තොව නාසෙතබ්බො'ති.

මිථ්‍යා දෘෂ්ටිය ගත් සාමණේරයා කෙරෙහි පිළිපැදිය යුත්තේ ද එසේම ය. සාශ්වත උච්ඡේද යන එක්තරා දෘෂ්ටිය ගත් සාමණේරයා ආචාර්යාදීන් විසින් අවවාද කරනු ලබන්නේ ඒ දෘෂ්ටිය නො හරී නම්, ඔහුට දඬුවම් දී වරද ප්‍රකාශ කරවිය යුතුය. ඒ දෘෂ්ටිය තවම නොහරී නම් නැසිය යුතුය.

භික්ඛුනීදූසකො චෙත්ථ කාමං අබ්‍රහ්මචාරීගහණෙන ගහිතොව. අබ්‍රහ්මචාරිම්පන ආයතිං සංවරෙ ඨාතුකාමං සරණාදීනි දත්වා උපසම්පාදෙතුං වට්ටති. භික්ඛුනීදූසකො

භික්ෂුණී දූෂකයා ද මෙහි එකාන්තයෙන් මෛථුන සේවන ග්‍රහණයෙන් ගන්නා ලදි මැයි. එහෙත් ආයති සංවරයෙහි සිටින්ට කැමැති වූ මෛථුන සේවනය කළහුට සරණ

1. මේ සඳහා ඊළඟ පිටෙහි 'දණ්ඩකම්ම නාසනාය' යන විස්තරය කරුණාකර බලන්න.

ආයතිං සංවරෙ ඨාතුකාමොපි පබ්බජ්ජම්පි න ලභති, පගෙව උපසම්පදන්'ති. එතමත්ථං දස්සෙතුං 'භික්ඛුණීදූසකො'ති ඉමං විසුං දසමං අඞ්ගං වුත්තන්'ති වෙදිතබ්බං."

ගමනය ආදීන් දී උපසම්පද කරන්ට වටී. භික්ෂුණී දූෂකයා ආයති සංවරයෙහි සිටින්ට කැමැති වුවත් පැවිද්ද ද නොලැබේ, උපසම්පදව කියනුම කිම? මේම අර්ථය දක්වන්ට 'භික්ෂුණී දූෂකයැ'යි මේ වෙන් වූ දසවැනි [නාසනා] අංගයක් කියන ලදි යැයි දත යුතුය." (වින.අ.757-8)

## III. දණ්ඩකම්ම නාසනාය

"සචෙ සාමණෙරො බුද්ධස්ස වා ධම්මස්ස වා සඞ්ඝස්ස වා අවණ්ණං භණති, අකප්පියං කප්පියන්'ති දීපෙති, මිච්ඡාදිට්ඨිකො හොති, අන්තග්ගාහිකාය දිට්ඨියා සමන්නාගතො, සො [i] යාවතතියං නිවාරෙත්වා තං ලද්ධිං විස්සජ්ජාපෙතබ්බො. [ii] නො චෙ විස්සජ්ජෙති, සඞ්ඝං සන්නිපාතෙත්වා 'විස්සජ්ජෙහී'ති වත්තබ්බො. [iii] නො චෙ විස්සජ්ජෙති, බ්‍යත්තෙන භික්ඛුනා අපලොකනකම්මං කත්වා නිස්සාරෙතබ්බො. එවඤ්ච පන කම්මං කාතබ්බං:-

"ඉදින් සාමණේරයෙක් බුදුන්ගේ හෝ දහම්හි හෝ සඞ්ඝයාගේ හෝ අගුණ කියා නම්, අකප්පිය දේ 'කැපය' යි පෙන්වා නම්, මිථ්‍යාදෘෂ්ටිය ගත්තේ වේ නම්, [සාශ්වත උච්ඡේද යන] අන්තග්ගාහික දෘෂ්ටියෙන් යුක්ත වූයේ නම්, ඔහුට [i] තුන්වර දක්වා වළක්වා ඒ ලබ්ධිය හැරවිය යුතු. [ii] ඉදින් නොහරී නම්, සඞ්ඝයා රැස් කරවා ඔහුට 'හරව යැ'යි කිය යුතුය. [iii] ඉදින් නො හරී නම්, ව්‍යක්ත භික්ෂුවක් විසින් අපලෝකන කර්මයක් කොට ඔහුට නිස්සාරණ (බැහැර කරන) කර්මය කළ යුතුය. මේ කර්මය වනාහි මෙසේ කළ යුතුː-

"සඞ්ඝං, භන්තෙ, පුච්ඡාමි. අයං ඉත්ථන්නාමො සාමණෙරො බුද්ධස්ස, ධම්මස්ස, සඞ්ඝස්ස අවණ්ණවාදී, මිච්ඡාදිට්ඨිකො. යං අඤ්ඤෙ සාමණෙරා ලභන්ති දිරත්තතිරත්තං භික්ඛූහි සද්ධිං සහසෙය්‍යං, තස්ස අලාභාය නිස්සාරණා රුච්චති සඞ්ඝස්සා'ති. දුතියම්පි ... තතියම්පි, භන්තෙ, සඞ්ඝං පුච්ඡාමි. අයං ඉත්ථන්නාමො සාමණෙරො බුද්ධස්ස ... අවණ්ණවාදී ... රුච්චති සඞ්ඝස්සා'ති. චර පරෙ විනස්සා'ති."

තත්ථ යා කණ්ටක-සාමණේරස්ස දණ්ඩකම්මනාසනා, සා 'නිස්සාරණා'ති වෙදිතබ්බා.

එහි, කණ්ටක සාමණේරයාගේ යම් දණ්ඩකම්ම නාසනාය වේද, එය 'නිස්සාරණයැ'යි දත යුතුය.[1]

1. "මෙසේ නිස්සාරණය කළ සාමණේරයා සියලුම භික්ෂූන් විසින් වර්ජනය කළ යුතුය". (විනය කම් පොත, 217 පි.) ප්‍රාතිමෝක්ෂයේ සප්පාණක වර්ගයෙහි දසවැනි කණ්ටක ශික්ෂාපදය කරුණාකර බලන්න.

සො අපරෙන සමයෙන "අහං, භන්තෙ, බාලතාය, අඤ්ඤාණතාය, අලක්ඛිකතාය එවං අකාසිං. ස්වාහං සඞ්ඝං ඛමාපෙමී"ති, ඛමාපෙන්තො යාවතතියං යාචාපෙත්වා අපලොකනකම්මෙනෙව ඔසාරෙතබ්බො. එවං පන ඔසාරෙතබ්බොඃ සඞ්ඝමජ්ඣෙ ඛ්‍යත්තෙන භික්ඛුනා සඞ්ඝස්ස අනුමතියා සාවෙතබ්බංඃ

ඔහු පසු කාලයෙහි "ස්වාමීන් වහන්සේ, මම මෝඩකමින් ද, නොදැනීමෙන් ද, පින් නැති කමින් ද මෙසේ කෙළෙමි. ඒ මම සඞ්ඝයා-ගෙන් ක්ෂමාව ඉල්ලමි යැ"යි ක්ෂමාව ඉල්ලා නම්, තුන්වර දක්වා ඉල්වා අපලෝකන කර්මයෙන් ම ඕසාරණ (නැවත ඇතුල් කරන) කර්මය කළ යුතුය. ඕසාරණ කර්මය වනාහි මෙසේ කළයුතුඃ සභ මැදදී ව්‍යක්ත භික්ෂුවක් විසින් සඞ්ඝයාගේ අනුමතියෙන් මෙසේ ප්‍රකාශ කළ යුතුඃ

'සඞ්ඝං, භන්තෙ, පුච්ඡාමි. අයං ඉත්ථන්නාමො සාමණෙරො බුද්ධස්ස, ධම්මස්ස, සඞ්ඝස්ස ආවණ්ණවාදී, මිච්ඡාදිට්ඨිකො. යං අඤ්ඤෙ සාමණෙරා ලභන්ති භික්ඛූහි සද්ධිං දිරත්තතිරත්තං සහසෙය්‍යං, තස්ස අලාභාය නිස්සාරිතො. ස්වායං ඉදානි සොරතො, නිවාතවුත්ති, ලජ්ජිධම්මං ඔක්කන්තො, හිරොත්තප්පෙ පතිට්ඨිතො, කතදණ්ඩකම්මො අච්චයං දෙසෙති. ඉමස්ස සාමණෙරස්ස යථා පුරෙ කායසම්භොගසාමග්ගිදානං රුච්චති සඞ්ඝස්සා'ති.

එවං අපලොකනකම්මං ඔසාරනඤ්ච නිස්සා-රණඤ්ච ගච්ඡති."

මෙසේ මේ අපලෝකන කර්මය ඕසාරණයට ද නිස්සාරණයට ද යෙදේ." (වින.අ.1045)

තස්මා මහාඅට්ඨකථායං ච (i) "සචෙ තං ලද්ධිං නිස්සජ්ජති, දණ්ඩකම්මං කාරෙත්වා අච්චයං දෙසාපෙතබ්බො"ති වුත්තං.

එහෙයින් මහ අටුවාවෙහි ද (i) "ඉදින් ඔහු ඒ ලබ්ධිය හරී නම්, ඔහුට දණ්ඩකම්ම නාසනාය කොට වරද (අච්චයං) ප්‍රකාශ කරවිය යුතු යැ"යි කියන ලදි. (වින.අ.758)

තං පන දණ්ඩකම්මනාසනාය නිස්සාරණඤ්ච ඔසාරණඤ්ච සන්ධාය වුත්තං.

මෙය වනාහි දණ්ඩකම්ම නාසනායෙහි නිස්සාරණය හා ඕසාරණය සඳහා කියන ලදි.

තතො පරං (ii) "සචෙ න නිස්සජ්ජති, තථෙව ආදාය පග්ගය්හ තිට්ඨති, ලිඞ්ගනාසනාය නාසෙතබ්බො"ති වුත්තං

ඉන්පසු (ii) "ඉදින් නො හරී නම්, ඒ ලෙසම දැඩි කොට ගෙන සිටී නම්, ලිඞ්ග නාසනාවෙන් නැසිය යුතු යැ"යි කියන ලදි. (වින.අ.758)

ඉමිනා පන නිස්සාරණකම්මස්ස අනන්තරං අච්චයං අදෙසෙත්වා, අඛමාපෙත්වා, තං ලද්ධිං අනිස්සජ්ජෙත්වා, තථෙව ආදාය පග්ගය්හඨානං සන්ධාය ලිඞ්ගනාසනං වුත්තං.

මෙයින් වනාහි නිස්සාරණ කර්මයට පසු වරද ප්‍රකාශ නොකොට, ක්ෂමාව නොඉල්ලා, ඒ ලබ්ධිය නොහැර, ඒ ලෙසම දැඩි කොට ගෙන සිටීමය සඳහා ලිඞ්ග නාසනාය කියන ලදි.

## IV දස දඬුවම් වත්

වුත්තං හෙතං භගවතා:

(iv) "අනුජානාමි, භික්ඛවෙ, පඤ්චහංගෙහි සමන්නාගතස්ස සාමණෙරස්ස දණ්ඩකම්මං කාතුං: [1] භික්ඛූනං අලාභාය පරිසක්කති. [2] භික්ඛූනං අනත්ථාය පරිසක්කති. [3] භික්ඛූනං අවාසාය පරිසක්කති. [4] භික්ඛූනං අක්කොසති, පරිභාසති. [5] භික්ඛූ භික්ඛූහි භෙදෙති. අනුජානාමි, භික්ඛවෙ, ඉමෙහි පඤ්චහංගෙහි සමන්නාගතස්ස සාමණෙරස්ස දණ්ඩකම්මං කාතුන් 'ති."

භාග්‍යවතුන් වහන්සේ විසින් වනාහි මෙය දේශන කරන ලදි:

(iv) "මහණෙනි, අංග පසෙකින් යුක්ත සාමණේරයා හට දඬුවම් කිරීමට අනුදනිමි. [1] භික්ෂූන්ට අලාභ කරන්නට උත්සාහ කෙරේ ද, [2] භික්ෂූන්ට අනර්ථ කරන්නට උත්සාහ කෙරේ ද, [3] භික්ෂූන්ට ආවාසවල විසිය නොහෙනු පිණිස උත්සාහ කෙරේ ද, [4] භික්ෂූන්ට ආක්‍රෝශ පරිභව කෙරේ ද, [5] භික්ෂූන් භික්ෂූන් හා බිඳවා ද. මහණෙනි, මේ අංග පසෙකින් යුක්ත සාමණේරයා හට දඬුවම් කරන්නට අනුදනිමි'යි." (ම.ව.i.208)

### රේරුකානේ චන්දවිමල මහානායක ස්ථවිර පාදයන් වහන්සේ විසින් කරන අනුලෝම විස්තරය

"විකාල භෝජනාදි සික පද පස කඩකරන සාමණේරයා ද දඬුවම් ලැබිය යුතු වේ. ඉහත කී භික්ෂූන්ට අලාභ කිරීම් ආදි කරුණු පසට විකාල භෝජනාදි කරුණු පස එකතු වූ කල්හි සාමණේරයන්ට දඬුවම් ලැබීමට සුදුසු කරුණු දසයක් වේ. මේ දශය 'දසදඬුවම් වත්ය' කියා වෙන් කොට හඳුන්වන්නේ දඬුවම් ලැබිය යුතු කරුණු අතුරෙන් ප්‍රධාන කරුණු වීම නිසා ය...

භික්ෂූන්ට අලාභ කිරීම් ආදි වරද පස කරන්නා වූ සාමණේරයන්ට කළ යුතු දඬුවම කුමක්දැ'යි භික්ෂූන් විසින් විචාළ කල්හි "අනුජානාමි, භික්ඛවෙ, ආවරණං කාතුං"[1] යි දඬුවම් වශයෙන් ආවරණය කිරීම අනුදැන වදළ සේක. මෙහි දැක්වෙන ආවරණය නම්, වරද කළ සාමණේරයා හට ආචාර්ය උපාධ්‍යායයන් වාසය කරන ස්ථානවලට හා ඔහුට වාසය කිරීම සඳහා ලැබී ඇති තැනටත් යන්නට නොදීම ය. එය කොතෙක් කළ යුතු ද යන බව විනය පාළියෙහි දක්වා නැත. වරදට සුදුසු පරිදි දඬුවම් වශයෙන් දිය දර වැලි ආදිය ගෙන්වීමෙන් කළ යුතු බව විනය අටුවාවෙහි දැක්වේ." (ශාසනාවතරණය, 96-7 පිටු)

මෙසේ "නාසනාඞ්ග දශයට අයත් නොවන වරදක් සාමණේරයා අතින් සිදු වුව හොත්, ඒ වරදට දිය-දඬුවම්, වැලි-දඬුවම් ආදි යම් කිසි දඬුවමක් කළ යුතුය." (විනය කම් පොත, 36 පිට)

"එයින් සලකන්නට ඇත්තේ සාමණේරයා විසින් යම් කිසි දඬුවමක් කළ පසු හෝ වරද පිළිගෙන ඒ බව ආරෝචනය කළ පසු හෝ ආවරණය නැවැත්විය යුතු බව ය."

(ශාසනාවතරණය, 97 පිට)

1. ම.ව.i.208

මෙසේම වනාහි සාමණේර භූමිය ගැන ද සාමණේර දස ශික්ෂාපද ගැන ද දස නාසනා ගැන ද දණ්ඩකම්ම නාසනාය ගැන ද හා දස දඬුවම් වත් ගැන ද විනිශ්චය දත යුතුය. මෙය සටහනකින් මෙසේ දැක්විය හැක:

| දස ශික්ෂාපද කැඩීමය | | | |
|---|---|---|---|
| 10. ජාතරූ. | | - භික්ෂූන් භික්ෂූන් හා බිඳවීමය. | දස දඬුවම් වත් |
| 9. උච්චා. | | - භික්ෂූන්ට ආක්‍රෝශ පරිභව කිරීමය. | |
| 8. මාලා. | සහ | - භික්ෂූන්ට අවාස කරන්නට උත්සාහ කිරීමය. | |
| 7. නච්ච. | | - භික්ෂූන්ට අනර්ථ කරන්නට උත්සාහ කිරීමය. | |
| 6. විකාල. | | - භික්ෂූන්ට අලාභ කරන්නට උත්සාහ කිරීමය. | |

දඬුවම් ලැබීමට හා නැවත ශික්ෂාපද සමාදන් වීමට කරුණු 10 ක් හෝ 14 ක් හෝ (i, ii, iii, iv)

| | | | | |
|---|---|---|---|---|
| 5. මජ්ජ. | | v. භික්ෂුණී දූෂණය. | | දස නාසනා |
| 4. මුසා. | | iv. මිථ්‍යාදෘෂ්ටිය ගැනීමය. | දණ්ඩකම්ම නාසනාය | |
| 3. අබ්‍රහ්ම. | සහ | iii. සඞ්ඝයාගේ අගුණ කීමය. | | |
| 2. අදින්නා. | | ii. දහමෙහි අගුණ කීමය. | | |
| 1. පාණා. | | i. බුදුන්ගේ අගුණ කීමය. | | |
| සාමණේර භූමිය (තුන් සරණ ගමන) | | | | |

සාමණේර භූමිය බිඳීමට කරුණු 10 ක්

**සැලකිය යුත්තක්** - ප්‍රව්‍රජ්‍යාපේක්ෂකයෙක් (පැවිදිවීමට බලාපොරොත්තු වන්නෙක්) මිල මුදල් පරිහරණය අකැප බැව් දැනගෙන, මිල මුදල් පරිහරණය අත් නොහැර, නමුත් "ජාතරූපරජතපටිග්ගහණා වෙරමණී සික්ඛාපදං සමාදියාමි" යැයි දැන දැනම බොරු කියා සාමණේර ශීලයට අන්තර්ගත වූ මෙම ශික්ෂාපදයත් සමාදන් වෙයි නම් හෙතෙම ලිංග නාසනයට (සාමණේර භූමියෙන් පහවීමට) පත්වනු ඇත. මක්නිසාද යත්? සාමණේර ශීලයට අන්තර්ගත වූ ද ලිංග නාසනයට හේතු වන්නාවූ ද "මුසාවාද" ශික්ෂාපදය කැඩෙන බැවිනි. "මාලාගන්ධවිලෙපන" යනාදි ශික්ෂාපදයන් ද බොරුවට සමාදන්වීමත් එලෙසම බව දතයුතු.

ඒ ප්‍රව්‍රජ්‍යාපේක්ෂකයෙක් බොරු අදහසක් නොමැතිව, "ජාතරූපරජත" යනාදි ශික්ෂා-පදයන්ගේ නියම අර්ථය නොදැන, එලෙස ශික්ෂාපද සමාදන්වීම තුළින් 'ලිංග නාසනයට පත්වනු ඇත' යන මෙම කරුණ විමසිය යුතුය. මක්නිසාද යත්? මුසාවාද චේතනාවක් නොමැති බැවිණි.

තවද 'ඉදින් සාමණේර තෙමේ බහුල දොස් තැනැත්තා ද වේ නම්, ආයති සංවරයෙහි ද නොපිහිටේ නම් නෙරපිය යුතු' යනු ඉහත විනය අටුවාවෙහි (වින.අ.757-8) සඳහන් වූ මේ වාක්‍ය සාරත්ථදීපනී හා විනයාලංකාර නම් වූ විනය ටීකාවෙහි මෙසේ විග්‍රහ වේ;

'එත්ථ, සචෙ යාවතතියං වුච්චමානො න ඔරමති, සඞ්ඝං අපලොකෙත්වා නාසෙතබ්බො. පුන පබ්බජ්ජං යාචමානොපි අපලොකෙත්වා පබ්බාජෙතබ්බො'ති වදන්ති.'

'මෙහි, හෙතෙම තුන්වර අවවාද කරනු ලබන්නේ නොනවතී නම් සඞ්ඝයා ලවා අපලෝකන කර්මය කොට ලිංග නාසනාවෙන් නැසිය යුතුය. නැවත පැවිද්ද ඉලන්නේ නම් අපලෝකන කර්මය කොට පැවිදි කළ යුතු යැයි ආචාර්යවරු කියති.'
(සා.දී.ටී.3.255; වින.අ.ටී.1.265)

## V. උපසම්පදාවට අභව්‍ය පුද්ගලයෝ තෙළෙස් දෙනා

පණ්ඩකාදි පුද්ගලයෝ එකොළොස් දෙනය, පාරාජිකාවට පත් භික්ෂුවක් ද, විසිවයස නො පිරුණු තැනැත්තාය යන තෙළෙස් දෙනා උපසම්පදාවට අභව්‍යයෝ ය. උපසම්පද කර්මය කරන ලදුයේ ද ඔවුනට උපසම්පදාව නො පිහිටන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ විසින් චනාහි මෙය දේශනා කරන ලදී: 'පණ්ඩකො ... උභතොබ්‍යඤ්ජනකො ... ථෙය්‍යසංවාසකො ... තිත්ථියපක්කන්තකො ... තිරච්ඡානගතො ... මාතුඝාතකො ... පිතුඝාතකො ... අරහන්තඝාතකො ... ලොහිතුප්පාදකො ... සඞ්ඝභේදකො ... භික්ඛුනීදූසකො, භික්ඛවෙ, අනුපසම්පන්නො නච උපසම්පාදෙතබ්බො, උපසම්පන්නො නාසෙතබ්බො'ති. (ම.ව. 212) - '........පාරාජිකො හොති අසංවාසො.' (පාරා. 56-200) - 'යො පන භික්ඛු ජානං ඌනවීසතිවස්සං පුග්ගලං උපසම්පාදෙය්‍ය සො ච පුග්ගලො අනුපසම්පන්නො ......' (පාචි. 348) යනුයි.

එහෙයින් කඞ්ඛාවිතරණී නම් වූ විනය අටුවාවෙහි :

'ඉති ඉමෙ තෙරස පුග්ගලා උපසම්පදාය අවත්ථුකා. ඉමෙ පන ඨපෙත්වා අඤ්ඤස්මිං උපසම්පදාපෙක්ඛෙ සති උපසම්පදාකම්මං වත්ථු-සම්පත්තිවසෙන අකුප්පං හොති'

'මෙසේ මේ පුද්ගලයෝ තෙළෙස් දෙනා උපසම්පදාවට නොපිහිටින්නෝ ය. එහෙත් මොවුන් හැර වෙනත් උපසම්පදාපෙක්ෂකයෙක් සිටි කල්හි ඒ උපසම්පද කර්මය පුද්ගල සම්පත්ති වශයෙන් කෝප්‍ය නොවේ'යි කීහ. (21 පිට)

ඇත්ත වශයෙන් ම සාමණේර නමක් උපසම්පදාවට අභව්‍ය පුද්ගලයෙක් නැති නම් ඔහුගේ සාමණේර ශීලය කැඩී උපසම්පද කර්මය කරන ලදුයේ ද ඒ උපසම්පද කර්මය කෝප්‍ය වේ ය යන බව, ඔහුට උපසම්පදාව නො පිහිටන්නේ ය යන බව, මේ කරුණු පෙළ අටුවා ටීකාවෙහි නොම පෙනේ.
තවද 'න භික්ඛවෙ අනුපජ්ඣායකො උපසම්පාදෙතබ්බො යො උපසම්පාදෙය්‍ය ආපත්ති දුක්කටස්සා'ති (ම.ව. 222) යන මේ විනය ප්‍රඥප්ති විනය අටුවාවෙහි මෙසේ විග්‍රහ කරන ලදී. 'එවං උපසම්පාදෙන්තස්ස ආපත්ති හොති. කම්මං පන න කුප්පති.' (මෙසේ උපසම්පදා කරන සඞ්ඝයාට ඇවැත් වේ. එහෙත් ඒ උපසම්පදා කර්මය කෝප්‍ය නොවේ.) යනුයි. (වින.අ.765)
වැඩි විස්තර සඳහා උපසම්පදාවට අභව්‍ය පුද්ගලයෝ යනු රේ.චන්ද්‍රවිමල ස්වාමීන්වහන්සේගේ 'විනය කර්ම පොත' කරුණාකර බලන්න.

## විශේෂ ශබ්ද සූචි


පිට

අ

අචිත්තකය x
අඤ්ඤකෝණ්ඩඤ්ඤ 49
අනුමාන i,3,6
අනුරුද්ධ 52
අන්තො අරුණෙ 20,39
අඳුර 20,25,26,34,35,37-39,45-48,50-52
අරුණ ix,x,xi,3,4,5,6,10,13,15,20,39
අරුණ අනුගායනාව 26
අරුණ නියාමය 74
අරුණාලෝකය 26,50
අරුණුග්ගමනකාලය 30,31,52,72
අරුණුග්ගමනවෙලාය 27,28,35,50,54,58,72
අරුණේ ශීර්ෂය 22,24,38,84
අරුණේ පාට 4,6,87
අරුණෝදය 13,20,26-28,39,50,72,81,89
අරුණෝද්ගමනය ix,x,xi,3,18,20,...
අරුණෝද්ගමනයට අවශ්‍ය ලකුණු 82
අරුණෝද්ගමනයට විශේෂ ලකුණු 84
අරුණෝද්ගමනයට සමානථි වාචන 35
අරුණෝද්ගමනයේ ලක්ෂණය 70

ආ

ආනන්ද 21,23,52,87
ආරණ්‍යක භික්ෂුව 67
ආලොකෙ සංජාතෙ
(ආලෝකය පහළ වූ කල්හි) 29,34,35,50,51,72

ඉ-ඊ

ඉර උදවීම 12,16,35,42,44,70,77,79,80
ඉර උදවන වේලාව 11,12,39
ඉර බැසීම 5,34,47,48,70
ඊළඟ දවසේ (පුන දිවසෙ) 48,49,53-55,
58-60,72,73

පිට

උ

උග්ගතෙ අරුණසීසෙ 22,24,35,72
උට්ඨිතෙ අරුණෙ 24,35,49,54,55
උදෙන රජ 27,34
උදේ හිමිදිරිය 9,10-13,15,37,38,40,74,75,
77,78,
උදැසන (පාතො) 66,68
උද්ධස්තේ අරුණෙ 20-24,35,72,73,87
උෂස් 26,50

ඍ

ඍද්ධි බලයෙන් 45
ඍද්ධිමත් 45
ඍද්ධි විෂය 45

එ-ඔ

එළිය 13,15
ඔදතදිසාමුඛී රත්ති 24,25,72

ක-බ

කටු 47,48
කණු 47,48
කෘතිම එළිය 39,45,46-48,52,63,76,82-85
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ix,12,78
කාල භෝජනය 60,61,63,66
කාලස්සෙව (ඉර උදවට කලින්) 64,66,67,69,
72
කුරුල්ලෝ 26,39,50
බාණු කෝණ්ඩඤ්ඤ 30,82

ග-ස

ගමන් යාම 51,53,56,67,84,85
ගිනි හුළු 45,46,85
සොෂක 31,82

ච-ජ

චක්‍රවර්ති රජ 50
චුල්ලකද්ධානං (කෙටි වේලාවක්) 52,55,56,72
ජිඝඤ්ඤරත්ති (රාත්‍රියේ කෙළවර) 72,88

පිට

ත-ථ

තද රතුපාට 3,4,11,13,15,22,38,83,84
තුට්ඨිමුඛී රත්ති 24,72
ථුල්ලතිස්ස 45
ථූපවංසය 32

ද-ධ

දඹදිව 13
දවස 47,48
දවාල 47,48,50
දවාලේ ලක්ෂණය 70
දනය 46,47,63
දනශාලා 46,48,63

න

නක්ෂත්‍ර හිමිදිරිය 75,77,81
නන්දිමුඛී රත්ති 23-25,72,73,87,88
නාඩිකා 56
නාළයන 15,44
නාරද තවුස 45
නාවික හිමිදිරිය 75-77
නිමලව අරණ්‍යය ix,7,36
නිමි රජ 46,48,63
නොසඤ්ඤාවිමෝක්ඛය x

ප

පගෙව (උදය කාලය) 66
පච්ඡිමරත්ති (රාත්‍රියේ කෙළවර) 33,72
පටාචාර තේරී 28,29,34,35,51,52,57
පඨවින්ධර නාරජ 49,54
පදුමුත්තර බුදුන් 49,54
පභාතාය රත්තියා 28,29,56,58,59,67,72
පශ්චිම යාමය 20,21,23,24,26,52,55,56,71
පසන්නදිසාමුඛී රත්ති 24,72,73
පහන් 46-48,62,63,84,85
පාතො (උදැසන) 66,68,72
පාරිලෞයක ඇත්රජ 59,61
පැය භාගයක් 78,85,89
පිඩු පිණිස හැසිරීම 49,53,56,58,68

පිට

පුක්කුසති කුලපුත්‍රය 55
පුබ්බණ්හසමයං (පෙරවරු කාලය) 68,69,71,72
පුරාරුණ 20
පෙරනිමිත්ත 6,70
පොදුජන හිමිදිරිය 75-79,81,82
ප්‍රත්‍යක්ෂ i,3,6,7,15,40,44,89
ප්‍රත්‍යූශ කාලය (පච්චූසසමයං) 20,26,31,57,62,63,72

බ-භ

බලවත් ප්‍රත්‍යූෂ 52,53,72
බුදු ඇසින් 53,63,68
බුදු සරණ පත්‍රය 16
බොජුන් කිස 58
බෝසතාණන් වහන්සේ 45,46,54
භාග්‍යවතුන් වහන්සේ 21,23,52,53,58,60-63,68,69

ම

මද රතුපාට 4,5,10,13,15,16,22,37,39,40,84,87,89
මධ්‍යම යාමය 68,71
මධ්‍යහ්නය x, xi, 60, 64, 82, 83
මහාවංසය 54,57
මාතඞ්ග ඍෂිය 45,46
මැණික් රත්නාලෝකය 50
මුඛෝදක දනය (මුව දේනා පැන්) 59,61,64,65
මුළු රාත්‍රිය 27,29,33-35,39,48,49,54,84

ය

යාමය 56,71,72

ර

රත්තාවසෙසං
(රාත්‍රියෙහි ඉතුරු කොටස) 52,53,55,72
රත්තිපරියොසානෙ 4,33,72

පිට

රතුපාට 4,5,9,11,23,38,40,42,43,84,88
රාත්‍රිය ඇවෑමෙන් 33,36,69
රාත්‍රිය එළි වේ (විභායති) 25-35,39, 46,53,56,57,58,60,62,63,64,65,68,73,88
රාත්‍රියේ කෙළවර (ජිසඤ්ඤරත්ති) 72,88
රාත්‍රියේ ලක්ෂණය 47,63,70
රාත්‍රි දෘෂ්ටිය 26,51
රුදවල් භේදය 70
රූප නොපෙනෙන බව 30,39,45,51,62,85
රූප පෙනෙන බව 30,31,48,51

ව

වැඩ කටයුතුවල 45,46,50,76,77
වැඩීගෙන එන තද රතුපාට 3,4,11,13,15, 22,38,39
විකාලය x, xi, 21,60,68,72
විකාල භෝජනය ix, xi, 60-63,66
විකාල සංඥා xi
විභාතා රත්ති 25-35,46,53,55-58,60, 62-66,68
විසාරද හිමි 15
චුට්ඨීතෙ අරුණෙ 28,29,35,51,72
වේද කාලයේ 26,50
වේද පොත් 50

ශ

ශාසනාවතරණය 89, ...
ශාස්තෘන්වහන්සේ 49,56,58,59,61,64,67
ශ්‍රී පාද ix,15,40

පිට

ස

සක් දෙව් රජ 58
සත්තරසවර්ගිය 62
සද්ධසෝභන හිමි 15,44
සාමාන්‍ය සිරිත 46,68
සැඩ වනසතු 51
සිගලක ගැහැවි පුත් 69
සිය මතය i,84
සිංහල පැය 13,56
සිරුරු පිළිදැගුම් 55,57,58,59,85
සුදු එළිය 9-13,15,16,37,38,40
සුදුපාට 11,13,23-25,30-35,39,44,48,83,84, 87,88
සුදුප්‍රභා 5,87
සූර්‍ය නමස්කාරය 66
සූර්‍යයාගේ ලක්ෂණය 70
සූර්‍යාලෝකය 11,23,34,39,48
සූර්‍යෝදය 89
ස්වාභාවික ආලෝකය 35,40,44,52,60,77, 82,85
ස්වාභාවික එළිය 39,44,63,82
ස්වාභාවික සිරිත 46,64

හ

හිමිදිරි අවස්ථා තුන 75,77